ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙමම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**නොසැසඳීම**		
(i)	සාමූහික නොවන ආදායම් බදු යටතේ වන අංක 10.04.02.99 දරන අනෙකුත් ආදායම් සංකේතය, ආදායම් සංකේතයක් මෙන්ම පාලන ගිණුමක් ලෙස ද ක්‍රියා කරයි. මෙම ආදායම් සංකේතය යටතේ භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, යථෝක්ත පාලන ගිණුම සඳහා රු. 80,452,757,986ක් බැර වී තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණයේදී පාලන ගිණුමේ ගිණුම් ගත කර ඇති ආදායම රු. 78,769,456,144 ක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් රු. 1,683,301,842 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	අනෙකුත් ආදායම් පාලන ගිණුමට දෙපාර්තමේන්තුව විසින් බැර කර තිබූ ආදායම හා ආදායම් වර්ගීකරණයේදී අනෙකුත් ආදායම් පාලන ගිණුමේ තිබූ ආදායම අතර වෙනසක් පෙන්නුම් කිරීමට, විවිධ හේතු බලපාන බව වාර්තා කර තිබිණ.	භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණ පාලන ගිණුම නිවැරදිව සැසඳීම් කළ යුතුය. .
(ii)	දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව 10.04.02.99 දරන අනෙකුත් ආදායම් සංකේතය යටතේ ශේෂය රු. 80,660,781,547 ක් වන නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ACA 1 හි ආදායම් රැස් කිරීම් යටතේ 10.04.02.99 දරන අනෙකුත් ආදායම් පාලන ගිණුමේ ශේෂය රු. 80,452,757,986 ක් වීම නිසා රු. 208,023,561 ක නොසැසඳීමක් නිරීක්ෂණය වේ.	වැට් බදු පාලන ගිණුමේ ඉතිරි වූ ශේෂය වූ රු.1,891,325,403ක් අනෙකුත් බදු පාලන ගිණුමට මාරු කිරීමේ මාරු පත්‍ර වටිනාකම හා අනෙකුත් බදු පාලන ගිණුමේ වර්ගීකරණය නොකළ ශේෂය වූ රු.1,683,301,842 අතර ශුද්ධ වටිනාකම රු.208,023,561 බව.	භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් ආදායම් පාලන ගිණුමේ ශේෂය පාලන ගිණුම නිවැරදිව සැසඳීම් කළ යුතුය.
(iii)	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව RAMIS පද්ධතිය මඟින් ජනනය වන ජාතිය ගොඩ නැගීමේ බද්ද - සේවා හා නිෂ්පාදන උප ආදායම් සංකේතාංක දෙක යටතේ 2024 ජනවාරි 01 දිනට ආරම්භක	NCS ආයතනය 2023 දෙසැම්බර් 31 දිනට RAMIS පද්ධතිය මඟින් තොරතුරු ලබා දීමේ දී දෝෂයක් සිදුවී ඇති අතර එම දෝෂය නිවැරදි කර NCS ආයතනය මඟින් 2025 මාර්තු 04 දින නිවැරදි දත්තයන් ඉදිරිපත් කර ඇති අතර නව දත්ත යොදා ගනිමින් හිඟ ආදායම් ප්‍රකාශය (ACA1(i))	RAMIS පද්ධතිය මඟින් නිවැරදි වාර්තා ලබා ගැනීමටත් හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය නිවැරදිව සකස් කිරීමටත් ක්‍රියා කළයුතුය.

	ශේෂය හා 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ අවසාන ශේෂය අතර රු.19,046,065,097ක වෙනසක් නිරීක්ෂණය වූයෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් හිඟ ආදායම් ශේෂ නිවැරදිව වාර්තා කර නොමැති අතර හිඟ බදු වාර්තාවන්හි දෝෂ පවතින බව විගණනයේ දී තවදුරටත් නිරීක්ෂණය විය.	සකස් කිරීමට එකී ලිපියෙහි 2025 මාර්තු 06 දිනැති සටහන මගින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමැතිය ලබා දී ඇති බව.	
(iv)	2024 දෙසැම්බර් 31 දිනට RAMIS පරිගණක පද්ධතිය තුළ TIN අංක 10088xxxx යටතේ රු.4,067,209,501 ක නිරවුල් නොවූ අවිනිශ්චිත ශේෂයක් පැවතීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ශේෂය එම ප්‍රමාණයෙන් අධිගණනය වී ඇති බවත්, එම නිරවුල් නොවූ ශේෂයන් තුළ 2015 හා 2016 සිට (එනම් ආසන්න වසර 09 කට වැඩි කාලයක් පුරා නිරවුල් නොවූ) පවතින රු. 16,701,441 ක ශේෂයන් ද ඇතුළත් වී තිබුණි.	2025 මාර්තු 31 දිනට යථාවත් කළ වාර්තාව අනුව අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.3,813,737,281ක් බව හා මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව.	අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය
(v)	ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුම් මගින් භාණ්ඩාගාරයට බැර වන මුදල්, බැංකු ගිණුම් ප්‍රකාශ සමඟ සසඳා හඳුනාගෙන ඇති වෙනස්කම් නිවැරදි කිරීමට කාලීනව පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූයෙන් ආදායම් ගිණුම්කරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයේ දුර්වලතා පවතින බව නිරීක්ෂණය විය.	පිළිතුරු ලබා දී නොමැත.	ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුම් ප්‍රකාශ නිවැරදිව සැසඳීම් කළයුතුය.
(ආ)	**මාසික ආදායම් වාර්තා කිරීම්වල නිවැරදිතාව**		
(i)	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 4 හා 4 (ඇ) වගන්තිය අනුව ඒ ඒ ආදායම් විෂයයන් යටතට එළඹෙන මාසයේ පළමු සතිය තුළ නිවැරදි ආදායම වර්ගීකරණය හඳුනා ගැනීම කළ යුතු බවට	ආදායම් සැසඳීම් වාර්තාව සකස් කිරීමේ විවිධ පියවරයන් යටතේ සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් එළඹෙන මාසයේ පළමු සතිය තුළ නිවැරදි ආදායම වර්ගීකරණය හඳුනා ගැනීමට නොහැකි වූ බව.	චක්‍රලේඛ ප්‍රකාරව ආදායම් වාර්තා නිවැරදිව පිළියෙල කළයුතුය.

	මගපෙන්වීම් කර තිබුණ ද, ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ආදායම් සංකේත යටතේ එකිනෙක මාසවල රැස්කරගත් ආදායම් එම මාසය තුළ හඳුනානොගෙන වෙනත් මාසයක ආදායම් සමඟ සමුච්චිත වී ශේෂය වාර්තා වීම හේතුවෙන් ඒ ඒ මාස වල සත්‍ය ආදායම් රැස් කිරීම පිළිබඳ ව නිවැරදි තොරතුරු වාර්තා නොවන බව නිරීක්ෂණය විය.		
(ii)	මාසික ආදායම් වර්ගීකරණ වාර්තාවට අනුව මාර්තු මාසයට අදාළ කැසිනෝ බලපත්‍ර ගාස්තු යටතේ රු. 5,000,000,000 ක අගයක් CIGAS වැඩසටහන සඳහා උඩුගත කර ඇත්තේ ජූනි මාසයේදී වන අතර මාර්තු මාසයේ විගමන බද්ද වූ රු 6,798,000 ක් හා ජූනි මාසයට අදාළ රු 3,203,100 ක ආදායමක් CIGAS වැඩසටහන සඳහා උඩුගත කර ඇත්තේ පිළිවෙලින් ජූනි මාසයේදී හා අගෝස්තු මාසයේදී වන අතර මෙය ආදායම් හඳුනාගැනීම හා CIGAS වැඩසටහන සඳහා උඩුගත කිරීමේ ක්‍රියාවලියට අදාළ දෙපාර්තමේන්තු අභ්‍යන්තර පාලනයන්හී පවත්නා දුර්වලතාවක් හේතු වී තිබිණ.	මෙම ආදායම් අදාළ මාසයට හඳුනාගැනීමට හා CIGAS වැඩසටහන සඳහා උඩුගත කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීමට බලපාන විවිධ හේතූන් ඇති බව.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 ප්‍රකාරව ආදායම් වාර්තා නිසි පරිදි පිළියෙල කළයුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණයේදී සමාජ ආරක්ෂක දායකත්ව බදු ගිණුමේ ආදායම් වර්ගීකරණය අනුව ශේෂය හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අතර ශුද්ධ ශේෂය ආදායම් සංකේත 1002.16.01 හා 1002.16.02 ට අදාළව මුළු වෙනස වූ රු.44,621,593,928 ක මුදල එකිනෙක මාසවලට වෙන වෙනම ගැලපීම් නොකර වර්ෂ අවසානයේ මාරුකිරීම් පත්‍ර මඟින් සිදු කිරීම හේතුවෙන් එකිනෙක මාසවල සත්‍ය ආදායම වාර්තා වී	2024 අප්‍රේල් මාසයේ සිට ආදායම් වර්ගීකරණ වාර්තා තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම, සමාජ ආරක්ෂණ දායකත්ව බදු පාලන ගිණුම යටතේ වර්ගීකරණය කර තිබුණු බැවින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම නිවැරදිව වර්ගීකරණය කිරීම සඳහා 2024 ඔක්තෝබර් 04 දිනැති මාරු පත්‍රය මඟින් අදාළ ගැලපීම් සිදු කර ඇති බව හා ඒ අනුව ආදායම් වර්ගීකරණය අනුව ශේෂය හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව ශුද්ධ ශේෂය අතර වෙනසට හේතු වූ බව.	භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණ පාලන ගිණුම නිවැරදිව සැසඳීම් කළ යුතුය.

	නොතිබූ බව විගණනයට නිරීක්ෂණය විය.		
(ඇ)	**ආදායම් වර්ගීකරණ දෝෂ**		
(i)	දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන එකතු කිරීමේ අගය මත බදු ආදායම භාණ්ඩාගාරයේ පවත්වා ගෙන යන පාලන ගිණුමට බැර වේ. එසේ බැර වන මුදල් මාසික සාරාංශ මඟින් මූල්‍ය සේවා, අනෙකුත් සේවා හා නිෂ්පාදන යන එකතු කිරීමේ අගය මත බදු ආදායම් සංකේත තුන වෙත ගිණුම් ගත කිරීම සිදු වේ. සමාලෝචිත වර්ෂයේ එකතු කිරීමේ අගය මත බදු පාලන ගිණුමේ(1002.01.00) මාසික ගිණුම් සාරාංශ මඟින් ගිණුම් ගත කිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉතිරි වී පැවැති ශේෂය වන රු.1,891,325,403 ක මුදල ආදායම් සංකේත අනුව හඳුනාගැනීමෙන් තොරව 10.04.02.99 අනෙකුත් සේවා ආදායම් සංකේතයට මාරු පත්‍රයක් මඟින් මාරු කිරීම හරහා එකතු කිරීමේ අගය මත බදු මූල්‍ය සේවා, අනෙකුත් සේවා හා නිෂ්පාදන යන ආදායම් සංකේත තුනෙහිම ශුද්ධ ආදායමේ නිරවද්‍යතාව විගණනයේදී තහවුරු නොවීය.	ඉදිරියේදී මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට සැලසුම් කර ඇති බව.	භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණ පාලන ගිණුම නිවැරදිව සැසඳීම් කළයුතුය**.**
(ii)	ආදායම් වර්ගීකරණ දෝෂය 2021, 2022 හා 2023 වර්ෂවල පිළිවෙලින් රු.889,326,709ක්, රු.7,021,728ක් හා රු.1,068,469,869ක් ලෙස සිදු වී තිබුණි.	ඉදිරියේදී මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට සැලසුම් කර ඇති බව.	භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණ පාලන ගිණුම නිවැරදිව සැසඳීම් කළයුතුය**.**

1.6.2. **දේපල පිරියත හා උපකරණ**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වසර 42 කට ආසන්න කාලයක් කුරුණෑගල දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය පිහිටා ඇති ඉඩමට එහි ඔප්පුව මෙතෙක් ලබාගෙන නොතිබීම මත තක්සේරු වාර්තාවක් ලබා ගැනිමට නොහැකි වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දින කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කර ඇති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 හා ඊට අදාළ මාර්ගෝපදේශය අනුව, තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා සිටින ලද අතර ඉඩම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම් අත්පත්) ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ අත්පත් කර ගැනීමට කටයුතු කරන ලෙස කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් වෙත දන්වන ලද ලිපිය ලද පසු අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර, ඉඩමේ අයිතිය ලියාපදිංචි කිරීමට පියවර ගන්නා බව කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් වාචිකව දැනුම් දී ඇති බැවින් ඉන් අනතුරුව මෙම ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව.	මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශය අනුව කටයුතු කරමින් අදාල වත්කම් ගිණුම්ගත කළයුතුය..
(ආ)	2007 සැප්තැම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අංක අමප/07/1625/342/021 හා 2007 සැප්තැම්බර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 12, ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමකින් පර්චස් 100 කින් යුත් බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැවරීමට අදාළව ගිවිසුමකට එළඹීමෙන් තොරව රුපියල් මිලියන 50 ක අත්තිකාරම් මුදලක් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ගෙවා තිබුණු අතර මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් මෙතෙක් ගිණුම් මඟින් හෙළිදරව් කිරීම් සිදුව නොතිබුණි.තවද උක්ත ඉඩම කාර්යාල සංකීර්ණයකට සුදුසු නොවන බව තීරණය කර තිබූ	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කොළඹ 12, සංඝරාජ මාවතේ පිහිටි පර්චස් 100 ක ඉඩමක් පවරා ගැනීම සඳහා 2008 පෙබරවාරි 22 දින රුපියල් මිලියන 50 ක අත්තිකාරම් මුදලක් සී/ස ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවට ගෙවා ඇති අතර එකී ඉඩම කාර්යාල සංකීර්ණයකට සුදුසු නොවන බව තීරණය වී ඇති බැවින් එම මුදල නිදහස් කරන ලෙසට සී/ස ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් වරින් වර ඉල්ලීම් කර ඇති අතර එකී මුදලට හිලව් කිරීමක් ලෙස ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව සතු කළුතර නාගරික බල ප්‍රදේශයේ පිහිටි ඉඩමක් මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා දීම පිළිබඳ සාකච්ඡා වී ඇතත් ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව පාර්ශවයෙන් වර්තමාන තත්වය පිළිබඳව මේ දක්වා පිළිතුරක් ලබා දී නැති බව.	අත්තිකාරම් මුදල කඩිනමින් ආපසු අයකර ගැනිමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

	අතර එම මුදලට හිලව් කිරීමක් ලෙස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සතු කළුතර නාගරික බල ප්‍රදේශයේ පිහිටි ඉඩමක් දෙපාර්තමේතුව වෙත පවරා දීම පිළිබඳ සාකච්ඡා සිදු කළ ද ගැටලුව සඳහා සාධනීය විසඳුමක් කරා එළඹීමට මෙතෙක් අපොහොසත්ව තිබුණි.		
(ඇ)	මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දින කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 සමඟ නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශය ප්‍රකාරව, කෙරීගෙන යන ඉදිකිරීමක මෙතෙක් දරා ඇති සම්පූර්ණ වියදම කෙරීගෙන යන වැඩ වශයෙන් ගිණුම්ගත කළ යුතු බව දක්වා ඇතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ පිහිටි රු.176,000,000 ක මූලික ඇස්තමේන්තුවක් යටතේ ඉදිකෙරෙමින් පැවති මේ වන විට උපයෝජනය කළ හැකි මට්ටමට පත් නොකර ඉදිකිරීම් නවතා ඇති වාහන අංගනය වෙනුවෙන් මෙතෙක් දරා ඇති මුදල්, කෙරීගෙන යන ඉදිකිරීම් වශයෙන් ගිණුම් ගත කර නොතිබූ අතර අංගනයේ වර්තමාන තත්ත්වය නිරීක්ෂණය කිරීමේදී , එය දැඩි ලෙස දිරාපත් වී හා අබලි වී ඇති බැවින් වර්තමාන තක්සේරු වටිනාකම දැනට ගිණුම් ගත කර ඇති වටිනාකමෙන් වෙනස් වීමට හැකියාවක් තිබුණි.	NBRO ආයතනය මගින් 2024 දෙසැම්බර් 26 දින, වාහන අංගනයේ ව්‍යුහාත්මක සැලසුම් සම්බන්ධ තොරතුරු කැඳවා ඇති අතර ඒ සම්බන්ධව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ලබාදුන් තොරතුරු NBRO වෙත යොමු කර ඇති බවත් වාහන අංගනයේ ව්‍යුහාත්මක විශ්ලේෂණ වාර්තාව මසක් තුළ ලබාදීමට NBRO ආයතනය වාචිකව එකඟ වී එම ආයතනයේ නිලධාරීන් 2025 අප්‍රේල් 04 වන දින දෙපාර්තමේන්තුවට පැමිණ අදාළ පරීක්ෂා කිරීමේ කටයුතුවල නිරත වුවද මේ වන තෙක් ඊට අදාළ වාර්තාව ලැබී නොමැති අතර අදාළ වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන බව.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කළයුතුය.

(ඈ)	එන්ජිම අක්‍රියවීම මත වර්ෂ 3 කට එහා ගිය කාලයක් නිශ්ක්‍රීයව පැවති මිට්සුබිසි වර්ගයේ ලොරි රථයක අපහරණ ක්‍රියාවලිය අවසන් නොවීම මත අදාළ වාහනයේ වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත් වී තිබුණි.	ලොරි රථය ධාවනය කළ නොහැකි මට්ටමේ පවතින බැවින් අපහරණ කමිටුව විසින් රථය අපහරණය කිරීම සුදුසු බව නිර්දේශ කර ඇති අතර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් රථය භාරගැනීමට කැමැත්ත පල කර ඇති බැවින් පැවරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කළයුතුය.
(ඉ)	2023 දෙසැම්බර් 11 දින CAC-9937 දරන වාහන අනතුර සම්බන්ධයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (ii) පොත්වලින් කපා හැරීම පිළිබඳව ප්‍රකශනය මඟින් ඉදිරියට ගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සියළු තොරතුරු ඊට ඇතුළත් කර නිවැරදිව සකස් කරන ලෙසට අවශ්‍ය උපදෙස් ලබා දුන් බවත් අනතුරින් සිදු වූ අලාභ හානිය මේ වන විට සම්පූර්ණයෙන් ප්‍රතිපූර්ණය කර අවසන් ගෙවීම් සිදු කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු බව.
(ඊ)	2022 දෙසැම්බර් 31 දිනට සිදු කර ඇති භාණ්ඩ සමීක්ෂණය මඟින් නියැදියක් සඳහා තෝරාගත් අංශ 43කට අදාළ භාණ්ඩ අයිතම සම්බන්ධයෙන් **CIGAS** වැඩසටහනට ගැලපීම් කළ යුතු බවට නිර්දේශ ලබා දී ඇතත්, අංශ 05 කට අදාළ අයිතම ගැලපීම සම්බන්ධයෙන් තවදුරටත් සමීක්ෂණ සිදු කළ යුතු බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ 2024 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ ලෙස දක්වා ඇති රු. 525,986,171 ක් වූ වත්කම්වල වටිනාකම වෙනස් විය යුතු බැවින්, එම වටිනාකම පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැක.	මුළු අයිතම 145 ක් සඳහා අදාළ ගැලපීම් හා නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කර ඇති අතර මේ සම්බන්ධව පත්කර ඇති විශේෂ සමීක්ෂණ මණ්ඩලය විසින් මේ වන විට අංශ 09 කට අදාළ සමීක්ෂණ කටයුතු සිදුකර වාර්තා ඉදිරිපත් කර ඇති බව.	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතුය.

1.6.3. **විගණනය සඳහා සාක්ෂි නොවීම**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිංගප්පූරුවේ ආයතනය සමග එළඹී ඇති ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ලබාදී නොමැති බැවින් RAMIS	RAMIS පරිගණක පද්ධතියට අදාළ ලියකියවිලි හෝ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සිංගප්පූරු රජය වෙනුවෙන් ගිවිසුමට අත්සන් කරන ලද Singapore Corporation Enterprises	අදාළ ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ලබාදී යුතු අතර ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට සහය

	පද්ධතියට අදාළ මුදල් ගෙවීම් අදාළ ගිවිසුම් ප්‍රකාරව සිදුවී ඇති ද යන්න විගණනයේදී තහවුරු කළ නොහැකි වී ඇත.	ආයතනයේ ලිඛිත අවසරය ලැබී නොමැති බැවින් අදාළ ගිවිසුම් පිටපත් විගණකාධිපතිවරයාට ලබාදීමට නොහැකි බව හා එසේ වුවහොත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට එරෙහිව සිංගප්පූරු සමාගම විසින් ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව ඇති බව.	දැක්වීම පැහැර හැරීම වරදක් බව.
(ආ)	RAMIS පද්ධතියෙන් පරිබාහිරව පවත්වාගෙන යන වාර්තා මොඩියුලය වන **elixir** පද්ධතියේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර නොමැතිවීම හා විගණන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවේශය මෙතෙක් ලබා නොදීම හේතුවෙන් විගණන කාර්ය මණ්ඩලයට RAMIS පද්ධතියෙන් වාර්තා ස්වාධීනව ජනනය කිරීම සීමා වී ඇති අතර දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව ලබාදෙන වාර්තා මත විගණන පරීක්ෂණ සිදු කිරීම තුලින් විෂය පථය සීමා වී ඇත.	පද්ධතියේ කරන ලද වැඩි දියුණු කිරීම් වලින් අනතුරුව, පැරණි බදු කාලසීමා වලට අදාළ තොරතුරු සියල්ල පද්ධතිගත කර නොමැති බැවින් ඉදිරියේදී “elixir” පද්ධතියට විගණන නිලධාරීන්ට ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කරනු ඇති බව.	elixir පද්ධතියේ සංවර්ධන කටයුතු කඩිනමින් සම්පූර්ණ කර විගණන නිලධාරීන්ට ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කළ යුතු බව , එසේ නොකිරීම ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට සහය දැක්වීම පැහැර හැරීමේ වරදක් වන බව.
(ඇ)	සමුපකාර තොග වෙළඳ සංස්ථාව වෙතින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණ ජාවත්ත ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල සම්බන්ධ ප්‍රසම්පාදන, ඉන්වෙන්ට්‍රි බාරදීම හා භාරගැනීම හෝ අයිතිය තහවුරු කිරීමට අදාළ නිශ්චිත ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.	පිළිතුර ලබා දී නැත.	වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා නිශ්චිත ලේඛන පවත්වා ගත යුතු අතර ඒවා විගණනයට ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව`	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1. 1.(i)	භාණ්ඩාගාර තොරතුරු හා දෙපාර්තමේන්තු පොත් අතර පවතින වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන ගැලපිය යුතුය.	1.6.1.1.(i)
1.6.1. 1.(iii)	අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කර නිරවුල් කළ යුතුය.	1.6.1.1.(iv)
1.6.1.2	මාසික ආදායම් නිවැරදිව වාර්තා කළ යුතුය.	1.6.1.2 (i)
1.6.1.3.(iii)	ආදායම් වර්ගීකරණ දෝෂ නිරවුල් කළ යුතුය.	1.6.1.3.(i)
1.6.2.1, 1.6.2.2	චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තු සතු සියළු වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය.	1.6.2.3,1.6.2.6

3. **මූල්‍ය සමාලෝචනය**

3.1. **අග්‍රිම කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
3.1.1	දෙපාර්තමේන්තුව අග්‍රිම සැලසුම් කිරීමේදී මාසිකව ඉල්ලුම් කළ යුතු අග්‍රිමය හඳුනාගෙන නොතිබූ අතර සමස්ථ වර්ෂය සඳහාම රු.9,551,730,000 ක මුදලක් ඉල්ලුම් කිරීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය තුළ රු.9,072,882,000 ක් ලෙස අග්‍රිම ඉල්ලුම්කර තිබුණි. කෙසේ වුවද දෙපාර්තමේන්තුව වෙත ලැබුණු මුළු අග්‍රිමය රු. 8,386,032,000 ක් වූ අතර එය ඉල්ලුම් කළ අග්‍රිමයෙන් සියයට 92 ක් විය. මාසිකව ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබුණු අග්‍රිමය අතර විචලනය සියයට 2 සිට සියයට 153 දක්වා පරාසයක පැතිර තිබුණි. තවද ඉල්ලුම් කළ යුතු අග්‍රිමය හා ලැබුණු අග්‍රීමය අතර රු. 1,165,698,000 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් විය.	වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පරිදි අනුමත ප්‍රතිපාදන සීමාව පදනම් කරගෙන වාර්ෂික අග්‍රිම සීමාව සකස් කරනු ලබන අතර වාර්ෂිකව සැලසුම් කළ අග්‍රිම සැලැස්මට යටත්ව මාසිකව ඉල්ලුම් කරන ලද අග්‍රිම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අක්මුදල් නිදහස් කිරීමේදී ද්‍රවශීලතාව පදනම් කරගෙන සිදුකිරීම සහ රට තුළ පැවති ආර්ථික අර්බුදය නිසා භාණ්ඩාගාරය මඟින් ඉල්ලුම් කරන ලද අක්මුදල් ප්‍රමාණයම ලබා නොදීම මත සිදු වූ තත්ත්වයක් බව.	දෙපාර්තමේන්තුවේ අග්‍රිම කළමනාකරණය මනා පාලනයකින් යුතුව සිදු කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු වේ.

3.2. **ආදායම් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
3.2.1	මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (2)(ඇ) ඡේදය ප්‍රකාරව දේශිය	හිඟ බදු වාර්තාව (C-49) සකස් කිරීමට ප්‍රථම බැංකු මඟින් අගරු චෙක්පත්	මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (2)(ඇ) ඡේදය ප්‍රකාරව

	ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අර්ධ වාර්ෂික හිඟ බදු වාර්තා පිළිවෙලින් ජූලි 31 හා ඊළඟ මුදල් වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව, 2024 ජූනි 30 දිනෙන් අවසන් අර්ධ වර්ෂය සඳහා 2024 අගෝස්තු 30 දින මාස 01 ක කාල පමාවකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද Legacy හා RAMIS පද්ධතිවල හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තාව මඟින් ලබා දුන් තොරතුරු පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ කරුණු පහත වේ.	නිවේදන, බැංකු වැරදි - නිවැරදි කිරීම් වලට අදාළ හර - බැර ලේඛන ආදිය ලැබිය යුතු අතර, එම ලේඛන ලැබීමට මාසයකට වඩා වැඩි කාලයක් ගත වන අතර, ඉන් අනතුරුව අදාළ වැඩ අයිතමවල කටයුතු නිම කිරීමට තවත් කාලයක් වැය වීම මත එම කටයුතු නිම කිරීම අදාළ මාසය තුළ සිදු කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි වේ. එබැවින් ඒ සඳහා කාලය දීර්ඝ කර දෙන ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2024 ජූලි 19 දිනැති ලිපිය මඟින් විගණකාධිපති වෙතින් ඉල්ලා ඇත.	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අර්ධ වාර්ෂික හිඟ බදු වාර්තා නියමිත දිනට විගණකාධිපති ලබා දිය යුතුය.
(අ)	උක්ත හිඟ බදු වාර්තා අනුව, RAMIS හා Legacy පරිගණක පද්ධති වලට අදාළව 2024 ජූනි 30 දිනට පැවති මුළු හිඟ බදු, දඩ හා පොලී ආදායම රු.961,447,877,690ක් ද එයින් රු. 793,081,825,508 ක් අයකිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී වූ අතර රු.168,366,052,182ක් අය කළ හැකි බදු, දඩ හා පොලී විය. ඒ අනුව, සියයට 82 කට වැඩි වටිනාකමක් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී විය.	නිරීක්ෂණ නිවැරදි බව.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.
(ආ)	RAMIS පරිගණක පද්ධතියට අදාළ වූ උක්ත හිඟ බදු ප්‍රමාණය සමස්ථ හිඟ බදු, දඩ හා පොලී වටිනාකම වන රු. 765,243,704,202 න් සියයට 84ක් එනම්, රු. 639,069,761,631ක් අය කිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී ලෙසත්, රු. 126,173,942,571ක් එනම් සියයට 16ක් අය කර ගත හැකි හිඟ බදු හා දඩ ලෙසත් හඳුනා ගෙන තිබූ අතර Legacy පරිගණක පද්ධතියට අනුව, හිඟ බදු, දඩ හා පොලී වටිනාකම වන රු. 196,204,173,488 න්	නිරීක්ෂණ නිවැරදි බව.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.

	රු.154,012,063,877 ක් එනම්, සියයට 79 ක් අය කිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී ලෙස හඳුනා ගෙන තිබුණි.		
(ඇ)	සමස්ථ හිඟ බදු, දඩ හා පොලී ආදායමෙන් සැලකිය යුතු ඉහළ වටිනාකමක් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී ලෙස පැවතීමත් එමගින් අපේක්ෂිත බදු ආදායම දෙපාර්තුමේන්තුවට අයවීම, අභියාචනා ක්‍රියාවලිය විසඳීම මත තීරණය වන කරුණක් බැවින් එම බදු හා දඩ මුදල් අයවිය යුතු බව හෝ අයවීමට හිඟ බද්දක් නොමැති බව තීරණය වීම සඳහා සැලකිය යුතු කාල සීමාවක් ගත වන බව නිරීක්ෂණය විය.	හිඟ බදු අය කිරීම අත්හිටුවනු ලබන්නේ නිකුත් කරන ලද තක්සේරුවලට එදිරිව අභියාචනා හෝ විරෝධතා ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී, හිඟ බදු අය කිරීම සඳහා නඩු පවරා ඇති විටදී හෝ 2021 අංක 18 දරණ මුදල් පනත හා 2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධිත පනත යටතේ කපා හැරීමට සුදුසුකම් ලබා ඇති විට වන අතර එම අත්හිටුවීමට හේතු වූ කරුණු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව හිඟ බදු අය කර ගැනීම සිදු කරනු ලබන බව.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	Legacy පද්ධතියට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු හා දඩ ශේෂය රු.209,936,351,221ක් වන අතර 2024 ජුනි 30 දිනට හිඟ බදු හා දඩ ශේෂය රු.196,201,974,929 ක් විය. ඒ අනුව එම කාල පරාසය තුළ Legacy පද්ධතියට අදාළව හිඟ බදු හා දඩවලට අදාළ අයවීමේ ප්‍රගතිය පරීක්ෂාවේදී මුළු හිඟ බදු හා දඩ ප්‍රමාණය 2024 ජුනි 30 දින වන විට රු.13,734,376,292 කින් අඩු වී ඇති අතර ඒ තුළ රු.8,610,021,711 ක් අළුතින් හඳුනා ගත් හිඟ බදු හා දඩ බවත්, රු.14,545,807,451 ක් මූල්‍යමය නොවන හේතූන් මත සිදු කළ ගැලපීම් බවත්, රු. 3,002,483,464 ක් පමණක් මුදලින් අයකර ගෙන තිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව විගණනය සඳහා සලකා බැලූ කාල පරිච්ඡේද තුළ අය කළ හැකි හිඟ බදු වටිනාකම මුදලින් අයවීමේ ප්‍රතිශතය සියයට 15 ක් පමණක් විය.	පිළිතුරු ලබා දී නොමැත.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියළුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.

(ඉ)	RAMIS පද්ධතියට අදාළව 2023 දෙසැම්බර් 31 දින සිට 2024 ජුනි 30 දින දක්වා සමස්ථ අයකළ හැකි හා සමස්ථ අය කිරීම් තාවකාලිකව අත්හිටවූ හිඟ බදු,පොලී හා දඩවලට අදාළව අයවීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා කැඳ වූ අතිරේක තොරතුරු විශ්ලේෂණයේදී, අය කර ගත හැකි මුළු හිඟ බදු මුදලේ හා තාවකාලිකව අත්හිටවූ මුළු හිඟ බදු මුදලේ 2023 දෙසැම්බර් 31 දින ශේෂ අතර පිලිවෙලින් රු. 173,749,755 ක හා රු. 967,411,196 ක වෙනසක් ද 2024 ජුනි 30 දින ශේෂ අතර පිලිවෙලින් රු. 403,908,945 හා රු. 1,998,964,464 ක වෙනසක් ද නිරීක්ෂණය විය.	2023 දෙසැම්බර් 31 ශේෂය හා 2024 ජනවාරි 01 ශේෂ අතර වෙනස RAMIS දත්ත වාර්තා අනුව සිදුවී ඇති බවත් RAMIS පද්ධතියට අදාල දත්ත මෙම අංශය වෙත ලබා දෙන NCS ආයතනය 2023 දෙසැම්බර් 31 දිනට අදාළව තොරතුරු ලබාදීමේදී දෝෂයක් සිදුවී ඇති අතර මෙම දෝෂය නිවැරදි කර NCS ආයතනය මගින් මෙම වෙනස පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත කරුණු දක්වා ඇති අතර ඒ අනුව නව දත්ත යොදා ගනිමින් 2024 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ප්‍රකාශය සකස් කිරීම ඉහත වෙනසට හේතු වී ඇති බවත් උක්ත සඳහන් දෝෂය සිදු වීම් පිළිබඳ කොමසාරිස් ජනරාල් තුමිය විසින් RAMIS කාර්යාලයේ නිලධාරීන්ගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා ඇති බවත්.	බදු සම්බන්ධ වාර්තා නිවැරදිව පද්ධතිය තුළින් ජනනය වන බවට කළමනාකරණය සහතික විය යුතු අතර පවතින වෙනස්කම් නිරාකරණය කිරීමට කඩිනම් පියවර ගත යුතුය.
(ඊ)	තෝරාගත් ප්‍රාදේශීය කාර්යාල කිහිපයක RAMIS පද්ධතියට අදාළ වන කාල සීමාවේ සිදු කළ නියැදි පරීක්ෂාවේදී ද හිඟ බදු නිවැරදිව හිඟ බදු වාර්තාවන්හි සටහන් වී නොමැති අවස්ථා ද විගණනයේ දී නිරීක්ෂණය වූයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබන හිඟ බදු වාර්තාව මගින් සත්‍ය හිඟ බදු ප්‍රමාණයන් වාර්තා නොවන බව නිරීක්ෂණය විය.	හිඟ බදු වාර්තා නිවැරදි කිරීමට හා එම වැරදි නැවත නැවත සිදු වීම වැළැක්වීම පිණිස ප්‍රාදේශීය කාර්යාල වෙත උපදෙස් ලබා දී ඇත.	බදු සම්බන්ධ වාර්තා නිවැරදිව පද්ධතිය තුළින් ජනනය වන බවට කළමනාකරණය සහතික විය යුතුය.
3.2.2	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 2024 පෙබරවාරි 20 දිනැතිව ඉදිරිපත් කළ Legacy පද්ධතියේ හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තාව හා RAMIS පද්ධතියේ හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තාව මගින් ලබා දුන් තොරතුරු පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ කරුණු පහත වේ.		

(අ)	දෙපාර්තමේන්තුව විසින් එක් රැස් කර ගත යුතු සමස්ථ හිඟ බදු, දඩ හා පොලී ආදායමෙන් සියයට 85 කට වැඩි වටිනාකමක් එනම් රු. 974,307,199,040 ක් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී ලෙස හඳුනා ගෙන තිබුණි.	නිරීක්ෂණ නිවැරදි වේ.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියළුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.
(ආ)	RAMIS පරිගණක පද්ධතියට අදාළව, 2024 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු, දඩ හා පොලී වටිනාකම වන රු. 961,921,636,054 න් සියයට 86 ක් එනම්, රු.824,835,296,464 ක් අය කිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී ලෙසත්, රු.137,086,339,590 ක් එනම් සියයට 14 ක් අය කර ගත හැකි හිඟ බදු හා දඩ ලෙසත් හඳුනා ගෙන තිබුණි.	නිරීක්ෂණ නිවැරදි වේ.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	Legacy පරිගණක පද්ධතියට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු, දඩ හා පොලී වටිනාකම වන රු.188,082,393,190 න් රු. 149,471,902,576 ක් එනම්, සියයට 79 ක් අය කිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී ලෙස හඳුනා ගෙන තිබුණි.	නිරීක්ෂණ නිවැරදි වේ.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය.
(i)	2014 අංක 14 පනතින් සංශෝධිත 2010 අංක 16 දරන පැහැර හරින ලද බදු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ 2009 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පැහැර හරින ලද බදු අය කර ගැනීම සඳහා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් වරයෙකු යටතේ දෙපාර්තමේන්තුව තුළ වෙනම ඒකකයක් (DTRU) ස්ථාපිත කර එම හිඟ බදු අය කර ගැනීමට අදාළ විශේෂ විධිවිධාන පනවා තිබුණි. කෙසේ නමුත්,	ඉතිරිව ඇති හිඟ බදුවල පැරණිභාවය නිසාම විවිධ හේතු මත විසඳීම කල් ගත වන බවත් කෙසේ වෙතත් මෙම හිඟ බදු අය කර ගැනීම් උපරිම ආකාරයෙන් කටයුතු කරනු ලබන බව.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.

2024 ජනවාරි 01 දින සිට DTRU අංශය පෙර සිට පැවති Legacy අංශය යටතේ ඒකාබද්ධ කර හිඟ බදු (RAMIS කාල සීමාවට පෙර) අයකිරීම් අංශය ලෙස නව අංශයක් කොමසාරිස්වරියක් යටතේ පිහිටුවා තිබිණි. DTRU අංශයට 2015 දෙසැම්බර් 31 දින රු.48,812,991,690ක් හිඟ බදු හා දඩ ලෙස මාරු කර ඇති අතර 2024 දෙසැම්බර් 31 දින වන විට රු.18,752,301,710ක් දක්වා එනම්, රු.30,060,689,980ක හිඟ බදු හා දඩ මුදල් පමණක් නිරවුල් කර තිබුණි.

(ii) ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව 2019, 2020, 2021,2022,2023 හා 2024 වර්ෂවල මෙම අංශයේ හිඟ බදු අඩුවීම මුදලින් හා වෙනත් ආකාරයන් පිළිබඳ සාරාංශය පහත පරිදි විය. ඒ අනුව පහත දක්වා ඇති හිඟ බදු අයකිරීම් තුළ සත්‍ය වශයෙන්ම මුදලින් අය වූ ප්‍රමාණය සියයට 18 ක් වූ අතර නිවැරදි කිරීම් හා මුදල් පනත යටතේ කපා හැරීම් සියයට 82ක් බව නිරීක්ෂණය විය.

2021 අංක 18 දරන මුදල් පනත හඳුන්වා දීමත් සමඟ එම පනත අනුව කපාහැරිය හැකි පැරණි හිඟබදු වර්ග කපාහැරීම්, SME යටතේ බදු කපා හැරීම හා උපදේශන කමිටුවේ නිර්දේශ මත රජයේ ආයතනවලට අදාළ දඩ කපාහැරීම හා මුදලින් අය කර ගත යුතු බදු හැකි උපරිම ලෙස අය කිරීම සිදු කර ඇති බව .

අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය**.**

වර්ෂය	මුදලින් (රු.) අයකිරීම	නිවැරදි කිරීම්, නිරවුල් හා ගැලපීම් සිදුකළ ප්‍රමාණය (රු.)	මුදල් පනත යටතේ කපා හැරීම් (රු.)
------	-----------------	-----------------	------------
2019	1,026,330,364	1,089,542,165	-
2020	1,275,035,679	661,186,332	-
2021	80,013,481	1,381,921,734	576,482,746
2022	201,769,368	892,111,204	3,078,470,847
2023	668,169,342	5,791,720,155	1,703,179,440
2024	613,154,940	1,894,317,835	812,528,744
එකතුව	**3,864,473,174**	**11,710,799,425**	**6,170,661,777**
	18%	54%	28%

(iii) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය අනුව ආර්ථික සේවා ගාස්තු, ජාතික ආරක්ෂණ සේවා බදු, පිරිවැටුම් බදු, ණය ආපසු

පිළිතුරු ලබා දී නොමැත.

බදු සම්බන්ධ වාර්තා නිවැරදිව පද්ධතිය තුළින් ජනනය වන බවට කළමනාකරණය සහතික විය යුතුය.

	ගෙවීමේ බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද - සේවා, ජාතිය ගොඩනැගීමේ බද්ද - නිෂ්පාදන හා ප්‍රේෂණ ගාස්තුවලට අදාළ ආදායම් රැස් කිරීම හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව අය කරන ලද හිඟ ආදායම් සමාන විය යුතු වුවත්, ඒවා අතර එකතුව රු.1,686,796,442ක වෙනසක් නිරීක්ෂණය විය.		
(iv)	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව කිසිදු අයකර ගැනීමක් නොමැතිව 10.02.07.00 මුද්දර බදු ආදායම් ශීර්ෂය යටතේ රු.14,599,086 ක් හා 10.02.08.00 හර බදු ආදායම් ශීර්ෂය යටතේ රු. 2,215,581,368ක ශේෂයක් ද 2019 වර්ෂයේ සිට පවතින බව නිරීක්ෂණය විය.	හිඟ මුදල සම්බන්ධයෙන් අදාළ බදු ගෙවන්නන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින කරුණු දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැරව පවතින බැවින් මෙතෙක් කිසිඳු අය කර ගැනීමක් සිදු වී නොමැති බව	අධිකරණයන්හි විභාග වෙමින් පවතින නඩු කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව ලබා දෙමින් අවසන් නියෝග මත කාලීනව ක්‍රියා කළ යුතු බව.
3.2.3	**ආදායම් ඇස්තමේන්තුකරණය**		
(අ)	2024 වර්ෂයට අදාළ වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු. 2,740,442,500,000ක් වූ අතර වර්ෂය තුළ රැස්කරගත් සත්‍ය ආදායම රු.2,605,027,061,526 ක් වුයෙන් සියයට 05 ක් එනම් රු.135,415,438,474 ක ආදායම් රැස්කිරීමේ ඌණතාවක් විය. එහි ප්‍රමාණාත්මකව නිරීක්ෂණය වූ ආදායම් සංකේතාංක 8 කට අදාළව ආදායම් රැස්කිරීමේ අතිරික්තය රු.89,965,681,652 ක් වූ අතර ආදායම් සංකේතාංක 06 කට අදාළව ආදායම් රැස්කිරීමේ ඌණතාව රු.160,424,351,241ක් විය. එම අතිරික්තයන් හා ඌණතාවන් පිළිවෙලින් මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයන් ලෙස සියයට 17- 625 දක්වා හා සියයට 13- 99 දක්වා පරාසයක විහිදී තිබුණි.	2024 වර්ෂය සඳහා වන ආදායම් රැස්කිරීමේ ඉලක්කය සියයට 95 ක ප්‍රතිශතයකින් ලඟා කර ගැනීමට සමත් වී ඇති බවත් මූලික ආදායම් ඇස්තමේන්තුවට අදාළව ආදායම් රැස් කිරීමේ ඌණතාවන් හා අතිරික්තතාවන් වාර්තා වීම කෙරෙහි බදු පරිපාලන තීරණ හා රටෙහි විවිධ ක්ෂේත්‍රයන්හි ඇති වූ සෘණාත්මක හා ධනාත්මක වෙනස් වීම් බලපා ඇති බව.	වාර්ෂික ආදායම් ඉලක්ක නිවැරදිව ස්ථාපනය කිරීම හා ඒවා ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය

(ආ)	ප්‍රාග්ධන ලාභ බද්දට අදාළව ආදායම් රැස්කිරීමේ ඌණතාව සියයට 63 ක් විය. දෙපාර්තමේන්තුව තුළ ප්‍රාග්ධන ලාභ බද්ද සඳහාම වෙන්වූ ශාඛාවක් වෙනම ස්ථාපිත ව පවතින පසුබිමකදී හා අංක 2376/25 දරන හා 2024 මාර්තු 21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පැවරුම් ඇතුළුව ලියාපදිංචි කළ ඉඩම් හා දේපළවල අයිතිය හෝ හිමිකම හෝ පිළිබඳ තොරතුරු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලබා දීමට විධිවිධාන සලසා තිබියදීත් මෙම ප්‍රාග්ධන ලාභ බද්දට අදාළව ආදායම් රැස්කිරීමේ ඌණතාවක් පැවතිණි.	ප්‍රාග්ධන බද්ද සඳහා නැවත ලියාපදිංචි විමකින් තොරව කරන ලද ගෙවීම, ආදායම් බදු ආදායම තුළ ඇතුළත් වී ඇති බව හඳුනාගෙන ඇති බැවින් ප්‍රාග්ධන ලාභ බද්ද ලෙස වාර්තා වී ඇත්තේ බදු ආදායමට වඩා අඩු අගයක් බව.	ඇස්මේන්තු කළ ආදායම් රැස්කර ගැනීමට පියවර ගත යුතුය.
(ඇ)	ඍජු හා වක්‍ර බදු අතර යෝග්‍ය මිශ්‍රණය ලෙස සැලකෙන 60: 40 අනුපාතය ලඟාකරගැනීමට තවදුරටත් දෙපාර්තමේන්තුව ක්‍රියා කළ යුතු බව නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ එකතු කළ අගය මත බදු සඳහා සිදුකරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම් මත වක්‍ර බදු ආදායම වැඩි වීම මෙන්ම ආදායම් බද්ද සඳහා වෙනස් වීමක් සිදු නොවී පැවතීම මෙම අනුපාතයට හේතුව ඇති බවත් ඉදිරියේදී තවදුරටත් රජයේ අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟා වීමට දෙපාර්තමේන්තුව කැපවීමෙන් කටයුතු කරන බව.	ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ ඉලක්ක ලඟා කර ගත යුතුය.

3.2.4 TIN අංක 12400xxxx අදාළව Legacy පද්ධතියේ 2024 ජුනි 30 දිනට හිඟ බදු පරීක්ෂාව

(අ)	2024 ජුනි 30 දිනට පවතින හිඟ බදු පරීක්ෂාව සඳහා තෝරාගනු ලැබූ නියැදියට අනුව TIN අංක 12400xxxx දරන බදු ගෙවන්නාගේ හිඟ බදු විස්තරාත්මකව පරීක්ෂා කරන ලදී. උක්ත හිඟ බදු වාර්තාව අනුව මුළු හිඟ බදු ලෙස NBT, PAYE හා CIT සඳහා පිළිවෙලින් රු. 309,300 ක්, රු. 36,655 ක්, හා රු. 1,320 ක් ලෙස පැවතිණ. නමුත් Legacy	Legacy අංශයට අදාළ NBT, PAYE හා CIT 2024 දෙසැම්බර් 31 දිනට සමථයකට පත් කර ඇති අතර, VAT හිඟ බදු DTRU හිඟ බදු වාර්තාවට අයත් වේ. එය නිවැරදි කර ඇති බව.	බදු වගකීම් නිසි ලෙස නිරූපණය වන පරිදි පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට නිසි පියවර ගත යුතුය.

	පරිගණක පද්ධතිය පරීක්ෂා කිරීමේදී ඊට අමතර ලෙස PAYE,CIT හා VAT සඳහා පිළිවෙළින් රු. 100,877 ක්, රු.30,267 ක් හා රු. 2,837,222 ක් හිඟ බදු පැවතුණි. ඒ අනුව 2024 ජුනි 30 දිනට හිඟ බදු වාර්තාව රු. 2,930,391 කින් ඌණ ගණනය වී තිබිණි		
(ආ)	හිඟ බදු අය කර ගැනීම සඳහා බදුකරු වෙත 2022 මාර්තු 22 දිනැති හිඟ බදු අය කර ගැනීමේ වාර්තාව (101 P (2) 1 (A) DTRU) නිකුත් කර තිබූ අතර වාර්තාවේ හිඟ බදු ලෙස රු. 5,020,782 ක් පවතින අතර එම වාර්තාවට 2022 මාර්තු 30 දිනැතිව බදුකරු විසින් විරෝධතා (Objection) ලිපිය ගොනු කර තිබූ නමුත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු. 2,837,222 හිඟ බදු ගෙවිය යුතු බවට තහවුරු කිරීමේ ලිපිය 2024 මැයි 20 වන දින එනම් විරෝධතා (Objection) ලිපිය ලද දිනයේ සිට අවුරුදු 02 කට වඩා වැඩි කාල සීමාවකින් පසුව බදුකරු වෙත නිකුත් කර තිබුණි.	VAT බදු කාල සීමාව වන 03093 හා 03092 අදාළ හිඟ බද්ද 03062 සහ 03091 ආපසු ගෙවීම්වලින් හිලව් කරන ලෙස බදු ගෙවන්නා දන්වා ඇති නමුත් 2022 අප්‍රේල් 05 වන දින එම ඉල්ලීමට විද්‍යුත් පණිවිඩයක් මඟින් පිළිතුරු දන්වා, එවැනි ආපසු ගෙවීම් නොමැති බැවින් මතභේදයට ලක් වූ බද්ද ගෙවන ලෙස 2024 මැයි 05 වන දින දැනුම් දුන් බව	බදු වගකීම් නිසි ලෙස නිරූපණය වන පරිදි පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම, හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගත යුතුය.
(ඇ)	Legacy පරිගණක පද්ධතියෙහි උක්ත බදු ගෙවන්නාගේ වෙත VAT සඳහා 03062, 03091, 06031, 06033 හා 12030 යන බදු කාලපරිච්ඡේද සඳහා රු. 3,698,391ක බදු ආපසු ගෙවීම් (Refund) ශේෂ සමථයකට පත් කර බදු ආපසු ගෙවීමේ දැන්වීම් (Refund Notice) පද්ධතිය තුළින් මුද්‍රණය කර ඇති බවට දක්වා නොමැති අතරම යථෝක්ත බදු කාල සීමාවන් සඳහා සත්‍ය වශයෙන් පවතින ආපසු ගෙවීම් සත්‍යාපනය කර ඊට අදාළව Legacy පරිගණක පද්ධතිය 2024 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කර	03062 සහ 03091 බදු කාල සීමාවන්ට අදාළ යෙදවුම් බදු නිවැරදි නොවන බැවින් ආපසු ගෙවීම් නොමැත. 06033 සඳහා වැඩිපුර ගෙවීම් හා 06031 සහ 12030 සඳහා ද ආපසු ගෙවීම් නොමැති බව.	බදු වගකීම්/ ආපසු ගෙවීම් නිසි ලෙස නිරූපණය වන පරිදි පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම, හිඟ බදු අය කර ගැනීමට/ ආපසු ගෙවීම් කාලීනව සිදු කිරීමට නිසි පියවර ගත යුතුය

නොමැති බව නිරීක්ෂණය විය.

3.3. වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
3.3.1	පුනරාවර්තන වැය විෂයයන් 11 ක් සඳහා රු. 330,930,000 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද රු.201,100,797 ක් උපයෝජනය කිරීම සහ බැරකම් සඳහා රු.7,439,379 ක ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු රු.122,389,824 ක ඉතිරියක් වූ අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් විය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 යටතේ අතිකාල, විදේශීය දීමනාව සීමා කිරීම්, ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම හා තොග පවත්වාගෙන යාම සීමා කිරීම, දුම්රිය බලපත්‍ර ඉල්ලුම් කිරීම අඩු වීම, ඉන්ධන භාවිතය අවම වීම, නිලධාරි පුරප්පාඩු පැවතීම, පුවත්පත් නිවේදන පල කිරීම සඳහා ප්‍රතිපාදන අවම කිරිම, වැඩසටහන් මාර්ගගත ක්‍රමයට සිදු කිරීම,දේශීය පුහුණු වැඩසටහන් සීමා කිරීම.,රක්ෂණ ගිවිසුම් බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම, රජයේ සේවකයන් සඳහා දේපළ ණය අලුතින් ලබා දීම නතර කිරීම සහ ණය ලබා ගත් නිලධාරීන්ගේ රජයේ දායකත්ව මුදල පමණක් ගෙවීම වැනි හේතු නිසා පුනරාවර්තන වැය විෂයයන් 11ක් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබීම හා බැරකම් සඳහා අඩු කළ පසු ඉතිරිය ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 99 දක්වා පරාසයක පිහිටා ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කිරීම කළමනාකරණය කළ යුතු බව.
3.3.2	මූලධන වැය විෂයයන් 6 ක් සඳහා රු. 4,845,700,000 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද රු.3,108,675,656 ක් පමණක් උපයෝජනය කිරීම නිසා රු.1,737,024,344 ක් ඉතිරියක් වූ අතර එය ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් විය.	ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා ගත නොහැකි වීමෙන් ගොඩනැගිලි නවීකරණය සඳහා වෙන් කළ ප්‍රතිපාදන උපයෝජනය නොවීම, සහ ඇස්තමේන්තු වටිනාකමට වඩා අඩු වටිනාකමකට ක්‍රොන්ත්‍රාත් ප්‍රදානයන් සිදු කිරීම, ලිපි ද්‍රව්‍ය භාවිතය අවම විම හා තැපැල් වියදම් අවම වීම,2024 වර්ෂයේ දිරි දීමනා ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීමට සිදු වීම හා මුදල් අමාත්‍යාංශය විසින් වියදම් සීමා කිරීම වැනි හේතු නිසා මූලධන වැය විෂයයන් **6**ක් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබීම හා ඉතිරිය ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 99 දක්වා පරාසයක පිහිටා ඇති බව	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කිරීම කළමනාකරණය කළ යුතු බව.

3.3.3	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයන්හි ගොඩනැගිලි හා ඉදිකිරීම් කටයුතු සඳහා (වැය විෂයය 2001(033) හා 2001(034)) රු, 80,000,000 ක ප්‍රතිපාදනයන් සලසා ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ඉදිකිරීම් කටයුතු/ නවීකරණ කටයුතු සඳහා ඉංජිනේරුවරයකුගේ සේවය ලබා ගැනීමට නොහැකිවීම මත එම ප්‍රතිපාදනවලින් සියයට 91 ක ප්‍රතිශතයක් උපයෝජනය නොවී පැවතුණි.	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයන්හි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබාගත නොහැකි විමෙන් ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබීම හා සියයට 91 ප්‍රතිපාදන ඉතිරි වු අතර ඉදිරියේදී ඉංජිනේරුවරයෙකු අනුයුක්ත කර ගෙන අවශ්‍ය ඉදිකිරීම්/නවීකරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන බව.	ඉංජිනේරුවරයකුගේ සේවය කඩිනමින් ලබා ගත යුතු අතර ප්‍රතිපාදන උපයෝජනය කළමනාකරණය කළ යුතු බව
3.3.4	වැය ශීර්ෂ 246 යටතේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 9,984,108,000 ක් වූ අතර, ඉන් රු.1,965,161,431 ක් ඉතිරිවීම් නිරීක්ෂණය වූ අතර, එය සමස්ථ ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 20 ක් විය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 යටතේ අතිකාල, විදේශීය දීමනාව , ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම හා තොග පවත්වාගෙන යාම සීමා කිරීම, දුම්රිය බලපත්‍ර ඉල්ලුම් කිරීම අඩු වීම, ඉන්ධන භාවිතය අවම වීම, නිලධාරී පුරප්පාඩු පැවතීම, පුවත්පත් නිවේදන පල කිරීම සඳහා ප්‍රතිපාදන අවම කිරීම, වැඩසටහන් මාර්ගගත ක්‍රමයට සිදු කිරීම,දේශීය පුහුණු වැඩසටහන් සීමා කිරීම.,රක්ෂණ ගිවිසුම් බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම, රජයේ සේවකයන් සඳහා දේපළ ණය අලුතින් ලබා දීම නතර කිරීම සහ සහ ගොඩනැගිලි නවීකරණය සඳහා වෙන් කළ ප්‍රතිපාදන උපයෝජනය නොවීම සහ ඇස්තමේන්තු වටිනාකමට වඩා අඩු වටිනාකමකට කොන්ත්‍රාත් ප්‍රදානයන් සිදු කිරීම, ලිපි ද්‍රව්‍ය භාවිතය අවම විම හා තැපැල් වියදම් අවම වීම නිසා ප්රතිපාදන ඉතිරි වී ඇති බව.	චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කළමනාකරණය කලයුතු බව.
3.3.5	1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා වැය විෂයයට අදාළව මු.රෙ.66 හා පරිපූරක ඇස්තමේන්තු යටතේ රු.66,000,000 ක අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, රු.103,112,129 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීමෙන් අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා ඇති ව්‍යවස්ථාපිත	වයසස අවුරුදු 18 ට වැඩි පුද්ගලයින් සඳහා බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක සහ ඊට අදාළ සහතික නිකුත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අතිරේක ප්‍රතිපාදන ඉල්ලීම් කරන ලද නමුත් 2024 ජූලි 24 දින සිට Bulk Registration යටතේ ලියාපදිංචි කිරීමට අදාළ TIN සහතික තැපැල් මඟින් යැවීම	අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමේදී ඒ සඳහා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, ඒවා උපයෝජනය කළමනාකරණය කලයුතුය.

	පහසුකම් නිවැරදිව භාවිතා කර නොමැති බවත් එය ප්‍රතිපාදන කළමනාකරණයේ දුර්වලතාවක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.	නතර කිරීම මත ඒ සඳහාම ලිපි ද්‍රව්‍ය හා ටෝනර් මිලදී ගැනීමත්, ලිපි කවර මුද්‍රණය කිරීමත් සිදු නොකරන ලද බවත් ඒ සඳහා ඇස්තමේන්තුගත කළ රු.මිලියන 75 කට ආසන්න ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී ඇති බව.	
3.3.6	වැය ශීර්ෂ 246 යටතේ මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පරීක්ෂා කිරීමේදී වැය විෂයයන් 12 කට අදාළව එකතුව රු. 768,306,000 ක් වූ සියයට 20 සිට සියයට 252 දක්වා පරාසයක විචලතාවක් නිරීක්ෂණය විය.	මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පරීක්ෂා කිරීමේදී වැය විෂයයන් 12කට අදාළව සියයට 20 සිට සියයට 252 දක්වා පරාසයන්ට හේතුන් මූල්‍ය ප්‍රකාශන 2024 හි ඒසීඒ-2(iii) යටතේ දක්වා ඇති බව.	වියදම් ඇස්තමේන්තුව වඩාත් නිවැරදි ආකාරයෙන් සකස් කළ යුතුය

3.4. බැරකම් හා බැඳීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
3.4.1	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් නව CIGAS වෙබ් යෙදුම මගින් ද ජනනය කරන ලද සමුච්චිත බැඳීම් හා බැරකම් වාර්තාව අනුව 2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ප්‍රමාණය රු. 87,378,394 ක් වූ අතර එදිනට බැරකම් ශේෂය රු.1,559,039 කින් අඩුවෙන් දක්වා තිබුණි.	බැඳීම් හා බැරකම් වාර්තාව අනුව රු.87,378,394ක බැරකම් වටිනාකමක් සටහන් වී තිබුණු අතර එම වාර්තාව තුළ ඇතුළත් බැරකම් අතිකාල (2024) වෙනුවෙන් ගෙවීම් අයිතම 14 කට අදාළ එකතු වටිනාකම වූ රු. 1,665,857ක ගෙවීම් කිරීම සම්බන්ධ වටිනාකම හා බැරකම් අංකය ද ඇතුළත් ව විස්තර සටහන් කර ඇති බව.	බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය.
3.4.2	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් සමුච්චිත බැඳීම් හා බැරකම් වාර්තාව අනුව 2024 දෙසැම්බර් 31 දිනට වූ ගෙවීම් අයිතම තුනකට අදාළ එකතු වටිනාකම වූ රු. 781,703 ක් බැරකම් ලෙස හඳුනාගත යුතු වටිනාකමට වඩා වැඩියෙන් දක්වා තිබූ අතර ගෙවීම් අයිතමයකට අදාළ එකතු වටිනාකම වූ රු. 1,000,000 ක් බැරකම් ලෙස හඳුනාගත යුතු වටිනාකමට වඩා අඩුවෙන් සටහන් කර තිබුණි.	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ 2024 දෙසැම්බර් 31 දිනට බැරකම් වශයෙන් වැරදි ලෙස හඳුනාගත් ශේෂ ඇතුළත් වීමෙන් දළ වශයෙන් රු.72,176 ක වටිනාකම වැඩියෙන් සටහන් වී ඇති අතර ඒ අනුව ගෙවීම් අයිතම 07කට අදාළ ව බැරකම් ලෙස හඳුනාගෙන ඇති වටිනාකම වූ රු.7,486,969ක් හා බැරකම් ලෙස හඳුනාගත යුතු වටිනාකම වූ රු.7,394,792ක් වෙන් වෙන්ව හඳුනාගත හැකි බව.	බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වේ.

3.4.3	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සමුච්චිත බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් ශේෂයන්වලින් 2025 පෙබරවාරි 28 දින වන විටත් නොපියවූ බැඳීම් හා බැරකම් ප්‍රමාණය රු.18,313,110 වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 21 ක් විය.	පිළිතුරු සපයන අවස්ථාව වන විට 2024 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් වූ රු.9,350 වන මූ.රෙ. අනුමැතිය ලැබෙන තුරු රඳවාගත් ගමන් වියදම් කිහිපයක් හැරුණු විට අනෙකුත් ලැබුණු සියලු වවුචර් සඳහා ගෙවීම් සිදු කර ඇති බවත් විගණනයේදී හඳුනාගෙන තිබූ 2025 පෙබරවාරි 28 දින වන විටත් රු.19,669,126ක නොපියවූ බැඳීම් හා බැරකම් අතරින් 2025 පෙබරවාරි මස වන විට ගෙවා අවසන් කර තිබූ විගණනයට ඉදිරිපත් කරන ලද ලේඛනයේ ගෙවීම් අයිතම 45කට අදාළ එකතු වටිනාකම වූ රු.19,920,533ක ගෙවීම් සඳහා සටහන් කර නොමැති බව.	නොපියවූ බැරකම් කඩිනමින් පියවා අවසන් කළයුතු බව.
3.4.4	දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශනයන්හි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය පිළියෙල කිරීමේදී 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/2017 අනුව මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව බැරකම් වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය පිළියෙල කර ඇති අතර 2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් වටිනාකම රු.209,965,918 ක් විය. කෙසේ වුවද මු.රෙ.94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වූ පිරිවැය ඇස්තමේන්තුවට ඇතුළත් සේවා ගිවිසුම්වල මෙම වසරේ ආරම්භ කරනු ලබන කොන්ත්‍රාත්තුව ඊළඟ වර්ෂයේදී ක්‍රියාත්මක වන විට, එම සේවා ගිවිසුම්වල ඊළඟ වර්ෂයට අදාළ කාල සීමාව සඳහා වූ ගාස්තු බැඳීම් වශයෙන් සඳහන් කර ඇති බව හා මෙහිදී එම බැඳීම් වටිනාකම පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා ගොස් ඇති බව.	බැඳීම් හා බැරකම් වලට අදාළ මුළු පිරිවැය ඇස්තමේන්තුව වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
3.4.5	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු 246-01-01-1303 වැය විෂයයට අදාළව මු.රෙ.94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව රු.10,321,000 ක් වූ අතර එදිනට බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් වටිනාකම අනුව ශේෂය රු.43,352,396 ක් වූයෙන් වර්ෂය තුළදී එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව ඉක්මවා රු.33,031,396 ක් වූ බැරකම් සඳහා එළඹ තිබුණි.	2023 වර්ෂයයේ වියදම එවිට අත්සන් කර තිබූ ගිවිසුමට අනුව සලකා බලා 2024 ඇස්තමේන්තුව සඳහා නඩත්තු වියදම ඇතුළත් කළ ද, 2024 වර්ෂයේ අනපේක්ෂිත පරිදි නඩත්තු වියදම් වැඩි වීම මත ඊට අදාළ ගිවිසුමට එළඹීමේදී වියදම ද වැඩි වූ බවත් නඩත්තු වියදම් පුරෝකථනය කළ වියදමට වඩා වැඩිවීම මත 2024 වර්ෂයේ ගිවිසුම්ගත බැඳීම් වැඩි වීමෙන් එම තත්ත්වය ඇති වූ බවත්. 2024 වර්ෂයට අදාළව බැරකම්වල එකතුව ඇස්තමේන්තුගත වියදම ඉක්මවා නොමැති බවත් ඉදිරියේදී එය නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත්.	මුදල් රෙගුලාසි ප්‍රකාරව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව නොඉක්මවිය යුතුය.

3.5. **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
3.5.1	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.3 ඡේදය සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා කාලීනව ඉටු කර නොතිබුණි.	2024 වාර්ෂික කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 සඳහන් ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් නොවූ බවත්, ඉදිරියේදී එසේ නොවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බවත් 2020 අගෝස්තු 28 දිනැති 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025 වර්ෂය සඳහා නිවැරදි ආකෘතිය අනුව ඉදිරිපත් කරන ලද බව.	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම හා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිම කාලීනව ඉටු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් වගබලාගත යුතුය.

3.6. **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
3.6.1	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.7 වගන්තිය	රු. 141,069	ණය මුදල දෙන ලද මාසයේ සිට ණය ආපසු අයකර ගැනීම සිදු කල යුතු අතර ණය මුදල ගෙවන දිනයේ සිට නියමිත ප්‍රමාණයට පොලිය අය කර ගත යුතු වුවත් වැටුප් අංක 5204 හිමි නිලධාරියා ලබා ගත් ආපදා ණය ශේෂයෙන් අයවිය යුතු ණය ශේෂ	රු.141,069ක ණය ශේෂය වසර ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොමැති බව.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කරමින් අදාල ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතු බව

			වර්ෂ කිහිපයක සිට මේ වන තෙක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.		
3.6.2	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය	රු.414,014	ලබා ගත් ණය සම්පූර්ණයෙන් අය කර ගැනීමට පෙර නිලධාරියෙකු මිය ගිය හොත් , ඔහුගෙන් රජයට අය විය යුතුව තිබෙන සියළුම මුදල් ,ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිත ඕනෑම මුදලකින් අඩු කර ගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු බව දක්වා ඇතත් මිය ගිය නිලධාරින් දෙදෙනෙකු වෙතින් අය කර ගත යුතු පිළිවෙලින් වසර 10 - 20 අතර හා වසර 01- 03 වූ මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ ණය ශේෂ පැවතීම.	රු.222,500ක මුදල මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමටද, රු.191,514ක මුදල අග්‍රහාර රක්ෂණ වෙතින් අයකර ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කර ඇති බව.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කරමින් අදාල ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතු බව
3.6.3	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.2 , 4.2.4, 4.2.5, 4.5, 4.6, සහ 6.3 වගන්ති	රු. 146,380	විශ්‍රාම ගිය නිලධාරියකු වෙතින් අය කර ගත යුතු වසර 03 - 05 අතර වූ ණය ශේෂ මෙතෙක් නිරවුල් වී නොතිබුණි.	රු.146,380ක මුදල අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කරමින් අදාල ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතු බව
		රු.126,291	2024 වර්ෂයේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුම සැසඳීම් ප්‍රකාශය අනුව වැටුප් අංක 8093 හිමි නිලධාරිනියගේ සේවය අවසන් කර වසර 05 කාලයක් ගත වී ඇතත් ණය ශේෂය , මෙතෙක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	රු.126,291ක මුදල ඇපකරුගෙන් මාසිකව රු.2200ක වාරික බැගින් අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කරමින් අදාල ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතු බව

3.6.4	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති	රු.1,836,557	තනතුර හැර ගිය නිලධාරීන්ගේ අදාළ ණය ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතු වුවත් තනතුර හැර ගිය නිලධාරින් 12 දෙනකු වෙතින් අය කර ගත යුතු වර්ෂ 01 සිට 20 දක්වා කාල පරාසයක පවතින ණය ශේෂ නිරවුල් වී නොතිබුණි.	නිලධාරින් හතර දෙනෙකුගෙන් අයවිය යුතු රු.757,142ක මුදල අයකර ගැනීමට අදාළ නිති කටයුතු සිදු කරමින් පවතින අතර, නිලධාරින් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.640,245ක මුදල ඇපකරුවන්ගෙන් හා ඉතිරි නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.439,170ක මුදල එම නිලධාරින්ගේ ඉල්ලීම මත නැවත සේවයේ පිහිටුවීමට සලකා බැලීම මගින් ද අයකර ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බව.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කරමින් අදාල ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතු බව
		රු.545,715	2024 වර්ෂයේ තනතුර හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් නොවී පැවති අතර එය මාස 03 සිට 06 දක්වා කාල පරාසයක පැවත තිබුණි.	නිලධාරින් හතරදෙනෙකුගෙන් අයවිය යුතු රු.545,715ක මුදල අයකර ගැනීම සම්බන්ධව එම නිලධාරින් දැනුවත් කිරීම මගින් අදාළ කටයුතු සිදුකරමින් පවතින බව.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කරමින් අදාල ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතු බව
3.6.5	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මු.රෙ.104 මු.රෙ. 104 (3) හා 104 (4)		කුරුණෑගල ආපදා හා දත්ත ප්‍රතිසාධන මධ්‍යස්ථානය තුළ 2022 වර්ෂයේ ජුලි 24 දින සිදු වූ හදිසි ගිනි ගැනීමක් හේතුවෙන් හානි සිදු වූ යූපීඑස් (UPS) යන්ත්‍රයක අලාභයේ වටිනාකම ආසන්න වශයෙන් හානි වූ යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදී ගැනීමේ වර්තමාන වටිනාකම වූ	UPS උපකරණය ගිනි ගැනීම හේතුවෙන් හානි වීම පිළිබඳව මු.රෙ.104 (3) යටතේ මූලික පරීක්ෂණ වාර්තාව 2022 නොවැම්බර් 24 දින ඉදිරිපත් කර ඇති අතර, සිදුව ඇති අලාභය සම්බන්ධයෙන් මු.රෙ.104(4)	මුදල් රෙගුලාසි ප්‍රකාරව කාලීනව පරීක්ෂණ පවත්වා වාර්තා පිටපත් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය

		රුපියල් මිලියන 10 ක් පමණ බව හඳුනාගෙන තිබූ මූලික විමර්ශනය සිදුකර මේ වන විට වර්ෂ 02 ක කාලයක් ඉක්මවා පැවතිය ද අදාළ සිදුවීමට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව අවසන් පරීක්ෂණ පවත්වා වාර්තා පිටපත් විගණනය වෙත මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රකාරව අවසන් පරීක්ෂණය සිදු කිරීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බව.	
3.6.6	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (අ)	වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීන කර පවත්වාගත යුතු වුවද දෙපාර්තමේන්තුව වාර්ෂික බලපත්‍ර ලබාගැනීම සම්බන්ධ තොරතුරු, ආවුද හා උපකරණ පිළිබඳව තොරතුරු හා සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ වාහන අනතුරු 14 ක් පිළිබඳව තොරතුරු ලොග් පොත්වල සටහන්කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට සියලුම වාහන සඳහා වාර්ෂික බලපත්‍ර ලබාගැනීමේ තොරතුරු හා අනෙකුත් සියලුම තොරතුරු වාහන ලොග් සටහන් පොත්හි ඇතුළත් කර යාවත්කාලීන කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදුවූ වාහන අනතුරු පිළිබඳව තොරතුරු ලොග් පොත්වල සටහන් කළ යුතුය.
3.6.7	2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 03 වගන්තිය	ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබීම හේතුවෙන් ඉන්ධන කාර්යක්ෂමතාවය පිළිබඳව මිනුම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.	මේ වනවිට දෙපාර්තමේන්තුව සතු වාහනවලින් වෑන් රථ 3 ක් හා කාර් රථ 03 ක් නියැදියක් ලෙස ලබාගෙන ඉන්ධන පරීක්ෂාවට භාජනය කරන ලද බව හා ඉදිරි මාස කිහිපය තුළ සියලු පරීක්ෂා සිදුකර වාර්තා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගනිමින් පවතින බව.	අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් ස්ථාපිත කළ යුතුය

3.6.8	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 2.3 ඡේදය හා සබැඳි ප්‍රසම්පාදන අත්පොත	දෙපාර්තමේන්තුව තුළ ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් පිහිටුවා ගණන්දීමේ නිලධාරී යටතේ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු පත්කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව තුළ ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් පිහිටුවා ගණන්දීමේ නිලධාරී යටතේ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු පත්කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකිරීම අවසන් අදියරේ පවතින බව	ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් පිහිටුවා ගණන්දීමේ නිලධාරී යටතේ ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු පත්කළ යුතු ය.

3.7. බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
3.7.1	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක CGIR/2019/03 – (Ins. & Cir) හා 2019 ජූලි 09 දිනැති චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව වැට් බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තා සක්‍රීය බදු ගෙවන්නෙකු ද යන්න තහවුරු කර ගැනීමකින් තොරව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කල අගය මත බදු මුදල් රැස් කිරීම අක්‍රීය කළ බදුකරුවෙකු 2024 වර්ෂය තුලදී රු.8,955,360 ක එකතු කල අගය මත බදු මුදලක් අමාත්‍යාංශයකින් රැස්කර තිබුණි. එම බදුකරු විසින් 2024 වර්ෂය සඳහා බදු වාර්තා ඉදිරිපත් කිරීම හෝ එසේ රැස්කරන ලද බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම හෝ සිදු කර නොතිබුණි.	ගොනුව පරීක්ෂාවේදී එම ගොනුව එකතු කළ අගය මත බද්ද සඳහා අක්‍රීය බව අනාවරණය විමෙන් පසු 2024 මැයි 01 දින සිට VAT සඳහා සක්‍රීය කිරීමට කටයුතු කරන ලද බවත් බදු බැදියාව රු.15,691,695ක් ලෙස හඳුනාගත් බවත් ඒ මත පදනම්ව ඉදිරියේදී තක්සේරු දැන්වීම් නිකුත් කරනු ලබන බවත්.	පනතේ වගන්ති ප්‍රකාරව VAT බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
3.7.2	TIN අංකය 40923xxxx යටතේ 2024 ජනවාරි 01 දින සිට ආදායම් බදු සඳහා ලියාපදිංචි වී තිබු ආයතනයක මූල්‍ය ප්‍රකාශන අනුව 2022 හා 2023 වර්ෂ සඳහා	මෙම ආයතනයේ බදු බැදියාව පරීක්ෂා කිරීම සඳහා පසුගිය වසර 05ක මූල්‍ය ප්‍රකාශනයන් ලබා ගෙන ආයතනය නියැලී ඇති විවිධ ආර්ථික කටයුතු සහ එමඟින් උද්ගත	අදාළ වන බදු පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කරමින් බදුකරු ලබාදී ඇති වාර්තා කාලීනව විගණනයට ලක් කර නිවැරදි බදු ආදායම්

ළඟාකරගත් අතිරික්තයන්හී පිළිවෙලින් රු.100,050,669ක සහ රු.130,421,483ක වටිනාකමක් සහිත ආයෝජන ආදායම් ඇතුළත් වී තිබූ බැවින් එයට අදාළව දල වශයෙන් ආයෝජන ආදායම මත 2022 වර්ෂය සඳහා රු.30,015,201ක සහ 2023 වර්ෂය සඳහා රු.39,126,445ක බදු බැඳියාවක් පැවතිය හැකි නමුත් විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 20 වන දිනටත් ආයතනය විසින් කිසිදු ආදායම් වාර්තාවක් ගොනුකර නොතිබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ද එම ආයතනයේ කිසිදු බදු බැඳියාවක් හඳුනාගෙන බදු අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.	වී ඇති ආදායම් හා වියදම් සම්බන්ධයෙන් මේ වන විට බදු නීති මූලධර්මයන්ට අනුව අධ්‍යයනය කරමින් පවතින බව.	අය කර ගැනීමට කටයුතු කළ යුතු බව.

3.8. **බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
3.8.1	2024 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 1,428,770 ක වටිනාකමකින් යුතු චෙක්පත් 65ක් විගණිත දිනය වූ 2025 පෙබරවාරි 28 දිනට ද ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	චෙක්පත් දින දීර්ඝ කර ගෙවීම සඳහා කටයුතු කරමින් පවතින බව.	නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
3.8.2	2024 සඳහා වූ නව ගිණුම් අංක 7041576 දරන ගිණුම විවෘත කිරීම සඳහා TOD/BA/01 ආකෘතිය සමඟ අමුණා ඇති බැංකු ගිණුම් 45 ක් සඳහන් ලේඛනය හා සැසඳීමේ දී ,2024 වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තු සංචාරක වැට් බදු ආපසු ගෙවීම් සඳහා වූ ලංකා බැංකු ගිණුම් අංක 7041586 සක්‍රීය මට්ටමේ නොපැවතුණි.	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් ගිණුම (7041586) දැනට ක්‍රියාත්මක නොවුණ ද, නැවත එම බදු ආපසු ගෙවීම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වෙන අතර මෙතෙක් තීරණයක් ලබා දී නැති බව.	ක්‍රියාත්මක නොවන මට්ටමේ ගිණුම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.8.3	දේශීය ආදායම් දෙපාර්තමේන්තු ජෝෂ්ඨ පුරවැසි ආදායම් බදු ආපසු ගෙවීම් ගිණුම සඳහා වූ ගොනුව පරීක්ෂා කිරීමේදී ගිණුම් අංක 7039828 දරන ගිණුම වසා දැමීමට අදාළ TOD/BA/03 ආකෘතිය මඟින් ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි.	ගිණුම් අංක 7039828 දරන ගිණුම වසා දැමීමට අදාළව TOD/BA/03 ආකෘතිය සහ අනෙකුත් ලියවිලි බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව.	නියමිත ආකෘතිවලට අනුකූලව ගිණුම් වසා දැම්මට කටයුතු කළ යුතුය

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1. **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

4.1.1. **2023 දෙසැම්බර් 31 දිනට හා 2024 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ ශේෂ පරීක්ෂාව**

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	අවිනිශ්චිත ගිණුමේ සමස්ථ ශේෂයෙන් ආසන්නව සියයට 47 ක් එනම් රු.1,908,594,350 ක අගයක් නිවැරදි TIN අංකයක් හඳුනාගත නොහැකි ශේෂයන්ගෙන් ද ආසන්නව සියයට 48 ක් එනම් රු. 1,954,300,021 ක අගයක් TIN අංක 99999xxxx යටතේ වූ ශේෂයන්ගෙන් ද සමන්විත වන බැවින් සමස්ථයක් ලෙස ආසන්නව සියයට 95 ක විශාල අගයක් නිරූපණය වන මෙම හේතුන් සඳහා කාලීනව විසඳීමේ ක්‍රියාමාර්ග ගත යුතුව ඇති බව නිරීක්ෂණය කෙරේ. තවද RAMIS පරිගණක පද්ධතියට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ සමස්ථ ශේෂයෙන් ආසන්නව සියයට 57 ක ප්‍රතිශතයක් එනම් රු. 2,235,886,581 ක අගයක් සාංගමික ආදායම් බදු (CIT) විය.	අවිනිශ්චිත ගිණුමේ පවතින ශේෂයන් අවම කර ගැනීම සඳහා අදාළ අංශයන් දැනුවත් කරමින් පවතින අතර, ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවතින බව.	අවිනිශ්චිත ශේෂය නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට අවශ්‍ය පියවර යුතුය.

(ආ)	අවිනිශ්චිත ගිණුමේ වාර්ෂික ආරම්භක ශේෂයට පිළිවෙලින් 2023 වසර තුළදී රු.4,055,449,038 ක් ද 2024 වසර තුළදී රු. 2,545,318,436 ක් ද අලුතින් එකතු වී තිබුණි. ඒ අනුව වසරක් තුළදී නැවත අවිනිශ්චිත ගිණුමේ ශේෂයට සැලකිය යුතු නිරවුල් නොවූ ශේෂයන් එකතු වී ඇති බව පසුගිය වර්ෂ කීපයකදී අනාවරණය කර ඇතත් එම තත්ත්වය නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා කාර්යක්ෂමව ක්‍රියාමාර්ගයන් ස්ථාපිත කිරීමට අපොහොසත් වී ඇති බව විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය කෙරේ.	අවිනිශ්චිත ගිණුමේ පවතින ශේෂයන් අවම කර ගැනීම සඳහා අදාළ අංශයන් දැනුවත් කරමින් පවතින අතර, ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවතින බව.	අවිනිශ්චිත ගිණුමේ අගය වැඩිවීමට හේතු සොයා බලා එය නිරවුල් කළ යුතුය.
(ඇ)	2023 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ සමස්ථ ශේෂයෙන් ආසන්නව සියයට 61 ක් එනම් රු, 3,384,621,926 ක් ද 2024 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ සමස්ථ ශේෂයෙන් ආසන්නව සියයට 59 ක් එනම් රු, 2,397,192,549 ද 2020 හා 2021 යන වසරවලට අදාළ ශේෂයන් බව තවදුරටත් නිරීක්ෂණය වේ.	2020 හා 2021 වර්ෂවල Covid තත්ත්වය පැවති කාලය තුළ මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සිදු කළ ගෙවීම් නිවැරදිව සිදු නොවීම මත එම ගෙවීම් ද අවිනිශ්චිත ගිණුමට බැර වී ඇති අතර එම වර්ෂවලට අදාළව අවිනිශ්චිත ගිණුමේ පවතින ශේෂයන් අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවතින බව.	අවිනිශ්චිත ශේෂය නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ඈ)	RAMIS පද්ධතියේ view account financials හා search payment යන එකිනෙක විකල්ප ප්‍රවේශයන් යටතේ පෙන්නුම් කරනු ලබන දත්තයන් හී පරස්පරතාවක් ඇති අගයන් නිරීක්ෂණය වීම මත විගණනය වෙත ලබා දී ඇති අවිනිශ්චිත ගිණුමේ ශේෂය වූ රු.4,067,209,501ක ශේෂය නිවැරදි ශේෂය ද යන්න ගැටළු සහගත වන අතර එම ප්‍රමාණය 2015 වසර සඳහා සැලකූ විට රු. 21,533,091 ක අගයකින් වැඩි විය යුතු බව නිරීක්ෂණය කෙරේ.	පිළිතුරු ලබා දී නොමැත.	RAMIS පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය.

4.1.2. **2016 ජනවාරි 01 සිට 2024 ජුනි 30 දක්වා කාල පරාසය තුළ 2024 ජූලි 30 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතියෙහි විවෘතව පවතින වැඩ අයිතමවල (Open Work Items) ප්‍රගතිය පරීක්ෂා කිරීම.**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 ජනවාරි 01 සිට 2024 ජුනි 30 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව RAMIS පද්ධතිය තුළ විවෘතව පවතින වැඩ අයිතම (Open Work Items) ප්‍රමාණය 1,217,161ක් වූ අතර එම ප්‍රමාණය 2025 ජනවාරි 28 දින වන විට වැඩ අයිතම (Open Work Items) 512,775ක් වී තිබිණ. ඒ තුළ RAMIS පද්ධතිය ආරම්භ වූ වර්ෂය එනම් 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ නිර්මාණය වී ඇති සහ තවදුරටත් විවෘතව වැඩ අයිතම 4,611ක් ද පවතින බව නිරීක්ෂණය විය .	ඒ ඒ බදු වර්ග අනුව විවෘත වැඩ අයිතම 1,217,161ක සංඛ්‍යාව, 512,775ක් දක්වා අඩු වී ඇති බව	පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට , හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගැනීමට සෘජුවම බලපාන බැවින් ඊට අදාළ වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ආ)	2025 ජනවාරි 28 දිනට RAMIS පද්ධතිය තුළ වැඩිම විවෘත වැඩ අයිතම සංඛ්‍යාවක් පිළිවෙලින් CIT, VAT හා IIT වන බදු වර්ග සඳහා වන අතර එහි අගයන් පිළිවෙලින් 56,399ක්, 210,460ක් හා 162,833ක් විය .	CIT, VAT හා IIT බදු වර්ග සඳහා විවෘත වැඩ අයිතම සංඛ්‍යාව පිළිවෙලින් 56,399ක්, 210,460ක් හා 162,833ක් ලෙස අඩු වී ඇති බව	පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට , හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගැනීමට සෘජුවම බලපාන බැවින් ඊට අදාළ වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	උක්ත කාල පරිච්ඡේදය සඳහා විවෘතව පවතින වැඩ අයිතම (Open Work Items) අතරින් දහසට(1000) වැඩි වැඩ අයිතම ප්‍රමාණයක් පවතින 'වැඩ අයිතම නාම' (Work Item Type) 30 කට විවෘත වැඩ අයිතම 1,205,196 ක් පවතින බව විගණන විමසුමෙන් පෙන්වා දුන් අතර එම අගය 2025 ජනවාරි 28 දිනට 505,931 ක් වී තිබිණ. එහි පැවති වැඩ අයිතම නාම යටතේ WI_acknowledgement_of_sa_returns, WI_Verify_Content_of_RTN_DOC,WI_CM_Assign_Case_T	2024.06.30 දිනට විවෘතව පවතින වැඩ අයිතම (Open Work Items) අතරින් දහසට(1000) වැඩි වැඩ අයිතම ප්‍රමාණයක් පවතින 'වැඩ අයිතම නාම'(Work Item Type) 30 කට විවෘත වැඩ අයිතම සංඛ්‍යාව 505,931ක් දක්වා අඩු වී ඇත. එසේම WI_acknowledgement_of_sa_returns හා WI_Return_Review_by_PTA සඳහා විවෘත වැඩ අයිතම පිළිවෙලින් 36,173ක් හා 95,260ක් දක්වා අඩු වී ඇති බව	පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට , හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගැනීමට සෘජුවම බලපාන බැවින් ඊට අදාළ වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.

	D,WI_Return_Review_by_PTA සඳහා විවෘත වැඩ අයිතම පිළිවෙලින් 36,173ක්, 99,422ක්, 126,458ක් හා 95,260ක් පවතින බව නිරීක්ෂණය විය.		
(ඇ)	wi_acknowledgement_of_sa_returns වැඩ අයිතමය සෘජුවම 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 132 වගන්තිය යටතේ බදු ගෙවන්නෙකු විසින් ස්වයං තක්සේරු වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති දිනය තීරණය කිරීමට අදාළ වන අතර, WI_Return_Review_by_PTA වැඩ අයිතමය යටතේ, ලබා දී ඇති වාර්තාවන්හි පවතින බදු වගකීම / ආපසු ගෙවීම බදුකරුගේ ගිණුමට වාර්තා වීම හා වාර්තා සම්බන්ධයෙන් පවතින සියලු ඉදිරි කටයුතු සඳහා සම්බන්ධ වී පවතින අතර එම වැඩ අයිතම හිඟ බදු වාර්තාවෙහි යාවත්කාලීන හිඟ බදු අගයන් පවත්වා ගැනීම සඳහා ද බලපෑමක් ඇති කරන බැවින් එම වැඩ අයිතම සඳහා කාලීනව ක්‍රියාකර නොමැති බව නිරීක්ෂණය කෙරේ.	පිළිතුරු ලබා දී නොමැත.	පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට , හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගැනීමට සෘජුවම බලපාන බැවින් ඊට අදාළ වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ඉ)	උක්ත විවෘතව පවතින වැඩ අයිතම (Open Work Items) අතරින් පන්දහසට (5,000) වැඩි වැඩ අයිතම ප්‍රමාණයක් සහිත නිලධාරීන් 10 දෙනෙකුට අදාළව 43,004 ක වැඩ අයිතම ප්‍රමාණයක් 2025 ජනවාරි 28 දිනටත් අවසන් නොකර විවෘතව පැවතුණි.	විවෘතව පවතින වැඩ අයිතම (Open Work Items) අතරින් පන්දහසට (5,000) වැඩි වැඩ අයිතම ප්‍රමාණයක් සහිත නිලධාරීන් 10 දෙනෙකුට අදාළව පැවති විවෘත වැඩ අයිතම සංඛ්‍යාව 109,798 සිට 43,004ක් දක්වා අඩු වී ඇති බව	පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට , හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගැනීමට සෘජුවම බලපාන බැවින් ඊට අදාළ වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ඊ)	විවෘතව පවතින වැඩ අයිතම (Open Work Items) අතරින් සියයට වැඩි වැඩ අයිතම ප්‍රමාණයක් පවතින TIN අංක 129 ක් සඳහා වැඩ අයිතම 13,473 ක් පැවති අතර ඒ අතරින් TIN අංකයක් අදාළ නොවන N/A	විවෘතව පවතින වැඩ අයිතම (Open Work Items) අතරින් සියයට වැඩි වැඩ අයිතම ප්‍රමාණයක් පවතින TIN අංක 129 ක් සඳහා වන වැඩ අයිතම සංඛ්‍යාව 24,533 සිට 13,473ක් දක්වා ද, TIN අංක අදාළ නොවන N/A යටතේ වන විවෘත වැඩ අයිතම	පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීමට , හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගැනීමට සෘජුවම බලපාන බැවින් ඊට අදාළ වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය

	යටතේ වන විවෘත වැඩ අයිතම 4,552 ක් ද WI_Allocate_TIN_New 3,627 ක් ද විය.	සංඛ්‍යාව 8,755 සිට 4,552ක් දක්වා ද, වැඩිම වැඩ අයිතම සංඛ්‍යාව වූ WI_Allocate_TIN_New යටතේ වන විවෘත වැඩ අයිතම සංඛ්‍යාව 7,598 සිට 3,627ක් දක්වා ද අඩු වී ඇති බව	
(ඪ)	WI_pymt_payment_adjusted_to_suspense_acc වන වැඩ අයිතමයට අදාළව TIN අංකයක් සඳහන් නොවූ (Blank), වැඩ අයිතමය යටතේ විවෘත වැඩ අයිතම 38 ක් තවදුරටත් පැවතුණි. ගෙවන ලද බදු නිවැරදිව අදාළ TIN අංකයන්ට යොමු කිරීම මෙම වැඩ අයිතම අවසන් වීම මත රඳා පවතින බැවින්, අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් වීමට සෘජුව මෙම වැඩ අයිතමය බලපාන බවත් නිරීක්ෂණය කෙරේ.	TIN අංකයක් සඳහන් නොවූ (Blank) WI_pymt_payment_adjusted_to_suspense_acc යටතේ පැවති විවෘත වැඩ අයිතම 77, 38ක් දක්වා අඩු වී ඇති අතර TIN අංක හඳුනාගන්නා අවස්ථාවලදී ඒ ඒ වැඩ අයිතමවල කටයුතු අවසන් කරනු ලබන බව	විවෘතව පවතින මෙම වැඩ අයිතම කඩිනමින් නිරවුල් කළ යුතුය.
(ණ)	විගණනය විසින් සිදු කළ නියැදි පරීක්ෂණයකින් TIN අංක 11424xxxx යටතේ VAT සඳහා 2018,2019 හා 2021 වර්ෂවල බදු කාලසීමාවන් 15 කට අදාළව මුළු වටිනාකම රු. 35,498,990 වූ Import Credit Voucher Value සඳහා RAMIS පද්ධතියේ Tax Period Profile හි කිසිදු සටහනක් නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව ගෙවිය යුතු බදු වටිනාකම (Payable or Refund) හා බදු ගෙවීම් (Tax Credit) RAMIS පද්ධතියේ සටහන්ව නොතිබුණි. එසේ සම්පූර්ණ කිරීමටවත් වැඩ අයිතම පද්ධතිය තුළ නිර්මාණය කර නොතිබීම විගණනයට ගැටළු සහගත විය.	අදාළ ගොනුව සම්බන්ධව නඩු කටයුත්තක් පවතින බව දන්වන ලදී.	RAMIS පද්ධතියේ සටහන් නොමැති වීමට හේතු සොයා බලා නිවැරදි කිරීම කළ යුතුය.
(ත)	RAMIS පද්ධතිය තුළ 2016 ජනවාරි 01 සිට 2024 ජුනි 30 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පවත්නා නිම නොකළ වැඩ අයිතම පැවතීමට හේතු පහත පරිදි හඳුනාගත හැකි විය.		

(i)	RAMIS පද්ධතියේ පවත්නා තාක්ෂණික දෝෂ හේතුවෙන් WI_acknowledgement_of_sa_returns,WI_Verify_Content_of_RTN_DOC යන වැඩ අයිතම සඳහා වර්ෂ ගණනාවක සිට ක්‍රියාමාර්ග ගෙන ඇතත්, එම වැඩ අයිතම පද්ධතිය තුළ විවෘත පවතින වැඩ අයිතම ලෙස පෙන්වීම, RAMIS පද්ධතියෙන් වැඩ අයිතම නිම කිරීමේ පහසුකම් නොතිබීමේ දෝෂය මත වැරදි ලෙස උද්ගත වැඩ අයිතම පැවතීම, Appeal හෝ Appeal Query විසඳා අවසන් වන තුරු objection වසා දැමීමේ හැකියාවක් නොමැති වීම හා ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම, WI_CM_Assign_Case_TD වැඩ අයිතමය සම්බන්ධයෙන් බද්ද හා දඩය සම්පූර්ණයෙන් සමථයකට පත්වන තුරු හා නඩු පවරා ඇති බදු ගෙවන්නන්ට අදාළ හිඟ බදු සමථයකට පත්වන තුරු එය විවෘතව පැවතීම.	RAMIS පද්ධතියේ පවත්නා තාක්ෂණික දෝෂ පවතින බව සඳහන් කර තිබුණි.	හේතු හඳුනාගෙන RAMIS පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය.
(ii)	VAT/ SVAT බදු වාර්තා හා උපලේඛනවල පවතින ගැටළු, බදු ගෙවන්නා විසින් schedule වල පවතින ගැටළු විසඳා නොදීම, Refund request work item, හිඟ බදු සඳහා පවතින Work item සිදු කර අවසන් වන තෙක් අදාළ වැඩ අයිතම සිදු කිරීමට නොහැකි වීම.	VAT/ SVAT බදු වාර්තා හා උපලේඛනවල පවතින ගැටළු, බදු ගෙවන්නා විසින් schedule වල පවතින ගැටළු විසඳා නොදීම, Refund request work item, හිඟ බදු සඳහා පවතින Work item සිදු කර අවසන් වන තෙක් අදාළ වැඩ අයිතම සිදු කිරීමට නොහැකි බව සඳහන් කර තිබුණි.	වැඩ අයිතම කඩිනමින් සිදු කිරීමට ඇති ගැටළු සොයා බලා අවශ්‍ය පියවර ගැනීම.
(iii)	බදු ගෙවන්නාගේ ව්‍යාපාර ස්වභාවයට අදාළව තොරතුරු ඇතුළත් කිරීමට RAMIS පද්ධතිය තුළ පහසුකම් නොමැති වීම.	බදු ගෙවන්නාගේ ව්‍යාපාර ස්වභාවයට අදාළව තොරතුරු ඇතුළත් කිරීමට RAMIS පද්ධතිය තුළ පහසුකම් නොමැති බව සඳහන් කර තිබුණි.	බදු ගෙවන්නාගේ අදාළ තොරතුරු RAMIS පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.
(iv)	නව දේශීය ආදායම් පනතට 2018/2019 තක්සේරු වර්ෂයේ සිට PAYE හා WHT වැඩ අයිතම අවසන් කිරීම සම්බන්ධයෙන් මෙතෙක්	නව දේශීය ආදායම් පනතට 2018/2019 තක්සේරු වර්ෂයේ සිට PAYE හා WHT වැඩ අයිතම අවසන් කිරීම සම්බන්ධයෙන් මෙතෙක් මාර්ගෝපදේශ නිකුත් කර	PAYE හා WHT සඳහා කඩිනමින් මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය.

	මාර්ගෝපදේශ නිකුත් කර නොමැති වීමත් හේතුවෙන් ඊට අදාළ වැඩ අයිතම නිම කිරීමට නොහැකි බව.	නොමැති බව සඳහන් කර තිබුණි.	
(v)	TIN අංකය වැරදි ලෙස (Invalid TIN) සටහන් කිරීමෙන් නිවැරදි TIN අංකය හඳුනා ගැනීමට නොහැකි වීමත්, බදු වර්ගය සඳහා ලියාපදිංචි නොවී ගෙවීම සිදු කිරීමත්, TIN අංකය අවලංගු කර තිබීමත් හේතුවෙන් ඊට අදාළ වැඩ අයිතම නිම කිරීමට නොහැකි බව.	TIN අංකය වැරදි ලෙස (Invalid TIN) සටහන් කිරීමෙන් නිවැරදි TIN අංකය හඳුනා ගැනීමට නොහැකි වීමත්, බදු වර්ගය සඳහා ලියාපදිංචි නොවී ගෙවීම සිදු කිරීමත්, TIN අංකය අවලංගු කර තිබීමත් හේතුවෙන් ඊට අදාළ වැඩ අයිතම නිම කිරීමට නොහැකි බව සඳහන් කර තිබුණි.	ගැටළු කඩිනමින් විසඳා RAMIS පද්ධතිය සංවර්ධනය කිරීම කඩිනම් කළ යුතුය.
(vi)	සීමිත නිලධාරී පිරිසක් සිටීම, උපලේඛන සම්බන්ධ කටයුතු සඳහා විශාල කාලයක් වැය වීම.	සීමිත නිලධාරී පිරිසක් සිටින බවත්, උපලේඛන සම්බන්ධ කටයුතු සඳහා විශාල කාලයක් වැය වන බවත් සඳහන් කර තිබුණි.	අවශ්‍ය නිලධාරී බඳවා ගැනීමට කඩිනමින් කටයුතු කිරීම.

4.1.3. දේශීය ආදායම් දෙපාර්තමේන්තු දකුණ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ කාර්යසාධනය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2024 නොවැම්බර් දක්වා ශාඛාව විසින් 2018/19 තක්සේරු වර්ෂයේ සිට 2022/23 තක්සේරු වර්ෂය දක්වා CIT, IIT හා PIT සඳහා පොලී හා දඩ මුදල් ඇතුළත් මුළු හිඟ බදු මුදල වූ රු. 128,225,621 කට නිකුත් කර තිබූ අතිරේක තක්සේරු වාර්තා 83 න් විගණිත දිනය වූ 2024 දෙසැම්බර් 18 වන විටත් වාර්තා 68 ක දත්ත RAMIS පද්ධතියට උඩුගත කර නොමැති අතර එම වාර්තාවලට අදාළ වූ මුළු හිඟ බදු මුදල රු.100,634,822ක් විය.	අදාළ TIN අංක යටතේ අතිරේක තක්සේරු වාර්තා RAMIS පද්ධතියට උඩුගත කිරීමට නොහැකි වූ විවිධ හේතු බලපාන බව.	පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් සිදුකර අදාළ අතිරේක තක්සේරු වාර්තා දත්ත RAMIS පද්ධතියට කඩිනමින් උඩුගත කිරීමට පියවර ගත යුතුය.
(ආ)	යථෝක්ත අතිරේක තක්සේරු වාර්තා තවදුරටත් පරීක්ෂා කිරීමේ දී එම වාර්තා 68න් වාර්තා 26ක් සඳහා අතිරේක තක්සේරු වාර්තාව මෙන්ම 20/21, 21/22 හා 22/23 තක්සේරු වර්ෂයන්ට	2018/2019 තක්සේරු වර්ෂයේ සිට 2022/2023 තක්සේරු වර්ෂය දක්වා විගණනය කරන ලද ගොනුවලට අදාළ ආදායම් බදු වාර්තා RAMIS පද්ධතියට උඩුගත කර නොමැති බදු ගොනු හඳුනා ගනිමින්, ඒවා උඩුගත	පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් සිදුකර අදාළ අතිරේක තක්සේරු වාර්තා දත්ත RAMIS පද්ධතියට කඩිනමින් උඩුගත කිරීමට පියවර ගත යුතුය.

	අදාළ ස්වයං තක්සේරු වාර්තාවත් 2025 අප්‍රේල් 11 දින වන තෙක් RAMIS පද්ධතියට උඩුගත කර නොමැති අතර එම වාර්තාවලට අදාළ පොලී හා දඩ මුදල් ඇතුළත් මුළු හිඟ බදු මුදල රු. 30,229,197ක් විය. තවද RAMIS පද්ධතියේ දෝෂ පැවතිම හේතුවෙන් 2018/19 හා 2019/20 තක්සේරු වර්ෂ සඳහා නිකුත් කළ අතිරේක තක්සේරු වාර්තා 18කට අදාළ බදු බැඳියාව, RAMIS පද්ධතියෙහි ඇතුළත් වී නොතිබූ අතර ඊට අදාළ මුළු හිඟ බදු වටිනාකම රු. 25,208,635 ක් වී තිබිණ.	කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව.	
(ඇ)	2015/16 තක්සේරු වර්ෂයේ සිට 2022/23 තක්සේරු වර්ෂය දක්වා ප්‍රාදේශීය කාර්යාලයට අදාළව 1162 ක විමසුම් වැඩ අයිතම (Query) ප්‍රමාණයක් 2024 දෙසැම්බර් 18 විගණිත දිනය වන විට හා අභියාචනා වැඩ අයිතම (Appeal) 04 ක් 2025 පෙබරවාරි 05 වන දින විට විවෘතව පැවතුණි.	2015/16 තක්සේරු වර්ෂයේ සිට 2023/24 තක්සේරු වර්ෂය දක්වා කොළඹ දකුණ කාර්යාලයට අදාළව විමසුම් වැඩ අයිතම 1238න් 76ක් 2025 අප්‍රේල් 30 වන විට අවසන් කර ඇති බවත් අභියාචනා වැඩ අයිතම 21න් 04ක් පමණක් ඉතිරිව ඇති අතර ඉතිරි වැඩ අයිතම කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව.	පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම, හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගැනීම හා ඊට අදාළ වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	2024 පළමු අර්ධ වර්ෂයෙහි කාර්යසාධනයට අදාළව වැඩ අයිතම සම්බන්ධයෙන් විගණනයට ලද තොරතුරුවලට අනුව මුළු වැඩ අයිතම 81,040 ක් අතරින් වැඩ අයිතම 43,594 ක් 2024 දෙසැම්බර් මස වන විටත් විවෘතව පැවතිණ. 2025 ජනවාරි 06 දිනට RAMIS පද්ධතියෙන් ලබා ගත් දත්තයන්ට අනුව එක් එක් බදු වර්ගයන්ට අදාළව 37,047 ක් වැඩ අයිතම විවෘතව පවතින බව නිරීක්ෂණය විය.	2015/16 තක්සේරු වර්ෂයේ සිට 2023/24 තක්සේරු වර්ෂය දක්වා කොළඹ දකුණ කාර්යාලයට අදාළව විමසුම් වැඩ අයිතම 1238න් 76ක් 2025 අප්‍රේල් 30 වන විට අවසන් කර ඇති බවත් අභියාචනා වැඩ අයිතම 21න් 04ක් පමණක් ඉතිරිව ඇති අතර ඉතිරි වැඩ අයිතම කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව.	හිඟ බදු අයකර ගැනීම සඳහා වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීම.
(ඉ)	2024 ජූනි 30 දිනට හිඟ බදු වාර්තාව සකස් කිරීමේදී DTRU අංශයට අයත් හිඟ බදු සහ පොලී ඇතුළත්ව රු. 823,575,418 ක් වූ මුළු හිඟ බදු මුදලක් 2024 ජූනි 30	2024 ජූනි 30 දිනට C-49 සකස් කිරීමේදී රු.823,575,118ක DTRU අංශයට අයත් හිඟ බදු මුදලක් ඇති බවට හඳුනාගෙන 2024 ඔක්තෝම්බර් 01 දිනැති ලිපිය මඟින්	මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (2) (ඇ) ඡේදය ප්‍රකාරව හිඟ බදු වාර්තා නිවැරදිව පිළියෙල කර විගණකාධිපතිවරයා වෙත අදාළ දිනයන්ට පෙර ඉදිරිපත්

	හිඟ බදු වාර්තාව මඟින් කොළඹ දකුණ ප්‍රාදේශීය කාර්යාලය වෙත මාරු කර තිබූ අතරම දෙපාර්තමේන්තුව විසින් හිඟ බදු වාර්තාව පිළියෙල කිරීමේදී 2024 ජූනි 30 දිනට මුළු බදු වටිනාකම රු. 1,208,104,322 ක් වූ හිඟ බදු මුදලක් කොළඹ දකුණ ශාඛාවේ හිඟ බදු වාර්තාවේ දෙවරක් සටහන් ව තිබී පසුව හඳුනාගෙන නිවැරදි කර ඇති මුත් මෙසේ හිඟ බදු වාර්තාවන්හි දෝෂ පැවතීම මඟින් නිවැරදි හිඟ බදු මුදල් අදාළ අර්ධ වාර්ෂික හිඟ බදු වාර්තාවන්හි නිවැරදිව වාර්තා නොවන බව නිරීක්ෂණය විය	නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් - බදු පරිපාලන නගර කාර්යාල හා ප්‍රාදේශීය කාර්යාල වෙත දැනුම් දුන් අතර 2024 ජූනි 30 දිනට හිඟ බදු රු.1,208,104,322ක ප්‍රමාණය දෙවරක් සටහන්ව තිබූ බව හඳුනාගෙන කොළඹ දකුණ C-49 වාර්තාව සකස් කිරීමේදී එය නිවැරදි කර සකස් කරන ලද බව.	කිරීම කළමනාකරණයේ වගකීම වේ.

4.1.4. කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය සම්බන්ධ කාර්යසාධන පරීක්ෂාව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018/19 තක්සේරු වර්ෂයේ RAMIS පද්ධතියට ඇතුළත් කර නොමැති බවට දක්වන ලද අතිරේක තක්සේරු වාර්තා 35න් 2025 ජනවාරි 31 වන විටත් පොලී හා දඩ මුදල් ඇතුළත් බදු වටිනාකම රු. 18,561,029ක් වූ CIT සඳහා වාර්තා 14ක්ද, පොලී හා දඩ මුදල් ඇතුළත් බදු වටිනාකම රු. 60,896,011 ක් වූ IIT සඳහා වාර්තා 16ක්ද ඇතුළත් මුළු අතිරේක තක්සේරු වාර්තා 30 ක් RAMIS පද්ධතියට ඇතුළත් කර නොමැති බව පද්ධතිය ඇසුරෙන් කළ පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර ඊට අදාළ පොලී හා දඩ මුදල් ඇතුළත් මුළු බදු වටිනාකම රු.79,457,040 ක් බව නිරීක්ෂණය විය.	1819 සහ 1920 තක්සේරු වර්ෂවලට අදාළ තක්සේරු දැන්වීම්වල පිටපතක් තක්සේරු අංශයේ නිලධාරීන් විසින් අය අංශය වෙත ලබා දී ඇති අතර, තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා අංශය (ITAS) මඟින් 1819 තක්සේරු වර්ෂයේ උද්ගත වූ හිඟ බදු පිළිබඳව දැනුම් දෙන හිඟ බදු, දඩ, පොලී ප්‍රමාණයන් අනුව අය කිරීමේ අය ක්‍රියාමාර්ග දැනටමත් නිලධාරීන් විසින් ගෙන ඇති බවත් දැනටමත් හිඟ බද්ද ගෙවා නිම කර ඇත්නම් ඇති කර ගත් එකඟතාව පරිදි දඩ සීමා කර ඉතිරි දඩය නිදහස් කිරීමටත් හා RAMIS පද්ධතියේ පවතින දෝෂ නිරාකරණය කර ගනිමින් ඉතිරි වී තිබෙන අතිරේක තක්සේරු දැන්වීම් ද RAMIS පද්ධතිය වෙත ඇතුළත් කිරීමටත් කඩිනමින් කටයුතු කරමින් පවතින බව.	නිකුත් කර ඇති සියලු අතිරේක තක්සේරු වාර්තා ප්‍රමාණය හා එම නිකුත් කිරීම්වලට අදාළව පොලී හා දඩ මුදල් ඇතුළත් මුළු හිඟ බදු වටිනාකම නිශ්චිතවම හඳුනා ගත හැකි ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතු බව.
(ආ)	RAMIS පද්ධතියෙන් 2025 ජනවාරි 22 දිනට ලබා ගත් සියලු කාණ්ඩවලට අයත් විවෘත වැඩ අයිතම තොරතුරුවලට අනුව	මෙම වැඩ අයිතම 2015 තක්සේරු වර්ෂයේ සිට මේ දක්වා RAMIS පද්ධතිය මඟින් වරින් වර ලද වැඩ අයිතම බව, නිලධාරීන් විසින් නිම	RAMIS පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා, පද්ධතිය මඟින් නිකුත් කරන ලද සියලු වැඩ

	ප්‍රාදේශීය කාර්යාලයට සම්බන්ධ වැඩ අයිතම 24,031ක් විවෘතව පවතින බව නිරීක්ෂණය විය. ඒ තුළ පිළිවෙලින් WI_Verify_Content_of_Other _Documents, WI_CM_Assign_Case_TD, WI_Return_Review_BY_PTA හා WI_Verify_ Refund යන වැඩ අයිතම නාම යටතේ විවෘත වැඩ අයිතම 5,072ක්, 4,762ක්, 3,559ක් හා 2,265ක් ප්‍රධාන වශයෙන් හඳුනා ගැනුණි.එසේම වැඩිම විවෘත වැඩ අයිතම ප්‍රමාණයක් IIT, CIT සහ VAT යන බදු වර්ග සඳහා පවතින අතර පිළිවෙලින් එය 9,163ක්, 6,158ක් හා 4,312ක් බව නිරීක්ෂණය විය.	කළ හැකි වැඩ අයිතම උපරිමව අවසන් කර ඇති බව, නිම කළ නොහැකි වැඩ අයිතම සඳහා විවිධ හේතු අවශ්‍ය අවස්ථාවලදී දිරි දීමනා කමිටුව හා ඉහළ පරිපාලනයට ලබා දී ඇති බව හා බොහොමයක් වැඩ අයිතම ඉතුරු වී ඇත්තේ RAMIS පද්ධතියේ ඇති දෝෂ හේතුවෙන් බව.	අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	RAMIS පද්ධතියෙහි 2025 ජනවාරි 22 දිනට ලබා ගත් විවෘත වැඩ අයිතම තොරතුරුවලට අනුව 2025 වර්ෂයේ සිටි දේශීය ආදායම් සේවයේ නිලධාරීන්ගේ 2015/16 තක්සේරු වර්ෂයේ සිට 2023/2024 තක්සේරු වර්ෂය දක්වා වූ මුළු Appeal හා Query ප්‍රමාණය ප්‍රාදේශීය කාර්යාලයට අදාළව පිළිවෙලින් 150ක් හා 127ක් විගණිත දිනය වන විට විවෘතව පැවතුණි. ඉන් Query 52ක් අවුරුදු 6 ට වඩා වැඩි බදු කාල පරාසයන්ට අදාළ වන අතර තවදුරටත් විසඳා නොමැති බව නිරීක්ෂණය විය.	සියලුම නිලධාරීන් විසින් මෙම Appeal / Query විසඳීමට අවධානය යොමු කර අදාළ මූලික ක්‍රියාමාර්ග ගෙන ඇති බව හා මෙම Appeal / Query වලට අදාළ වන බද්ද, දඩය, පොලිය දැනටමත් හිඟ බදු ලේඛනවල අත්හිටවූ බදු ලෙසට දක්වා ඇති අතර ඊට හේතු ලෙස බදු ගෙවන්නාගෙන් නිසි අනුකූලතාවයක් නොලැබීම, RAMIS පද්ධතියේ පවතින ගැටළු, PAYE උපලේඛන නිවැරදිව ලබා නොදීම හා නිලධාරි හිඟය හේතු වී ඇති බව	RAMIS පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා පද්ධතිය මඟින් නිකුත් කරන ලද සියලු වැඩ අයිතම කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ 2011 වර්ෂයේ සිට රු. 5,276,921 ක් වටිනා චෙක්පත් 16 ක් අගරු වී ඇති අතර චෙක්පත් අගරු වී අය ක්‍රියාමාර්ග ගැනීමට වර්ෂ 05 ඉක්ම වූ චෙක්පත් 08 ක් ඇති අතර දේශීය ආදායම් බදු පනත අනුව අය ක්‍රියාමාර්ග ගනිමින් බදු අය කර ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය..	අගරු චෙක්පත් සඳහා නීති ක්‍රියාමාර්ග ගෙන ඇති රු. 2,100,012ක් වටිනා චෙක්පත් 06ක් ද, මුදල් පනත යටතේ කපා හැරීමට හඳුනාගෙන ඇති රු. 773,551ක් වටිනා චෙක්පත් 03ක් ද, ගෙවීම මාරුකිරීම සඳහා හා මුදලින් අයකර ගත් රු. 5,843,673ක් වටිනා චෙක්පත් 16ක් ද වශයෙන් අය ක්‍රියාමාර්ග ගෙන ඇති බව	දේශීය ආදායම් බදු පනත අනුව සියලු අය ක්‍රියාමාර්ග ගනිමින් බදු අය කර කඩිනමින් පියවර ගත යුතුය.

(ඉ)	ප්‍රාදේශීය කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද 2024 ජූනි 30 දිනට අදාළ හිඟ බදු වාර්තා අනුව, RAMIS හා Non RAMIS සඳහා මුළු හිඟ බදු වටිනාකම රු. 2,305,575,477ක් බව වාර්තා කර තිබුණි. හිඟ බදු වාර්තාවේ කාල විශ්ලේෂණයේ දී, හිඟ බදු හඳුනාගෙන තිබූ වර්ෂ ලෙස 2019 සිට 2024 වර්ෂ දක්වා තිබූ අතර 2019 වර්ෂයට පෙර කිසිදු හිඟ බදු මුදලක් වාර්තා කර නොතිබුණි. ශාඛාවට අදාළ වන 2019ට පෙර සියලු හිඟ බදු 2019 වර්ෂයට හඳුනාගෙන තිබූ අතර, එමගින් ශාඛාවේ සත්‍ය හිඟ බදු කාල විශ්ලේෂණයට අනුව නිවැරදිව හෙළිදරව් වී නොතිබුණු බව නිරීක්ෂණය විය.	ප්‍රධාන කාර්යාලයේ ගෙවීම් හා සැසඳුම් අංශය මඟින් තක්සේරු මත ඇති වන හිඟ බදු හඳුනාගනු ලබන්නේ තක්සේරු දැන්වීම් නිකුත් කරන ගිණුම් වර්ෂ පදනම් කර ගනිමින්ය. 2019 වර්ෂයට පෙර තක්සේරු දැන්වීම් ද, ඒ ආකාරයට 2019 වර්ෂයේ තක්සේරු දැන්වීම් නිකුත් වී ඇති බැවින් එම වර්ෂයට හිඟ බදු හඳුනාගෙන ඇත.	සත්‍ය හිඟ බදු කාල විශ්ලේෂණයට අනුව නිවැරදිව හිඟ බදු වාර්තාවන්හි හෙළිදරව් කළ යුතුය.

4.1.5. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අතිරේක තක්සේරු වාර්තා නිකුත් කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	විගණනයට කැඳවූ තොරතුරු අනුව 2024 අප්‍රේල් 18 දිනට ලද තොරතුරු අනුව 2018/19 සිට 2021/22 තක්සේරු වර්ෂ සඳහා සංස්ථාපිත (CIT), තනිපුද්ගල (IIT)හා හවුල් ව්‍යාපාර (PIT) සඳහා නිකුත් කර ඇති අතිරේක තක්සේරු ප්‍රමාණය 11,686 ක් වන අතර හා ඊට අදාළ අතිරේක තක්සේරු කළ බදු මුදල රු. 579,804,166,354 ක් විය.		
(අ)	දළ වශයෙන් ලියාපදිංචි බදු ලිපිගොනු ප්‍රමාණයට වූ 624,000ට සාපේක්ෂව නිකුත් කර ඇති අතිරේක තක්සේරු ප්‍රමාණය ඉහත බදු වර්ගයන්ට අදාළව සියයට 0 සිට සියයට 9 දක්වා වූ අතර එය සමස්ත ලියාපදිංචි බදු ලිපිගොනු ප්‍රමාණයෙන් අවම ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය.	බදු ගෙවන්නා විසින් ස්වතක්සේරු ක්‍රමය යටතේ බදු වාර්තා ඉදිරිපත් කරන අතර දෙපාර්තමේන්තුව විසින් සියලු ලිපිගොනු කඩිනම් විගණනයක් සිදු කොට තෝරා ගන්නා ලද ලිපිගොනු පමණක් සවිස්තරාත්මක විගණනයට ලක් කරයි. දැනට දෙපාර්තමේන්තුව සතුව පවතින සීමිත මානව හා භෞතික සම්පත් හේතුවෙන් සවිස්තරාත්මක විගණනයට ලක් කෙරෙන ලිපිගොනු ප්‍රමාණය සීමා වී ඇත.	බදු ලිපිගොනුවලට අදාළව නිවැරදි බදු බැදියාව තහවුරු කර ගැනීමට කාලීනව කටයුතු කළ යුතුය.

	උක්ත 2018/19 තක්සේරු සංස්ථාපිත බදු කරුවන් සඳහා නිකුත් කර තිබූ 1,830 ක අතිරේක තක්සේරු ප්‍රමාණයෙහි තක්සේරු නිකුත් කිරීමේ කාල විශ්ලේෂණය අනුව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා තක්සේරු 10ක්ද 2022 වර්ෂයේදී තක්සේරු 1478 ද 2023 වර්ෂයේදී තක්සේරු 286 හා 2024 වර්ෂයේදී තක්සේරු 56ක් ද වශයෙන් වන අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (සංශෝධිත) 135 (2) (ආ) වගන්තිය අනුව කාල කඩඉම් වකවානුව, 2022 මැයි මාසයෙන් ඉකුත් වන අතරම එසේ කාල කඩඉමට ලක්වීමට වාර්තා 2019 නොවැම්බර් 30 දිනට පෙර ලබා දී තිබිය යුතු වුවත්, සැලකිය යුතු ප්‍රමාණයක් එනම් 1,813 ක් වූ අතිරේක තක්සේරු ප්‍රමාණයක් 2022 වර්ෂයෙන් මැයි මාසයෙන් පසුව නිකුත් කර ඇති බව විගණනයට නිරීක්ෂණය විය.	තක්සේරු වර්ෂ 2018/2019 සිට අතිරේක තක්සේරු නිකුත් කිරීම RAMIS පද්ධතියට පරිබාහිරව වෙනත් මෘදුකාංග පද්ධතියක් මඟින් නිකුත් කළ අතර 2024 අප්‍රේල් මස 30 දින සිට RAMIS හරහා අතිරේක තක්සේරු නිකුත් කිරීමට පහසුකම් ඇති බවත්, බදු ගෙවන්නන් වාර්තා භාරදීමේ දිනය පදනම් කරගෙන කාල කඩඉම් දිනය වෙනස් වන අතර හා 2018/2019 වර්ෂයට අදාළ වාර්තා කාල කඩඉමට ලක්වන්නේ 2019 නොවැම්බර් 30 දිනට පෙර භාර දුන් වාර්තා පමණක් බව	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ වගන්තිය අනුව අදාළ වන තක්සේරු දැන්වීම් නියමිත කාල කඩඉම් දින ඉකුත් වීමට ප්‍රථම නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

4.1.6. **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2018/19 තක්සේරු වර්ෂයෙහි සංස්ථාපිත ආදායම් බදු (CIT) සඳහා විකල්ප ක්‍රමවේදය ඔස්සේ නිකුත් කර ඇති අතිරේක තක්සේරු වාර්තා දත්ත RAMIS පද්ධතියට ඇතුළත් කිරීමේ කාර්යසාධනය**

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2024 අප්‍රේල් 18 දිනැතිව විගණනයට කැඳවූ තොරතුරු අනුව විකල්ප ක්‍රමවේදය ඔස්සේ 2018/19 සිට 2021/22 තක්සේරු වර්ෂ සඳහා විගණිත දිනයේදී අතිරේක තක්සේරු RAMIS පද්ධතිය මඟින් නිකුත් කිරීමට පද්ධතිය සංවර්ධනය කර නොතිබූ බැවින්, විකල්ප ක්‍රමවේදය ඔස්සේ සංස්ථාපිත ආදායම් බදු (CIT) සඳහා නිකුත් කර ඇති අතිරේක තක්සේරු ප්‍රමාණය 7,090ක් වන අතර හා ඊට අදාළ බදු මුදල	අංක CGIR/2023/3-1(Ins & Cir)15 හා 2023 ජූනි 22 දිනැතිව අතිරේක හෝ සංශෝධිත තක්සේරු දැන්වීම් නිකුත් කිරීමට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛයේ පිටපතක් පිළිතුර ලෙස ඉදිරිපත් කර ඇත.	RAMIS පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා,පද්ධතියෙන් පරිබාහිරව නිකුත්කරන ලද සියලු අතිරේක තක්සේරු දැන්වීම් RAMIS පද්ධතිය වෙත කඩිනමින් ඇතුළත් කර හිඟ බදු අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.

	රු.569,897,813,253 ක් විය . ඒ අතරින් 2018/19 තක්සේරු වර්ෂය සඳහා නිකුත් කරන ලද අතිරේක තක්සේරු ප්‍රමාණය 1,830ක් හා එහි වටිනාකම රු. 256,727,918,900 ක් වි තිබිණ.		
(ආ)	2018/19 තක්සේරු වර්ෂයෙහි CIT සඳහා අතිරේක තක්සේරු නිකුත් කිරීම, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (සංශෝධිත) 135 (2) (ආ) පරිදි, කාල කඩඉම් වකවානුව වන තක්සේරු වර්ෂ අවසන් වී මාස 30 අවසන් වීමට ප්‍රථමයෙන් නිකුත් කළ යුතු බව දැක්වේ.ඒ අනුව උක්ත නිකුත් කර ඇති අතිරේක තක්සේරු නියැදි පරීක්ෂණය අනුව කාල කඩඉම ඉකුත් වීමට ඇති දින 01-05 අතර තක්සේරු වාර්තා ගණන 43 ක් නිකුත් කර ඇති අතර, එසේ කාල කඩඉම් දින ආසන්න වන තෙක් තක්සේරු වාර්තා නිකුත් නොකර සිටීම මඟින්, කාල කඩඉම් වකවානුව මඟ හැරීම, බදු ගෙවන්නා හට රෙජිස්ටර් තැපැල මඟින් ලිපි ලැබීම ප්‍රමාද වීම මත කාල කඩඉම් දිනය කඩ වී ඇති බව අභියාචනාවන්හි බදු ගෙවන්නා විසින් හේතු දැක්වීමත් වැනි අවධානම් තත්ත්වයන් ඇති විය හැකි බැවින් කාල කඩඉම් දිනයට යම් නිශ්චිත දින ගණනකට ප්‍රථමයෙන් තක්සේරු වාර්තා නිකුත් කිරීමට ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතුව ඇති බව නිරීක්ෂණය කෙරේ.	RAMIS පද්ධතියේ පැවති දෝෂයක් හේතුවෙන් වාර්තා උඩුගත කිරීමේ ගැටළුකාරී තත්ත්වයක් පැවති අතර, මේ වන විට එම දෝෂය මඟහරවා ගැනීමට කටයුතු කර ඇති අතර අදාළ වාර්තා RAMIS පද්ධතියට උඩුගත කර ඇත.	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ වගන්තිය අනුව අදාළ වන තක්සේරු දැන්වීම් නියමිත කාල කඩඉම් දින ඉකුත් වීමට ප්‍රථම නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2018/19 තක්සේරු වර්ෂයෙහි සංස්ථාපිත බදු ගෙවන්නන් සඳහා අතිරේක තක්සේරු නිකුත් කරන ලද TIN අංක 100 ක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර එහි මුළු වටිනාකම රු. 162,168,617,836ක් විය. 2024 අප්‍රේල් 10 දිනැති සංස්ථාපිත බදුවලට අදාළ අභ්‍යන්තර චක්‍රලේඛය හරහා විකල්ප	RAMIS පද්ධතියේ පැවති දෝෂයක් හේතුවෙන් වාර්තා උඩුගත කිරීමේ ගැටලුකාරී තත්ත්වයක් පැවති අතර, මේ වන විට එම දෝෂය මඟහරවා ගැනීමට කටයුතු කර ඇති අතර අදාළ වාර්තා RAMIS පද්ධතියට උඩුගත කර ඇත.	RAMIS පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා, පද්ධතියෙන් පරිබාහිරව නිකුත්කරන ලද සියලු අතිරේක තක්සේරු දැන්වීම් RAMIS පද්ධතිය වෙත කඩිනමින් ඇතුළත් කර හිඟ බදු අය කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.

	ක්‍රමවේදය මඟින් නිකුත් කර ඇති අතිරේක තක්සේරු පිළිබඳ විස්තර RAMIS පද්ධතියට ඇතුළත් කිරීමට අදාළව නිලධාරීන් දැනුවත් කර ඇතත් විගණිත දිනය වන 2024 අගෝස්තු 05 දින තෙක් නියැදි පරීක්ෂණයට අදාළ TIN අංක 100ට අදාළ අතිරේක තක්සේරු පිළිබඳ විස්තර RAMIS පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. යථෝක්ත විගණන විමසුමට අදාළව 2025 මැයි 15 දිනැති පිළිතුරු ලිපියට අනුව උක්ත TIN අංක 100න් 95කට අදාළ අතිරේක තක්සේරු පිළිබඳ විස්තර RAMIS පද්ධතියට උඩුගත කර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.		
(ඈ)	උක්ත නියැදි විගණනයට අදාළව අතිරේක තක්සේරුව නිකුත් කළ දිනය හා ස්වයං තක්සේරු දිනය (Date of Original Assessment) යන දිනයන් සැලකීමේ දී, එම තක්සේරු වාර්තා දෙපාර්තමේන්තුවට ලබා දුන් දිනයට හාත්පසින් ම වෙනස් දිනයක් විකල්ප ක්‍රමවේදය ඔස්සේ නිකුත් කර ඇති අතිරේක තක්සේරු වාර්තාවේ Date of Original Assessment යටතේ ඇතුළත් කර ඇති අවස්ථා 18 ක් විගණනයට නිරීක්ෂණය විය.	2022 මැයි 05 දින නිකුත් කරන ලද 2018/2019 සඳහා විකල්ප ක්‍රමවේදය යටතේ තක්සේරු දැන්වීම් නිකුත් කිරීමට අදාළ මාර්ගෝපදේශය සම්බන්ධයෙන් 2022 මැයි 19 දින වන විට ඒ පිළිබඳව සම්පූර්ණ සහ නිවැරදි අවබෝධයක් නොතිබූ හෙයින් තක්සේරු දැන්වීම නිකුත් කළ දිනය Date of Original Assessment ලෙස දෝෂ සහිතව ඇතුළත් කර ඇත. මේ වන විට එම ගැටළුව හඳුනාගෙන ඇති අතර, එම දෝෂයන් නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	RAMIS පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා, සියලු තක්සේරු දැන්වීම් RAMIS පද්ධතිය වෙත නිවැරදිව උඩුගත වන බවට සහතික කිරීමට විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතුය.

4.2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

4.2.1. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතියේ කාර්යසාධනය පරීක්ෂාව

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණ ආරම්භ කරන ලද , ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු		

	පද්ධතිය (**RAMIS**) සඳහා 2014 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා දල වශයෙන් රු. මිලියන 17.3 ක මුළු පිරිවැයක් දරා ඇති බව විගණනයට වාර්තා කර තිබුණි. ඒ අනුව **RAMIS** 1.0 සඳහා 2014 මැයි 27 දින සිංගප්පූරු ඩොලර් 35,006,646 කට (පැවති විදේශ විනිමය මිල අනුව රු.බිලියන 04 ක මුදලකට) සිංගප්පූරුවේ ආයතනයක් (**NSC**) සමඟ ගිවිසුම් ගත වී තිබූ අතර එම පද්ධතියේ වැඩ කටයුතු නිම කර තිබූ මොඩියුල 2016 ජනවාරි 01 සිට ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධව 2024 වර්ෂයේ **RAMIS** පද්ධතියේ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.		
(අ)	RAMIS පද්ධතිය සංවර්ධනය කිරීමේ ගිවිසුම් ලෙස RAMIS 1.0 සඳහා 2014 මැයි 27 දින සිංගප්පූරු ඩොලර් 35,006,646ක් ද, RAMIS 2.0 අදියර A සඳහා සිංගප්පූරු ඩොලර් 1,760,000 (රු.මිලියන 265ක් පමණ) ක් ද, 2.0 අදියර B සඳහා සිංගප්පූරු ඩොලර් 15,534,364 (රු.බිලියන 2.3ක් පමණ) ක් ද ගිවිසුම් ගත වී තිබුණි. 2024 ජනවාරි 31 දක්වා වසර 03කට සිංගප්පූරු ඩොලර් 21,053,371කට (රු.බි. 3.1 ක් පමණ) නඩත්තු සේවා කොන්ත්‍රාත්තුව සිංගප්පූරු සහයෝගිතා ආයතනයේ උපකොන්ත්‍රාත් කරුවකු වෙත ලබා දී තිබුණි.RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව 2024 පෙබරවාරි සිට 2027 ජනවාරි දක්වා වසර 3කින් දීර්ඝ කිරීම සඳහා සකසන ලද කෙටුම්පත් ගිවිසුමේ කොන්දේසි නිරීක්ෂණය සඳහා නීතිපති වෙත යොමු කර 2024 සැප්තැම්බර් 13 වන දින ගිවිසුම් ගත වී ඇති අතර ගිවිසුම් වටිනාකම සිංගප්පූර්	පිළිතුරු ලබා දී නොමැත.	RAMIS පද්ධතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවට භාර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය.

	ඩොලර් (SGD) 31,808,289ක් බව නිරීක්ෂණය විය.		
(ආ)	RAMIS පද්ධතිය ක්‍රියාත්මක වීමේදී ඇති වන ගැටළු සඳහා RAMIS පද්ධතියෙහි යම් යම් වෙනස්කම් සිදු කරනු ලබන බවත්, මේ සඳහා සිංගප්පූරු ආයතනයට එම වෙනස්කම් සිදු කිරීමට ගත වන මිනිස් දිනක් සඳහා සිංගප්පූරු ඩොලර් 1,333ක් එනම් දල වශයෙන් රු.291,000ක් වැය වන බවත්, එම මුදල නව ගිවිසුම යටතේ සිංගප්පූරු ඩොලර් 1,400 වන දල වශයෙන් රු. 305,200 ලෙස වැඩි කර ඇති අතර ඒ අනුව එම ආයතනයට මොඩියුල සංවර්ධනය කිරීමට ගෙවන ඉහත දක්වා ඇති පිරිවැයට අමතරව, මෙසේ සිදු කළ වෙනස්කම් සඳහා (Service Request) එම ආයතනයට 2024 වර්ෂයේ දී දල වශයෙන් රු. මිලියන 405ක් පමණ ගෙවා තිබුණු බව ද නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.	පරිශීලකයින් විසින් යොදා ගනු ලබන නව අවශ්‍යතා සහ රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත (අය වැය යෝජනා ආදිය) පද්ධතියේ සිදු කළ යුතු වෙනස්කම් සඳහා කරනු ලබන ඉල්ලීම් (Service Request.) සඳහා අතිරේක ගෙවීම් සිදු කළ යුතු බව හා නඩත්තු ගිවිසුම් ඇතුළත් කිරීමේදී කාලානුරූපීව මිනිස් දිනයක් සඳහා ගෙවිය යුතු මුදල වෙනස් විය හැකි බව	රජයට අවම පිරිවැයක් වන පරිදි ව්‍යාපෘතිය මෙහෙයවීම කළමනාකරණයේ වගකීම වේ.
(ඇ)	**RAMIS** 2.0 අදියර යටතේ**,** තක්සේරු වාර්තා නිකුත් කිරීමේ මොඩියුලය සංවර්ධනය අවසන් නොවීම හේතුවෙන් 2018/2019 වර්ෂයේ සිට 2021/ 2022 තක්සේරු වර්ෂය දක්වා අතිරේක ආදායම් බදු තක්සේරු වාර්තා **RAMIS** පද්ධතියේ පරිබාහිර වූ තාවකාලික පද්ධතියක් මඟින් පවත්වා ගෙනගිය අතර ලබා දී ඇති තොරතුරු මත 2018/2019 වර්ෂයේ සිට 2021/2022 වර්ෂය දක්වා පිළිවෙලින් 2,979 ක්**,** 4,489ක්**,** 3,460ක් හා 758ක් අතිරේක ආදායම් බදු තක්සේරු වාර්තා එසේ නිකුත් කර තිබිණ. කෙසේවෙතත්**,** එම එක් එක් තක්සේරු වර්ෂ සඳහා පද්ධතියෙහි තනිපුද්ගල (**IIT)** හා සංස්ථාපිත **(CIT)** යන බදු වර්ග සඳහා තක්සේරු නිකුත් කළ	තක්සේරු වර්ෂ 2019/2020 සිට 2022/2023 දක්වා පද්ධතියෙහි IIT/CIT යන බදු වර්ග සඳහා පද්ධතිය සංවර්ධනය කර ඇති අතර හවුල් ව්‍යාපාර බද්ද (PIT) සඳහා සංවර්ධන කටයුතු සිදු කරමින් පවතින බව.	පවතින ගැටළු නිරාකරණය කර ගැනීම හා කාර්යය කඩිනමින් නිම කිරීම කළමනාකරණයේ වගකීම බව.

	හැකි වන පරිදි මේ වන විට පද්ධතිය සංවර්ධන කටයුතු සිදු කර ඇති නමුත් හවුල් ව්‍යාපාර බද්ද **(PIT)** සඳහා සංවර්ධන කටයුතු තවමත් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.තවද**,** පද්ධතියේ සංවර්ධනය අවසන් කර ඇති මොඩියුලය තුළට උක්ත දක්වා ඇති අතිරේක තක්සේරු වාර්තා ඇතුළත් කිරීම ද සාධනීය මට්ටමක නොපවතින බව ද තවදුරත් නිරීක්ෂණය විය.		
(ඇ)	ආයතන 29ක් **RAMIS** පද්ධතියට සම්බන්ධ කිරීම අදියර 4ක් යටතේ සිදු කිරීමටත් එහිදී **,** දැනටමත් ශ්‍රී ලංකා රේගුව**,** මහජන බැංකුව**,** ලංකා බැංකුව**,** මුදල් අමාත්‍යංශය**,** සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**,** ලංකා ක්ලියර් පුද්ගලික සමාගම **06** සම්බන්ධ කර ඇති අතර මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සම්බන්ධ කරමින් පවතින අතර ඉතිරි ආයතන විවිධ ගැටළු පැවතීම හේතුවෙන් මෙතෙක් සම්බන්ධ කර නොමැති අතර එම ආයතනයන්හි තොරතුරු මාර්ගගත ක්‍රමය යටතේ **RAMIS** පද්ධතියට ලබා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.	ආයතන 6 ට අමතරව මේ වන විට මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ද පද්ධතිය හා සම්බන්ධ කර ඇති බව**.**	පවතින ගැටළු නිරාකරණය කර ගැනීම හා ඉතිරි ආයතන ද කඩිනමින් RAMIS පද්ධතියට සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
(ඉ)	RAMIS පද්ධතිය භාර ගැනීම සඳහා NCS ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති කාර්යය මණ්ඩල අවශ්‍යතාවය ලෙස Application Maintenance කාර්යයන් සඳහා නිලධාරීන් 45ක්, Infrastructure Maintenance කාර්යයන් සඳහා නිලධාරීන් 21ක් Supporting Service කාර්යයන් සඳහා නිලධාරීන් 10ක් වශයෙන් මුළු කාර්යය මණ්ඩලය 76ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග NCS ආයතනය සමඟ පවතින	RAMIS පද්ධතිය පවරාගැනීමේ සැලැස්ම සමාලෝචනය කිරීම සහ පුළුල් ඇගයීමක් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කළ අතර එමඟින් සති 03 ක් ඇතුළත වාර්තාවක් ලබා දීමට නියමිත බව.	RAMIS පද්ධතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවට භාර ගැනිම**,** පවතින RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තු කාල සීමාවේ අවසන් වන දිනය වන 2027 ජනවාරි මස අවසන් වීමට ප්‍රථම සිදු කිරීමට කටයුතු කළ යුතුය.

	RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තු කාලසීමාවේ අවසන් වන දිනය වන 2027 ජනවාරි මස අවසන් වීමට ප්‍රථම සිදුකිරීමට කටයුතු කළ යුතු බව නිරීක්ෂණය කෙරේ.		
(ඊ)	2014 වර්ෂයේ සිට මේ දක්වා RAMIS ව්‍යාපෘතියට දේශීය ආදායම් සේවයේ නිලධාරීන් අනුයුක්ත කර ඇති අතර 2024 වර්ෂ සඳහා එලෙස නිලධාරීන් 60 දෙනෙකු යොදවා තිබූ අතර RAMIS පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපෘති කාර්යාලයේ ගෙවීම් පිළිබඳ නියැදි පරීක්ෂාවට අනුව දේශීය ආදායම් නිත්‍ය කාර්යය මණ්ඩලයේ නිලධාරීන් වෙත 2024 වර්ෂයට අදාළව RAMIS ව්‍යාපෘති කාර්යය සඳහා දළ වශයෙන් රු. මිලියන 22ක් ගෙවීම් කර තිබුණි. තවද, මෙම ව්‍යාපෘති කාර්යය මණ්ඩලය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතුවල නිරත වන අතරතුරදී මෙම ව්‍යාපෘතියෙහි කටයුතු සඳහා තම සේවා දායකත්වය ලබා දීම සිදු කරනු ලැබීමෙන් මේ දක්වා වසර 10කට ආසන්න කාලසීමාවක් නිත්‍ය රාජකාරී කටයුතුවලට බාධාවක් විය හැකි බවත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය අප්‍රමාදීව භාර නොගැනීම දෙපාර්තමේන්තු සමස්ථ කාර්යක්ෂමතාවයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බවත් නිරීක්ෂණය විය.	RAMIS ව්‍යාපෘතියේ නිරත කාර්යමණ්ඩලය රාජකාරී කටයුතු අතරතුර යාවත්කාලීන වෙමින් ව්‍යාපෘති කටයුතුවල නිරත වන බව හා RAMIS පද්ධතිය පවත්වාගෙන යාම වෙනුවෙන් කරනු ලබන සියළුම ගෙවීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2029 අනුව සහ මුදල් අමාත්‍යාංශයේ නිසි අවසරය ලබා ගෙන සිදු කරන බව.	RAMIS පද්ධතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවට භාර ගැනිම, පවතින RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තු කාල සීමාවේ අවසන් වන දිනය වන 2027 ජනවාරි මස අවසන් වීමට ප්‍රථම සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	RAMIS ව්‍යාපෘතිය යටතේ සිංගප්පූරු ආයතනය මඟින් ක්‍රියාත්මක වූ ඇමතුම් මධ්‍යස්ථාන සේවාව (Call Center) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන වර්ෂයකට	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පත්වාගෙන යනු ලබන Call Center ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ අංශය මඟින් පරිපාලනය වන බව පමණක් දන්වා ඇත.	රජයට අවම පිරිවැයක් වන පරිදි ව්‍යාපෘතිය මෙහෙයවීම කළමනාකරණයේ වගකීම වේ.

	රු.33,844,000ක වැට් රහිත මුදලක් ගෙවීමට යටත්ව 2021 අප්‍රේල් 01 දින සිට 2023 මැයි 31 දින දක්වා වූ වර්ෂ 02කට වැඩි කාලයක් සඳහා පුද්ගලික ආයතනයක් යටතේ පවත්වාගෙන යනු ලැබූ අතර නැවතත් 2023 ජූනි 01 සිට 2025 මාර්තු 31 දින දක්වා වසරකට රු.38,350,000ක වැට් රහිත මුදලකට අදාළ කොන්ත්‍රාත්තුව දිර්ඝ කිරීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී තිබිණ. මෙම ඇමතුම් මධ්‍යස්ථාන සේවාව පවත්වා ගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව සතුව භෞතික හා මානව සම්පත් නොමැති වීම මත මෙම කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට සිදු වී ඇති අතර මෙම ඇමතුම් මධ්‍යස්ථාන සේවාව සඳහා 2023 වර්ෂය සඳහා රු.38,683,199ක් ද 2024 වර්ෂය සඳහා රු.33,939,750ක් ද ගෙවා තිබූ බව වාර්තා කර තිබුණි.ඒ අනුව මෙම සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට කටයුතු නොකිරීම නිසා මෙම අතිරේක වියදම් දැරීමට සිදු වන බවද නිරීක්ෂණය විය.		
(ඌ)	RAMIS ක්‍රියාත්මක කිරීමේ අදියර II යටතේ පද්ධතිගත කිරීමට අපේක්ෂා කරන ලද ඔට්ටු හා සූදු බද්ද, 2005 අංක 5 දරන මුදල් පනත මඟින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද කොටස් ගනුදෙනු බද්ද හා 2015 හඳුන්වා දුන් විගමන බද්ද සහ 2017 දී හඳුන්වා දුන් ප්‍රේෂණ ගාස්තු යන බදු වර්ගවල පරිපාලන කටයුතු ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය මඟින් සිදු නොවන අතර, ඒවා පද්ධතිගත කිරීමේ දැඩි කාල ප්‍රමාදයක් ඇති බව නිරීක්ෂණය විය.	ඔට්ටු හා සූදු බද්ද සඳහා වෙනමම මොඩියුලයන් හඳුන්වාදීම සඳහා වන පිරිවැය සැලකීමේදී එය පද්ධතිගත නොකර කළමනාකරනය කිරීම සුදුසු බව.	දෙපාර්තමේන්තුව මඟින් පරිපාලනය වන සියලු බදු වර්ග පද්ධතිගත කිරීම තුළින් බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම කළමනාකරණයේ වගකීම බව.

(එ)	දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ස්ථාන මාරු ක්‍රමවේදය මත දෙපාර්තමේන්තු සේවයෙන් පරිබාහිර සේවාවල නිලධාරින් සේවා කාලය වර්ෂ 05 ඉක්මවන අවස්ථාවල ස්ථාන මාරු වලට යටත් විය යුතු වුවද දෙපාර්තමේන්තුවේ RAMIS ව්‍යාපෘතියට අදාළව නිලධාරින්ගේ බඳවා ගැනීමේ පවතින ප්‍රමාදය හා අදාළ වෘත්තියවේදී හිඟය මත RAMIS ව්‍යාපෘතිය සඳහා සහය වීම සඳහා යොදවා ඇති නිලධාරින්ගේ ස්ථාන මාරු ක්‍රමවේදය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ලැබී නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2025 පෙබරවාරි 28 දිනට දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ නිලධාරින් තිදෙනකු වර්ෂ 12 ඉක්මවාද සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ නිලධාරින් දෙදෙනකු ඇතුළු ව්‍යාපෘති නිලධාරින් තිදෙනකු වර්ෂ 05 ඉක්මවාද සේවයේ නියුක්තව තිබුණි.	මෙම නිලධාරීන් පූර්ණ කාලීනව RAMIS ව්‍යාපෘති කටයුතු සඳහා යොදවා නොමැති අතර සාමාන්‍ය රාජකාරී කටයුතු අතරතුර සහ අනෙකුත් RAMIS නිලධාරීන් මෙන් රාජකාරී කාලයෙන් පරිබාහිර කාල සීමාවලදී RAMIS රාජකාරී ඉටුකරනු ලබන නිලධාරීන් වේ.	පවතින RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තු කාලසීමාවේ අවසන් වන දිනය වන 2027 ජනවාරි මස අවසන් වීමට ප්‍රථම RAMIS පද්ධතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවට භාර ගැනීමට කටයුතු කළ යුතු බව හා RAMIS පද්ධතිය නඩත්තු කිරීමට අනුමත කාර්යමණ්ඩලය බඳවා ගැනීම මඟින් රජයේ අනුමත ස්ථාන මාරු ක්‍රමවේදයට අනුගත වීම කළමනාකරණයේ වගකීම වේ.

4.3. වාර්ෂික කාර්යසාධන වාර්තාව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
4.3.1	2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ වාර්තාව උක්ත චක්‍රලේඛය ප්‍රකාරව අනුගත වී නොතිබුණි.	2024 වාර්ෂික කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 සඳහන් ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් නොවූ බවත්, ඉදිරියේදී එසේ නොවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බවත් 2020 අගෝස්තු 28 දිනැති 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025 වර්ෂය	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අදාළ මාර්ගෝපදේශ ආකෘතියන් ප්‍රකාරව පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

		සඳහා නිවැරදි ආකෘතිය අනුව ඉදිරිපත් කරන ලද බවත්.	
4.3.2	2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ද ඇතුලත් කර වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර සභාගත කල යුතු වුවත් 2023 වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තාව මාස 07 ක කාල පමාවකින් පසුව 2025 ජනවාරි 07 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.	දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර විවිධ කරුණු හේතුවෙන් 2023 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සභාගත කිරීම අපේක්ෂිත කාලයට වඩා ප්‍රමාද වූ බවත් ඉදිරියේදී එසේ නොවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලද බව.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

4.4. **ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
4.4.1	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා සමස්ථ ඇස්තමේන්තුගත වියදම හා 2024 වර්ෂයට එහි භෞතික ප්‍රගතිය සලකා බැලීමේදී 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කළ යුතු ප්‍රසම්පාදන අයිතමයන් 17 ක් සඳහා අපේක්ෂිත ප්‍රගතිය ලගා කර ගෙන නොතිබුණි.	2024 මැයි 01 ආරම්භ කිරීමට සැලසුම් කළ අනු අංක 7 ප්‍රසම්පාදන කාර්යය ඔක්තොම්බර් මස ආරම්භ කරන ලද බවත් අනු අංක 9 හා 10 සඳහා ප්‍රමාද දෝෂයකින් සියයට 75ක් ලෙස ප්‍රසම්පාදන සැලැස්මෙහි සඳහන් වූ බවත් අනු අංක 8 ප්‍රසම්පාදන කාර්යයයේ පළමු හා දෙවන කොටස 2024 වර්ෂය තුළ දී අවසන් කර තෙවන කොටස 2024 වර්ෂයේ නොවැම්බර් මසදී ආරම්භ කරන ලද අතර භාණ්ඩ මිලදීගැනීම සඳහා අනුමැතිය 2025 පෙබරවාරි 28 දින ලැබී ඇති බවත් අනු අංක 11 යටතේ 2024 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලද වැඩ සඳහා ගෙවන ලද බිල්පත්වල වටිනාකම එහි ප්‍රතිශතය සියයට 58ක් වී ඇති බවත් අනු අංක 12 යටතේ අවශ්‍යතාව අනුව ලැබෙන ඉල්ලීම් සඳහා අපේක්ෂිතව වෙන් කරන ලද ප්‍රතිපාදන අතර 2024 වර්ෂය සඳහා එවැනි ඉල්ලීම් සඳහා වැය වී ඇති මුදල්	ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව අපේක්ෂිත ප්‍රගතිය ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.

		මත එම ප්‍රතිශතය සියයට 52ක් වී ඇති බවත්.	
4.4.2	දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් නොවන නමුත් එදිනට ප්‍රමාණවත් ප්‍රගතියක් අත් කර නොගත් අවස්ථා 03ක් නිරීක්ෂණය විය.	මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලි 04 සඳහා ඉංජිනේරු උපදෙස් බාහිර ආයතනයකින් ලබා ගැනීමට සිදුවීමෙන් එම කටයුතුවල සිදුවූ ප්‍රමාදය මත 2024 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ප්‍රගතිය කරා ලඟා වීමට නොහැකි වූ බවත් මේ වන විට අදාළ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කර ප්‍රසම්පාදන කටයුතු ඉදිරියට සිදුකර ගෙන යනු ලබන බවත්.	ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව අපේක්ෂිත ප්‍රගතිය ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.
4.4.3	දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ප්‍රගති වාර්තාවට අනුව ප්‍රසම්පාදන අයිතමයන් 29 ක් සඳහා ප්‍රතිශතාත්මක ප්‍රගතිය හඳුනාගෙන නොතිබුණි. තවද 246-1-1-0-1409 දෙපාර්තමේන්තු වැය විෂයට අදාළව ප්‍රචාරණය සඳහා රු.102,000,000 ක සමස්ථ ඇස්තමේන්තුගත මුදලින් රු.84,031,658 ක මුදලක් එනම් සියයට 82 ක සෘජු මිළදී ගැනීම් හරහා වියදම් සිදු කර තිබුණි.	ප්‍රතිශතාත්මක ප්‍රගතිය හඳුනාගෙන නොමැති අයිතම 15ක් සඳහා අවශ්‍යතාව මත අලුත්වැඩියාවන් සිදු කිරීම නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවන බවත්, අයිතම අංක 51-55 දක්වා ඉංජිනේරුවරයෙකු නොමැති වීමත් ඉල්ලා ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් මත නවීකරණ කටයුතු සිදු වී නොමැති බවත්, අයිතම අංක 56 - 80 දක්වා තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා අංශය මගින් අවශ්‍යතාව දන්වා නොමැති බවත්, අයිතම අංක 95 සඳහා ප්‍රසම්පාදනයන්ට අදාළ පුවත්පත් දැන්වීම් පල කිරීමේ අවශ්‍යතාව අනුව වියදම් දරා ඇති බවත්, අයිතම අංක 113 සඳහා ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තුව ලැබෙන අවස්ථාව වන විට දෙපාර්තමේන්තු කුඩා පරිමාණ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය නොමැති බවත්, අයිතම අංක 121,122 සඳහා මාසික බිල්පත් ගෙවීමට ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවන බවත්.	ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව අපේක්ෂිත ප්‍රගතිය ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.
4.4.4	2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම හා පළමු කාර්තුවට අදාළ තොරතුරු පරීක්ෂාවේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී රු. 2,024,922,615 ක් වටිනා වැඩ, භාණ්ඩ හා සේවා අයිතම 130 ක් වෙනුවෙන්	දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම විවිධ අංශවල එකතුවකින් සකස් කරනු ලබන අතර,සේවා හා නඩත්තු සම්බන්ධ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන අංශයෙන් ඉටු කරනු ලබන අතර සේවා අයිතම 97 සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉදිරිපත් කර ඇති	ප්‍රසම්පාදන අවශ්‍යතා හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

	ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද නිවැරදිව අවශ්‍යතා හඳුනා නොගෙන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හේතුවෙන් පළමු කාර්තුව සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ ප්‍රසම්පාදන ප්‍රගතියෙහි, 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමේ ඇතුළත්ව තිබූ රු. 242,400,000 ක වටිනාකමක් සහිත වැඩ, භාණ්ඩ හා සේවා අයිතම 33 ක් ඉවත් කර තිබුණි.	බව.	

4.5. **වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
4.5.1	ජාවත්ත ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල සමඟම දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු භාවිත නොකරන ඉතා විශාල ප්‍රමාණයේ විදුලි ජනක යන්ත්‍රයක් ඉවත්කිරීම සඳහා 2023 ජූනි 14 දින භාණ්ඩ වට්ටෝරු පොතට ඇතුළත් කර තිබූ අතර එම වත්කම දීර්ඝ කාලයක් මුළුල්ලේ නිශ්කාර්යයව පැවත තිබුණි.එලෙසම ජාවත්ත ප්‍රාදේශිය කාර්යාල පරිශ්‍රයේ ගොඩනැගිල්ල සමඟම දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු දල වශයෙන් ලීටර් 10,000 ක පමණ ධාරිතාවයකින් යුත් ජල ටැංකියක් භාවිතයට ගත නොහැකි නිශ්කාර්යය වත්කමක් ලෙස තිබුණි.	පිළිතුර ලබා දී නැත.	වත්කම් නියමිත පරිදි භාණ්ඩ වට්ටෝරු පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු අතර වත්කම් කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස භාවිත කළ යුතුය.
4.5.2	දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ආයතනය නමින් ලියාපදිංචි වී ඇති වාහන පිළිබඳව තොරතුරු ලේඛනය අනුව වාහන 06 ක් මේ වන විට ධාවන තත්ත්වයේ නොපැවතුනි	52 – 8295 රථය අලුත්වැඩියාව සිදු කිරීම හෝ අපහරණය සිදු කිරීම පිළිබඳ තීරණය කිරීම සඳහා ඉංජිනේරුවෙකු සහිත කමිටුවක් පත් කර ඇතත් මෙතෙක් තීරණයක් ලබා දී නොමැති බවත් , JQ – 3981 සහ JQ – 3987 වැන් රථ අපහරණය කිරීම සම්බන්ධයෙන් ඉදිරියේ දී සුදුසු පියවර	වත්කම් නිශ්කාර්යයව පැවතීමට හේතුන් හඳුනාගත යුතු අතර ඒවා අලුත්වැඩියාවට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

		ගැනීමට කටයුතු කරනු ලබන බවත් CAC – 9946 , 301 – 4716 හා අලුත්වැඩියාවන් සිදුකරමින් ඇති බවත් JQ – 8478 - අලුත්වැඩියාව සඳහා අනුමැතියට ප්‍රසම්පාදන කමිටුවට 2025 මැයි 20 දින යොමු කර ඇති බවත්.	
4.5.3	කුරුණෑගල ආපදා හා දත්ත ප්‍රතිසාධන මධ්‍යස්ථානය තුළ යූපීඑස් පද්ධතියේ යූපීඑස් (UPS) යන්ත්‍රයක් 2022 වර්ෂයේදී ගිනිගෙන හානියට ලක්විමෙන් පසු හානි සිදුවූ යූපීඑස් (UPS) යන්ත්‍රය හා ඉතිරි UPS දෙකේ සමාන්තර පද්ධතියද ඉවත්කර 2024 වර්ෂය වන විට නව පද්ධතියක් ස්ථාපනය කර තිබුණද හානිවූ UPS යන්ත්‍ර කොටස් හා UPS දෙකේ සමාන්තර පද්ධතියේ කොටස්ද මෙතෙක් අපහරණය කිරීමකින් හෝ ඵලදායී කටයුත්තක් සඳහා සුදුසු පාර්ශවයකට නිදහස් කිරීමකින් තොරව කාර්යාල පරිශ්‍රයේ ගබඩාකර තිබීමෙන් එම යන්ත්‍ර කොටස් තවදුරටත් ධාරිතා ක්ෂය වීමකට ලක්වෙමින් පැවතුනි.	මු.රෙ.104(3) ප්‍රාරම්භක පරීක්ෂණය සිදු කර මු.රෙ. 104(4) කමිටුව මේ වන විට පත් කර ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත් ඒ අනුව එම අවසන් පරීක්ෂණ වාර්තාව ලද පසු කමිටුවේ නිර්දේශ අනුව ගින්නෙන් හානියට පත් UPS පද්ධතිය අපහරණය කිරීම හෝ නිර්දේශිත ක්‍රියාමාර්ගයක් කමිටුවේ නිර්දේශ අනුව ගනු ලබන බවත්.	වත්කම් නිශ්කාර්යයව පැවතීමට හේතුන් හඳුනාගත යුතු අතර ඒවා අලුත්වැඩියාවට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
4.5.4	ගොඩනැගිල්ල නවීකරණයේදී දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණු ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර 02 ප්‍රධාන විදුලි පද්ධතියට සම්බන්ධ කර නොතිබීම නිසා එම යන්ත්‍ර 2010 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබුණු අතර, මේ වන විට වර්ෂ 15 කට ආසන්න කාලයක් නිශ්ක්‍රීයව පැවත තිබුණි.	දෙපාර්තමේන්තුව වෙත සපයා තිබූ ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර 02 විදුලි පද්ධතියට සවි කිරීම වාහන අංගනයේ ඉදිකිරීම් කටයුතු අවසන් වන තෙක් රඳවා තබා ඇති බව.	වත්කම් නිශ්කාර්යයව පැවතීමට හේතුන් හඳුනාගත යුතු අතර අපහරණය කිරීමට හෝ ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය.
4.5.5	දෙපාර්තමේන්තුවේ CCTV කැමරා පද්ධතිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අධීක්ෂණය යටතේ පෞද්ගලික ආයතනයක් විසින් සම්පූර්ණ කර 2010 මැයි මස දී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාර දී තිබුණු අතර ඒ වන විටද අවුරුද්දක වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි. රාජ්‍ය ඉංජිනේරු	රු.7,985,992ක පිරිවැයක් දරා ඇති CCTV කැමරා පද්ධතියට අයත් කැමරා 70ට අදාළ ලේඛන ඉංජිනේරු සංස්ථාව විසින් 2010 වසරේදී දෙපාර්තමේන්තුවේ එවකට සිටි ප්‍රධාන ආරක්ෂක නිලධාරී වෙත භාර දී ඇති අතර එම ලේඛන ගොනුවේ ඇතුළත්ව තිබෙන බවත් CCTV පද්ධතියට අයත් කැමරා 70 නැවත ක්‍රියාකාරී	දෙපාර්තමේන්තුව සතු වත්කම් ඵලදායි ලෙස භාවිතයට පියවර ගත යුතු අතර වත්කම් පැවරීමට අදාළව තහවුරු කළ හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

	සංස්ථාව විසින් එය දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව භාර දී තිබූ බවට තහවුරු කල හැකි සාක්ෂි ඉදිරිපත් වී නොතිබූ අතර, මේ වන තුරු භාවිතයට ගෙන නොතිබුණු CCTV කැමරා 70 ක්‍රියාකාරී තත්ත්වයේද නොපැවති අතර මේ සඳහා දරන ලද පිරිවැය ලිපිගොනු අනුව රු. 7,985,992 ක් වී තිබුණි.	තත්ත්වයට පත් කර ගැනීම සඳහා මිලදීගැනීම් සිදු කළ ආයතනය වෙතින් කැඳවන වාර්තාව ලද පසු ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන බවත්.	
4.5.6	2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය හා 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය වන කාලය අතරතුර ගම්පහ දිස්ත්‍රික් දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය පිහිටි පරිශ්‍රය වෙනස්වී තිබූ අතර 2022 වර්ෂයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට හා CIGAS වැඩසටහනට ඇතුළත් විය යුතු බවට හඳුනාගත් මයික් 7ක් සහිත ඇමතුම් පද්ධතිය හා කැමරා 16ක් සහිත CCTV පද්ධතිය පිළිබඳව භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් හෙළිදරව් නොවුණ ද ,පසුව අදාළ උපකරණ 2024 අගෝස්තු 30 දින ප්‍රධාන ගබඩාව වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත් මෙසේ ප්‍රධාන ගබඩාව වෙත භාර දී ඇත්තේ, ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ සවි තිබූ උපකරණම බවට තහවුරු කර ගත හැකි සාක්ෂි මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම කැමරා සවි කිරීමේදී ඒ ඒ කැමරා සඳහා අදාළ අනුක්‍රමික අංක හෝ 2022 වර්ෂයේ අලුත්වැඩියාවක් සිදු කර ඇති අවස්ථාවේදී එම අලුත්වැඩියාව සිදු කර ඇති කැමරාවලට අදාළ අනුක්‍රමික අංක කැමරා සවි කළ / අලුත්වැඩියාව සිදු කළ ආයතන මඟින් මෙම කාර්යාලය වෙත ලබා දී හෝ එම සවි කළ උපකරණවලට අදාළව අනුක්‍රමික අංක එම සවි කිරීම් අවසන් කළ අවස්ථාවේදී නියමිත පරිදි සත්‍යාපනයක් සිදු කළ බවට ලේඛන ද හමු වී නොමැති බවත් යක්කල පිහිටි ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයෙන් ගලවා ඉවත් කරන ලද කැමරා පද්ධතිය හා ඊට අදාළ අනෙකුත් උපාංග 2024 අගෝස්තු 29 දින ප්‍රධාන කාර්යාලයේ සැපයීම් අංශය වෙත භාර දී ඇති බවත්.	වත්කම් නියමිත පරිදි භාණ්ඩ වට්ටෝරු පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා තහවුරු කර ගත හැකි සාක්ෂි පවත්වා ගත යුතුය.

4.6. රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ජ්‍යෙෂ්ඨ පුරවැසි ආදායම් බදු ආපසු ගෙවීම නමින් විවෘත කරන ලද නව ගිණුම් අංක 7041576 (TOD/BA/01) හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නිල	ජ්‍යෙෂ්ඨ පුරවැසි ආදායම් බදු ආපසු ගෙවීම නමින් විවෘත කරන ලද නව ගිණුම් අංක 7041576 හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නිල බැංකු ගිණුම් මෙහෙයවීමේ	මු.රෙ.880 ට අනුව ඇප තැන්පත් කළ යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

	බැංකු ගිණුම් මෙහෙයවීමේ බලතල පැවරීමට (TOD/BA/02) අදාළව මු.රෙ.880 ට අනුව ඇප තැන්පත් කිරීමට අදාළ නිලධාරීන් කටයුතු කර නොතිබුණි.	බලතල පැවරීමට අදාලව මු.රෙ.880 ට අනුව ඇප තැන්පත් කිරීමට අදාළ නිලධාරීන් කටයුතු සිදු කරමින් පවතින බව.	

4.7. **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
4.7.1	මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ විගසම එයට හේතුව ප්‍රමාණය හා වගකිවයුත්තන් නිශ්චය කර ගැනීම සඳහා පරීක්ෂණ පවත්වා මු.රෙ. 105 ප්‍රකාරව අලාභයට වගකිව යුතු නිලධාරීන් විසින් ඒ සඳහා ගෙවිය යුතු වන මුදල් ප්‍රමාණයක් නිශ්චය කොට එම මුදල පූර්ණය කරන ලෙස ඔවුනට නියම කොට එය අයකර ගැනීමට හෝ මු.රෙ.109 අනුව ක්‍රියාකර කපාහැරීමක් හෝ සිදු කර නොමැති රු. 5,346,250 ක ශේෂයක් පසුගිය වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙනගොස් තිබුණි.	CAC-9946 රථයේ අලුත්වැඩියාවන් රක්ෂණ හිමිකම් යටතේ ලැබෙන මුදලින් ඉටු කිරීමට රු 1,400,000 ක අත්තිකාරම් මුදලක් 2025 අප්‍රේල් 24 දින අදාළ ගරාජය වෙත ලබා දී ඇති බවත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/06/16/02/IRD/2025 හා 2025 මාර්තු 26 දිනැති ලිපිය මගින් UPS ගිනි ගැනීම සම්බන්ධ ප්‍රාරම්භක වාර්තාවේ පරිදි අලාභයේ දළ වටිනාකම රු.1,000,000ක් බවට තක්සේරු කර ඇති අතර, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2024 අනුව පරීක්ෂණ මණ්ඩලය පත් කිරීමේදී රු.2,000,000ක් දක්වා ගණන්දීමේ නිලධාරියාට බලය ලබා දී ඇති බවත්.	මුදල් රෙගුලාසි ප්‍රකාරව අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතුය.
4.7.2	වාහන අනතුරු 03කට අදාළව රක්ෂණාවරණය මගින් අය නොවූ රු.353,499 ක වටිනාකම සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ කපා හැරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	රු.240,499ක වටිනාකම පොතෙන් කපා හැරීම සඳහා කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇති අතර ඉතිරි ශේෂය කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව.	වාහන අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
4.7.3	2024 සැප්තැම්බර් 09 දින අනතුරකට ලක්ව තිබූ අංක NA-9123 දරන වාහනයේ අලාභ හානි පූර්ණ අළුත්වැඩියාවට ලක් කර අවසන් කර තිබුණ ද රක්ෂණ හිමිකම ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	NA-9123 රථයේ අළුත්වැඩියාව සම්පූර්ණයෙන් අවසන් කර ඇති නමුත් අදාළ ගරාජය විසින් අවසන් බිල්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම නිසා වියදම් ප්‍රතිපූර්ණය කර නොමැති බව.	වාහන අනතුරු සම්බන්ධව රක්ෂණ හිමිකම ලබාගැනීමට කටයුතු කළ යුතුය.

4.8. **කළමනාකරණ දුර්වලතා**

4.8.1. **රාජ්‍ය බැංකුවක් මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවන ලද බදු ගෙවීම RAMIS පද්ධතියට උඩුගත නොවීම**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 අප්‍රේල් 18 වන දින මාර්ගගත ක්‍රමය ඔස්සේ උක්ත බැංකුව හරහා සිදු කරන ලද බදු ගෙවීම් අතරින් RAMIS පද්ධතිය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීමේ බැංකු ගිණුමට තැන්පත් වී නොමැති බදු කරුවෙකුට අදාළ අගය එකතු කිරීමේ බදු මුදල වූ රු. 433,129,012 ක් ඇති බව වාර්තා වූ බැවින් ඒ සම්බන්ධව සිදු කරන ලද වැඩි දුර පරික්ෂාවේදී උක්ත බැංකු පරිගණක පද්ධතියේ ඇති වූ දෝෂයක් හේතුවෙන් 2024 අප්‍රේල් 18 වන දින සමස්ථ ගනුදෙනු ප්‍රමාණයෙන් ගනුදෙනු 86 කට අදාළව රු. 2,012,262,011 ක් RAMIS පද්ධතිය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීමේ බැංකු ගිණුමට තැන්පත් වී නොමැති බව හෙළි වූ අතර එම බදු මුදල් අදාළ TIN අංක යටතේ ද පද්ධතියට උඩුගත වී නොතිබූ අතර ම උක්ත බැංකුව මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දිනපතා යොමු කරන බදු ලැබීම් පිළිබඳව මෘදු පිටපතෙහි මෙන්ම දෙපාර්තමේන්තුවේ අවිනිශ්චිත ගිණුමේද එම ගෙවීම් සටහන් නොවන බව සිදුකරන ලද වැඩි දුර පරික්ෂාවේදී විගණනයට හෙළිදරව් විය.	2024 අගෝස්තු 08 වන දින පිළිතුරු ලබා දී ඇති බව හා ඒ අනුව 2024 අප්‍රේල් 18 වන දින පරිගණක පද්ධතියේ ඇති වූ දෝෂයක් හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීමේ බැංකු ගිණුමට තැන්පත් නොවූ ගනුදෙනු 86කට අදාළව රු.2,012,262,011ක වටිනාකම 2024 ජූලි 04 දින නිවැරදිව ගිණුම් ගත කර ඇති බව තහවුරු කර තිබිණ.	මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලද බදු ගෙවීම් නිවැරදිව වාර්තා කිරීම, තහවුරු කිරීමට අදාළව ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපනය කළ යුතුය.
(ආ)	කෙසේවෙතත්, උක්ත බදු ගෙවීම් RAMIS පද්ධතියේ උඩුගත වී නොමැති බව අනාවරණය වීමෙන් පසු RAMIS පද්ධතිය	පරිගණක දෝෂය නිවැරදි කිරීම සඳහා අදාළ රාජ්‍ය බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරිගේ අධීක්ෂණය යටතේ තාක්ෂණික කමිටුවක් පත් කර	මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලද බදු ගෙවීම් නිවැරදිව වාර්තා කිරීම, තහවුරු කිරීමට අදාළව

	යාවත්කාලීන කිරීම සඳහා මාස තුනකට පසු ගෙවීම් දත්ත පසුදාතම් කර 2024 ජුලි 22 දින උක්ත බැංකුව විසින් ලබා දී තිබිණ. ඒ අනුව මාර්ග ගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලද බදු ගෙවීම් ද මෙලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීමේ ගිණුම තුළ නිවැරදිව වාර්තා කිරීම, තහවුරු කිරීමට අදාලව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සාධනීය මට්ටමක නොපවතින බව නිරීක්ෂණය කෙරේ.	ඇති අතර එයට හේතු වූ කරුණු සහ එවැනි සිදුවීම් නැවත සිදු නොවීමට අදාළ පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති බව.	ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපනය කළ යුතුය.

4.8.2. **බදු ගෙවන්නන් සඳහා වරප්‍රසාද කාඩ්පත් (Gold and Silver Privilege Cards) නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන වරප්‍රසාද කාඩ්පත් වර්ග දෙකක් පවතින අතර එම දෙපාර්තමේන්තුව විසින් නිවේදනය කර ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන බදු ගෙවන්නන්ට එම කාඩ්පත් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව පවතී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය අනුව මෙම වරප්‍රසාද කාඩ්පත් නිකුත් කිරීමට අදාළ තොරතුරු 2016 වර්ෂයෙන් පසු 2025 අගෝස්තු 20 දින යථාවත් කිරීම සිදු කරනු ලැබුවත් එම යාථාවත් කරන ලද තොරතුරු අනුව වරප්‍රසාද කාඩ්පත් හිමියන්ට පෙර ලබා දී තිබූ ප්‍රතිලාභවලට වඩා ආකර්ශනීය ප්‍රතිලාභ ලබා දී ඇති බවක් නිරීක්ෂණය නොවීය.	මේ සම්බන්ධයෙන් නිල වෙබ් අඩවිය යථාවත් කිරීම සඳහා මෙන්ම වරප්‍රසාද සමාලෝචනය කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ අවසන් තීරණය ලද විගස කඩිනමින් නිල වෙබ් අඩවිය යථාවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇත. 2023 හා 2024 වර්ෂවලදී කාඩ්පත් සඳහා අයදුම් කරන ලද බදු ගෙවන්නන් සඳහා පමණක් කාඩ්පත් නිකුත් කරන ලද අතර උපදේශන හා ප්‍රවර්ධන අංශය හා ප්‍රාදේශීය කාර්යාල හරහා බදු ගෙවන්නන් දැනුවත් කිරීම සිදු කිරීමට ද තීරණය කර ඇති බව.	දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට උපකාර වන උපාය මාර්ගික ඉලක්කයන් ළඟා කර ගැනීම වඩාත් ආකර්ශනීය ප්‍රතිලාභ මඟින් අනුබල දෙන අයුරින් ක්‍රියාත්මක කිරීම/ යාවත්කාලීන කිරීම මෙන් ම එම කාලීන තොරතුරු බදු ගෙවන්නන් හට ලබාදීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කළ යුතුය.

(ආ)	බදු ගෙවන්නන් විශාල ප්‍රමාණයක් සිටියදී ඔවුන් අතුරින් ඉතා සුළු පිරිසක් පමණක් වරප්‍රසාද කාඩ්පත් සඳහා අයදුම් කිරීමෙන් නිරීක්ෂණය වනුයේ මෙම ක්‍රමවේදය සම්බන්ධයෙන් බදු ගෙවන්නන්ගේ පවතින දැනුවත්භාවය අවම මට්ටමක පවතින බව ය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට උපකාර වන උපාය මාර්ගික ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා මෙම වරප්‍රසාද කාඩ්පත්, ඒ තුළින් ලැබෙන වඩාත් ආකර්ශනීය ප්‍රතිලාභ යොදා ගෙන බදු ගෙවන්නන් හට අනුබල දෙන අයුරින් ක්‍රියාත්මක කිරීම/ යාවත්කාලීන කිරීම මෙන් ම එම කාලීන තොරතුරු බදු ගෙවන්නන් හට ලබාදීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොමැති බවද නිරීක්ෂණය කෙරේ.	මේ සම්බන්ධයෙන් නිල වෙබ් අඩවිය යථාවත් කිරීම සඳහා මෙන්ම වරප්‍රසාද සමාලෝචනය කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ අවසන් තීරණය ලද විගස කඩිනමින් නිල වෙබ් අඩවිය යථාවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට තීරණය කර ඇත. 2023 හා 2024 වර්ෂවලදී කාඩ්පත් සඳහා අයදුම් කරන ලද බදු ගෙවන්නන් සඳහා පමණක් කාඩ්පත් නිකුත් කරන ලද අතර උපදේශන හා ප්‍රවර්ධන අංශය හා ප්‍රාදේශීය කාර්යාල හරහා බදු ගෙවන්නන් දැනුවත් කිරීම සිදු කිරීමට ද තීරණය කර ඇති බව.	දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට උපකාර වන උපාය මාර්ගික ඉලක්කයන් ළඟා කර ගැනීම වඩාත් ආකර්ශනීය ප්‍රතිලාභ මඟින් අනුබල දෙන අයුරින් ක්‍රියාත්මක කිරීම/ යාවත්කාලීන කිරීම මෙන් ම එම කාලීන තොරතුරු බදු ගෙවන්නන් හට ලබාදීම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කළ යුතුය.

4.8.3. Defence Levy (DL – W) යටතේ සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) ගෙවීම් Legacy පද්ධතියට ඇතුළත් කිරීම පිළිබඳ පරීක්ෂාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 ඔක්තෝම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා RAMIS පද්ධතියෙහි අදාළ මොඩියුල සංවර්ධනය නොවීම හේතුවෙන්, TIN අංක 07ක් සඳහා වන ගෙවීම් දත්ත 114කට අදාළව පද්ධතිය ඇසුරෙන් සිදු කරන ලද පරීක්ෂාවේ දී හෙළිදරව් වූ කරුණු පහත පරිදි වේ.		

(අ)	සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) RAMIS පද්ධතියට අදාළ බදු වර්ගයක් වන නමුත් එම බදු යාවත්කාලීන කිරීමට RAMIS පද්ධතිය සකසන තුරු Legacy පද්ධතියෙහි රැඳවීමට 2023 ජනවාරි 02 දින අනුමැතිය ලැබ ඒ අනුව කටයුතු කර ඇති බව තොරතුරු තාක්ෂණ පරිපාලන සේවා අංශයේ අධ්‍යක්ෂ විසින් විගණනයට වාර්තා කර තිබිණ. ඒ අනුව SSCL ගෙවීම් දත්ත උඩුගත කිරීම සඳහා RAMIS පද්ධතියේ 32 බදු කේතය යොදා ගෙන ඇති අතර 1994 වර්ෂයේ සිට DL-W යන කෙටි නාමයෙන් 32 බදු කේතය යටතේ Legacy පද්ධතියෙහි **Defence Levy** බදු ගෙවීම් පවතින බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	2022 සැතැම්බර් 12 දින RAMIS පද්ධතියේ SSCL බදු වර්ගය සඳහා 32 බදු කේතය නිකුත් කර ඇත. එසේම RAMIS බදු වර්ගය Legacy පද්ධතියේ තාවකාලිකව රැඳවීමට නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්ගේ 2023 ජනවාරි 02 දිනැති විද්‍යුත් තැපැල් ලිපිය මඟින් අනුමැතිය ලැබී ඇත. ඒ වන විටත් බැංකු පද්ධතියට කේත අංක 32 යටතේ SSCL ලැබී තිබූ බැවින් හා ඒ සම්බන්ධයෙන් බදු ගෙවන්නන් ද දැනුවත් කර තිබූ බැවින් ද එම බදු කේතය වෙනස් කිරීමේ හැකියාවක් නොමැති අතර, කේතය වෙනස් කිරීමට නියෝග ලැබී නොමැති බව හා 2012 වසරේ සිට DL – W බදු වර්ගය පද්ධතියට සක්‍රීයව ලැබුණු බදු වර්ගයක් නොවන බව.	නව බදු වර්ගයන්ට අදාළව RAMIS පද්ධතියේ අදාළ මොඩියුල කඩිනමින් සංවර්ධනය කළ යුතු බව හා එසේ කිරීමේදී අලුත් බදු කේතයන් යොදා ගත යුතුය.
(ආ)	විගණන පරීක්ෂාවට අනුව 1994 වර්ෂයේ දී DL-W නාමයෙන් බදු වර්ගයක් Legacy පද්ධතියේ පෙර සිට පැවතියේ නම් SSCL ගෙවීම් දත්ත එම බදු කේතයෙහි ම සටහන් කිරීම නිවැරදි නොවන බව ගනුදෙනු පද්ධතියට ඇතුළත් කරන පළමු අවස්ථාවේ දී ම හඳුනාගත හැකිව තිබූ හෙයින් යථෝක්ත කේතය යටතේ නව බදු වර්ගයක් Legacy දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට තීරණය කිරීම විගණනයේ දී ගැටළු සහගත විය.	SSCL බදු දත්ත තාවකාලිකව Legacy පද්ධතියේ රැඳවීමට නියෝග ලද අතර, RAMIS පද්ධතිය සූදානම් වූ පසුව, Data Migration ක්‍රියාවලිය සඳහා අනුමැතිය ලැබීමෙන් පසු NCS ආයතනය/ RAMIS SSCL කණ්ඩායම හා එක්ව 2024 ජනවාරි 19 දින Legacy පද්ධතියේ තිබූ සියලුම SSCL ගෙවීම් දත්ත RAMIS පද්ධතිය වෙත මාරු කිරීමට කටයුතු කරන ලදී.	නව බදු වර්ගයන්ට අදාළව RAMIS පද්ධතියේ අදාළ මොඩියුල කඩිනමින් සංවර්ධනය කළ යුතු බව හා එසේ කිරීමේදී අලුත් බදු කේතයන් යොදා ගත යුතුය.
(ඇ)	Legacy පද්ධතියේ මෘදුකාංග හා දෘඩාංගයන් කාලානුරූපීව නව්‍යකරණයට ලක් නොවීම හේතුවෙන් පවතින අවධානම මත එම පද්ධතිය භාවිතයෙන් ක්‍රමිකව ඉවත් කිරීමට තීරණය කර තිබුණද, RAMIS පද්ධතියෙහි අදාළ මොඩියුල සංවර්ධනය නොවීම හේතුවෙන් මෙසේ නැවත Legacy පද්ධතිය සඳහා නව දත්ත 74,148 ඇතුළත් කිරීම මඟින් Legacy පද්ධතියේ දැනට පවතින දත්තයන්ද අවධානමකට ලක් කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.	RAMIS Legacy පද්ධති අතර, දත්ත හුවමාරුව Data Migration ක්‍රියාවලිය පද්ධති දෙක අතර දත්ත හුවමාරු කිරීමේ පිළිගත් හා එකඟතාව පළකරනු ලැබූ ක්‍රියාවලියක් වන අතර, SSCL සඳහා ද මෙම ක්‍රියාවලියම භාවිතා කර ඇත	නව බදු වර්ගයන්ට අදාළව RAMIS පද්ධතියේ අදාළ මොඩියුල කඩිනමින් සංවර්ධනය කළ යුතුය.

(ඇ)	RAMIS පද්ධතියට මාරු කිරීම හේතුවෙන් SSCL බදු වර්ගයට අදාළ ගෙවීම් පමණක් Legacy පද්ධතියෙන් ඉවත් කර ඇති බව දක්වා ඇතත් DL-W බදු ගෙවීම් ලෙස පද්ධතියට ඇතුලත් කිරීමේ අංකයක් ("DLN "- Document Location Number) ලබා දී ඇතුළත් කර ඇති ගනුදෙනු Legacy පද්ධතියෙන් මෙසේ ඉවත් කිරීමට කටයුතු කිරීම මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ Legacy පද්ධතිය තුළ පවත්නා දත්තවල ආරක්ෂාකාරී බව හා සත්‍යතාවයට බලපෑමක් විය හැකි අතර, මෙය Legacy පද්ධතිය සම්බන්ධව පවත්නා අභ්‍යන්තර පාලන දුර්වලතාවයක් ලෙස විගණනයට නිරීක්ෂණය විය.	මෙය නිසි ක්‍රමවේදයක් යටතේ Data Migration ක්‍රියාවලිය හරහා Legacy පද්ධතියේ තාවකාලිකව රඳවූ දත්ත RAMIS පද්ධතියට හුවමාරු කිරීමක් වන අතර, අදාළ අනුමැතිය යටතේ Data Migration අදියර 2කින් සිදු කර ඇති බව දක්වා ඇත.	**Legacy** පද්ධතිය තුළ පවත්නා දත්තවල ආරක්ෂාකාරී බව හා සත්‍යතාව සහතික කිරීමට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පවත්වා ගැනීම කළමනාකරණයේ වගකීම බව.
(ඉ)	සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) සඳහා ගෙවීම් දත්ත 2024 ජනවාරි 19 වන දින RAMIS පද්ධතිය වෙත උඩුගත කිරීමට ලද අනුමැතිය මත දත්ත 71,148 ක් උඩුගත කර ඇති අතර දත්ත 2,838 ක් ප්‍රතික්ෂේප වී තිබිණ. මෙසේ දත්ත පද්ධති දෙකක කාලයක් මුළුල්ලේ සටහන් වී තිබීම මගින් අනාගතයේ වැරදි හා වංචා සිදුවීමට හැකි බව නිරීක්ෂණය කෙරේ.	RAMIS පද්ධතියට මාරු කිරීම හේතුවෙන් SSCL බදු වර්ගයට අදාළ ගෙවීම් පමණක් Legacy පද්ධතියෙන් ඉවත් කර ඇත. බදු ගෙවන්නන් SSCL බදු වර්ගයට අමතරව වෙනත් බදු වර්ග සඳහා ද ලියාපදිංචි වී ඇත්නම් ඔවුන්ගේ එම බදු වර්ගවලට අදාළ 2016ට පෙර හිඟ බදු සඳහා කරන ලද ගෙවීම් Legacy පද්ධතිය තුළට ඇතුළත් කරන අතර, එම ගෙවීම් යාවත්කාලීන වී Legacy පද්ධතිය තුළ නිරූපණය වේ.	**Legacy** පද්ධතිය තුළ පවත්නා දත්තවල ආරක්ෂාකාරී බව හා සත්‍යතාව සහතික කිරීමට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පවත්වා ගැනීම කළමනාකරණයේ වගකීම බව.

4.8.4. **අත්තිකාරම් ආදායම් බදු අය කිරීම සම්බන්ධ විගණන පරීක්ෂාව**

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
TIN අංකය 40906xxxx දරන ආයතනය සමග ගිවිසුම් ගතවූ පුද්ගලයන් 52 දෙනෙකු වෙත 2023 අප්‍රේල් සිට 2024 මාර්තු දක්වා එම ආයතනයේ අනුග්‍රහය යටතේ සංවිධානය කළ ජාත්‍යන්තර තරඟාවලි වෙනුවෙන් මූලික තරඟ	ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ක්‍රිකට් ක්‍රීඩකයන්ට කරන ගෙවීම් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සඳහා යටත් වන ගෙවීමක් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මතය වන අතර ඒ අනුව අදාළ ගෙවීම් වලින් APIT	පනත්හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදුකරුවන්ගෙන් අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

	ගාස්තුව හා ත්‍යාග මුදල් ලෙස එකතු වටිනාකම වූ රු. 1,750,450,843ක මුදලක් ගෙවා තිබුණි. මෙම ආයතනයෙන් උක්ත ගිවිසුම් ගත වූ පුද්ගලයන් ට කරන ගෙවීම් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සඳහා යටත් වන ගෙවීමක් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මතය වී තිබූ අතර ඒ අනුව අදාළ ගෙවීම් වලින් අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරන ලෙසට එම ආයතනයට අංකය ACT/05/05 දරන හා 2024 ඔක්තෝබර් 14 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති බව ද නිරීක්ෂණය විය.	අඩු කරන ලෙසට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට 2024 ඔක්තෝම්බර් 14 දිනැතිව දැනුම් දී ඇති බව.	

4.8.5. **ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් දේශීය ආදායම් පනතේ 102 වන වගන්තිය යටතේ ලියාපදිංචිය පිළිබඳ හා තනි පුද්ගල ආදායම් බදු ගෙවීමේ ප්‍රගතිය පරීක්ෂාව**

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 102(1) වගන්තිය ප්‍රකාරව ආදායම් බදු අය කරනු ලැබිය යුතු සෑම තැනැත්තෙකුම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි විය යුතු අතර එම පනතේ 102(3) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද 2023 මැයි 31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් සහ 2024 ජනවාරි 01 දිනට හෝ ඊට පසුව වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි විය යුතු අතර 2024 දෙසැම්බර් 10 දිනට තනි පුද්ගල ආදායම් බදු ලිපිගොනු හා වයස අවුරුදු 18ට වැඩි තනි පුද්ගලයන්ගේ TIN අංක 7,883,066 ක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ අතර 2025 මැයි	මෙම වගන්තියේ සඳහන් කරුණු සමඟ එකඟ වන බව.	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 102(3) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද 2023 මැයි 31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනය අනුව කටයුතු කරමින් අදාළ තැනැත්තන් කඩිනමින් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය.

	19 දිනට තනි පුද්ගල ආදායම් බදු ලිපිගොනු 1,090,096 ක් හා 2025 මැයි 09 වන දිනට වයසස අවුරුදු 18ට වැඩි තනි පුද්ගලයන්ගේ TIN අංක 10,065,680ක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති බව වාර්තා කර තිබිණ.		
(ආ)	මේ වන විට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයන් සංඛ්‍යාව දල වශයෙන් මිලියන 17 ක් වාර්තා වන අතර 2024 දෙසැම්බර් 10 දින සිට 2025 මැයි 09 දින දක්වා කාලය තුළ ඉන් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණය 3,179,372කින් පමණ වර්ධනය වී ඇතත් 2024 දෙසැම්බර් 10 දින සිට 2025 මැයි 19 දින දක්වා කාලය තුළ ආදායම් බදු සඳහා ලියාපදිංචි වී ඇති ප්‍රමාණය වර්ධනය වී ඇත්තේ 93,338කින් පමණ වේ. ඒ අනුව වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ගැනීමට මෙන්ම හා ඔවුන් අතරින් මිලියන 1.2ට වැඩි ආදායමක් ඇති පුද්ගලයන් ආදායම් බදු යටතේ ලියාපදිංචි කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුව ඇති බව නිරීක්ෂණය කෙරේ.	ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18ට වැඩි ජනගහනය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි සෑම ආකාරයක්ම භාවිතා කරමින් ලබා ගන්නා දත්ත පදනම් කර ගනිමින් TIN ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සිදුවන අතර RAMIS හා අනෙකුත් පරිගණක පද්ධති ධාරිතාව හා සේවක සංඛ්‍යාව මෙම TIN විවෘත කිරීමේ අමතර විශාල කාර්යය සඳහා අතිරේක වැඩි කිරීමක් කර නොමැති බැවින්, යම් කාල සීමාවක් තුළ එය සම්පූර්ණ කිරීමට සැලසුම් සහගතව උපරිමයෙන් කටයුතු කරමින් සිටින බව.	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 102(3) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද 2023 මැයි 31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනය අනුව කටයුතු කරමින් අදාළ තැනැත්තන් කඩිනමින් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය.

4.8.6. **රජයට අයත් ආයතන විසින් සැපයුම්කරුවන් වෙත VAT බදු ගෙවීමේදී අවධානය යොමු කළ යුතු කරුණු සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2019 ජුලි 09 දිනැති CGIR/2019/03-1 (Ins. & Cir) චක්‍රලේඛය, 2021 අප්‍රේල් 09 දිනැති CGIR/2021/02-02 චක්‍රලේඛය ප්‍රකාරව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපති වෙත රජයේ ශික්ෂණ රෝහලක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් මගින් ලබා දී ඇති තොරතුරුවලට අනුව එම ආයතන විසින් සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු (VAT) සම්බන්ධ ගෙවීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට අදාළව RAMIS පද්ධතියේ සිදු කළ VAT ගෙවීම් පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවන්හි දී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.**

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	උක්ත ශික්ෂණ රෝහල විසින් 2019 දෙසැම්බර් සිට 2022 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ සැපයුම්කරුවන් 15ක් යටතේ වන	රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු (VAT) දේශීය ආදායම්	2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ බදු නොගෙවීමත් සම්බන්ධයෙන් පවත්නා

	VAT ඇතුළත් මුළු වටිනාකම රු. 98,773,631 ට අදාළ ඉන්වොයිසි 112ක් RAMIS පද්ධතියේ එක් එක් සැපයුම්කරුවන් විසින් අදාළ කාල පරිච්ඡේදයන් යටතේ (ඉදිරි බදු කාල පරිච්ඡේද 02ක් ඇතුළත්ව) උඩුගත කර තිබූ VAT නිමැවුම් උපලේඛනවල (VAT – Schedule 01 – Output Tax) ඇතුළත් වී නොතිබුණු අතර උක්ත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2023 ජනවාරි සිට 2024 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ සැපයුම්කරුවන් 11ක් යටතේ වන VAT වටිනාකම රු. 4,251,368 ට අදාළ ඉන්වොයිසි 26ක් RAMIS පද්ධතියේ එක් එක් සැපයුම්කරුවන් විසින් අදාළ කාල පරිච්ඡේදයන් යටතේ (ඉදිරි බදු කාල පරිච්ඡේද 02ක් ඇතුළත්ව) උඩුගත කර තිබූ VAT නිමැවුම් උපලේඛනවල (VAT – Schedule 01 – Output Tax) ඇතුළත් වී නොතිබුණි.	දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම සම්බන්ධ පරීක්ෂාවට අදාළ විගණන විමසුම සඳහා 2025 මැයි 05 වන දිනැතිව යොමු කර ඇති පිළිතුරු ලිපිය අනුව එක් එක් සැපයුම්කරුවන් විසින් අදාළ කාල පරිච්ඡේදයන් යටතේ නිවැරදි VAT නිමැවුම් උපලේඛනවල උඩුගත කර ඇති ද යන්න පරීක්ෂාවන් සිදු කරන බව හා කරාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් එකඟ වී ඇති බව.	නෛතික ප්‍රතිපාදන අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව යුතුය.
(ආ)	2019 සිට 2022 දක්වා වර්ෂවලට අදාළව උක්ත ශික්ෂණ රෝහල සම්බන්ධයෙන් සිදු කළ උක්ත නියැදි පරීක්ෂාවේ ඇතුළත් සැපයුම්කරුවන් 15ක් යටතේ RAMIS පද්ධතියෙහි VAT බදු සඳහා 2025 අප්‍රේල් 29 දින වන විට විවෘතව පවතින වැඩ අයිතම 228ක් විගණනයට නිරීක්ෂණය වූ අතර එම කාල සීමාවට අදාළව උක්ත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් සිදු කළ උක්ත නියැදි පරීක්ෂාවේ ඇතුළත් සැපයුම්කරුවන් 11ක් යටතේ RAMIS පද්ධතියෙහි VAT බදු සඳහා 2025 මැයි 08 දින වන විට විවෘතව පවතින වැඩ අයිතම 122ක් විගණනයට තවදුරටත් නිරීක්ෂණය විය.	කරාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධයෙන් සැපුයම්කරුවන් 29ක් යටතේ 2025 අප්‍රේල් 29 දින වන විට විවෘතව පවතින වැඩ අයිතම 424 නිම කිරීම සඳහා මේ වන විට කටයුතු සිදුකරමින් පවතින අතර, තවදුරටත් එම තත්ත්වයන් හඳුනාගැනීමෙන් අනතුරුව තොරතුරු කැඳවීම් සිදු කරමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	පද්ධතිය තුළින් නිලධාරීන් වෙත පැවරෙන වැඩ අයිතම් කාලානුරූපීව නිමකර බදු මුදල් අය කර ගත යුතුය.
(ඇ)	සැපයුම්කරුවන් වෙත දැනටමත් ගෙවා ඇති VAT බදු මුදල් රජයට ප්‍රේෂණය නොකිරීමත්, සාවද්‍ය ලෙස VAT බදු විස්තර දෙපාර්තමේන්තුව වෙත ලබා දීමත් හා නියමිත දිනට නිවැරදි VAT බදු නොගෙවීමත්	VAT බදු මුදල් රජයට නොගෙවීම් සම්බන්ධයෙන් පවත්නා නෛතික ප්‍රතිපාදන අනුව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ බදු නොගෙවීමත් සම්බන්ධයෙන් පවත්නා නෛතික ප්‍රතිපාදන අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු

	සම්බන්ධයෙන් පවත්නා නෛතික ප්‍රතිපාදන අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බවත් නිරීක්ෂණය කෙරේ.		කළ යුතු බව යුතුය.

4.8.7. **2023 දෙසැම්බර් 31 දිනට හා 2024 දෙසැම්බර් 31 දිනට පැවති අගරු චෙක්පත් පරීක්ෂාව**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට හා 2024 දෙසැම්බර් 31 දිනට පැවති අගරු චෙක්පත් සංඛ්‍යාව පිළිවෙලින් 3,174ක් හා 2,534ක් වූ අතර ඊට අදාළ වටිනාකම පිළිවෙලින් රු.1,948,707,728ක් හා රු. 1,160,490,862ක් විය. උක්ත චෙක්පත් සංඛ්‍යාව 2023 වර්ෂයේදී RAMIS පද්ධතියට අදාළව චෙක්පත් 1,205ක් ද Legacy පද්ධතියට අදාළව වූ චෙක්පත් 1,967ක් ද සමන්විත වූ අතර 2024 වර්ෂයේදී පිළිවෙලින් එය චෙක්පත් 867ක් හා 1,667කි .	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්ථක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ චෙක්පත් 653ක් අගරුව තිබූ අතර ඊට අදාළ වටිනාකම රු. 621,421,379 හා 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා එසේ අලුතින් එකතු වූ අගරු චෙක්පත් සංඛ්‍යාව 414ක් හා එම වටිනාකම රු. 430,157,104ක් විය.	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්තක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට අදාළව පැවති අගරු චෙක්පත් ලේඛනය අනුව වැඩිම වටිනාකමක් සහිතව එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා චෙක්පත් 1,834ක් අගරු වී ඇති අතර එහි වටිනාකම රු. 927,116,432ක් විය. තවද යථෝක්ත දිනට පිළිවෙලින් CIT, IIT හා PAYE බදු සඳහා චෙක්පත් 212ක් , 289ක් හා 104ක් අගරු වී ඇති අතර	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්තක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

	ඒවායේ වටිනාකම පිළිවෙලින් රු. 119,172,065ක්, රු. 57,127,835ක්, හා රු. 27,905,850ක් විය.		
(ඇ)	යථෝක්ත අගරු චෙක්පත් ලේඛනය අනුව 2008 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාළ අගරු චෙක්පත් පවතින අතර රු. 178,025,475ක වැඩිම වටිනාකමකින් යුතු අගරු චෙක්පත් 192ක් 2024 වර්ෂයේ දී ද, වටිනාකම රු. 173,881,750ක වැඩිම චෙක්පත් ප්‍රමාණයක් වූ චෙක්පත් 336ක් 2019 වර්ෂයේ දී ද විය.	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්තක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඉ)	2024 අප්‍රේල් 04 දිනැති අංක 2378/33 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් චෙක්පත් ඔස්සේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සිදු කළ හැකි බදු ගෙවීම් සීමා කළ අතර, ඒ අනුව චෙක්පත් මඟින් සිදු කළ හැකි VAT හා SSCL බදු වර්ග පමණක් වුව ද, 2024 වර්ෂයෙහි අගරුව ඇති චෙක්පත් 192 තුළ VAT හෝ SSCL නොවන එකතු වටිනාකම රු. 12,640,086 ක් වූ චෙක්පත් 38ක් විය. ඒ යටතේ එකතු වටිනාකම රු.5,909,228 ක් වූ IIT සඳහා චෙක්පත් 15ක්, වටිනාකම රු 5,714,020 වූ PAYE සඳහා චෙක්පත් 15ක්, වටිනාකම රු. 979,838 වූ CIT සඳහා චෙක්පත් 04ක් ද අගරුව පවතින බව නිරීක්ෂණය වූ අතර, ඉහත ගැසට් පත්‍රය මඟින් චෙක්පත් ඔස්සේ ගෙවීම් සිදු කිරීම සීමා කර ඇති අවස්ථාවක වුව ද චෙක්පත් අගරු වීම තවදුරටත් පවතින බව නිරීක්ෂණය කෙරේ.	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්තක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	බදුකරුවන් 1,262ක් අතරින් එකම TIN අංකය යටතේ වැඩිම වාර ගණනක් චෙක්පත් අගරු වී ඇති අවස්ථා විගණනයට නිරීක්ෂණය වූ අතර නියැදි පරීක්ෂාවේ දී චෙක්පත් 10ක් හා ඊට වැඩි ප්‍රමාණයක් අගරු වී ඇති බදුකරුවන් 22ක් සිටින අතර TIN අංක 53238xxxx අදාළව VAT බදු සඳහා වටිනාකම රු.	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්තක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

	4,672,729ක් වූ චෙක්පත් 23ක් ද, TIN අංක 69047xxxx අදාළව IIT සඳහා වටිනාකම රු. 1,247,778ක් වූ චෙක්පත් 22 ක් ද, TIN අංක 11400xxxx අදාළව VAT බදු සඳහා වටිනාකම රු. 4,785,613ක් වූ චෙක්පත් 21ක් ද අගරු වී තිබුණි.		
(උ)	VAT බදුවලට අදාළව වැඩිම වටිනාකමක් සහිතව TIN අංක 17407xxxx, 81214xxxx හා 64306xxxx සඳහා පිළිවෙළින්, වටිනාකම රු. 23,704,757 වූ චෙක්පත් 13ක් ද, වටිනාකම රු. 17,600,000 වූ චෙක්පත් 11ක් ද, වටිනාකම රු. 12,352,198 වූ චෙක්පත් 14ක් ද අගරුව ඇති බව නිරීක්ෂණය විය.	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්තක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දිමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඌ)	චෙක්පත් 50ක් හා ඊට වැඩි ප්‍රමාණයක් අගරු වී ඇති දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ විවිධ අංශ හා ප්‍රාදේශීය කාර්යාල (Unit / RO) 15ක් විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව මධ්‍ය පරිමාණ සංස්ථාපිත අංශය (Medium Corporate-Legacy) යටතේ වැඩිම වටිනාකමක් සහිතව චෙක්පත් 533ක් අගරු වී ඇති අතර එහි වටිනාකම රු. 311,563,605 විය. පිළිවෙළින් Colombo East, Batticaloa සහ DTRU අංශ යටතේ වටිනාකම රු. 62,034,265ක් වූ චෙක්පත් 212ක් ද, වටිනාකම රු. 69,169,646ක් වූ චෙක්පත් 179ක් ද, වටිනාකම රු.53,020,469ක් වූ චෙක්පත් 166ක් ද අගරු වී තිබුණි.	2025 ජුලි 22 දිනැති පිළිතුරු ලිපියට අනුව 2025 මාර්තු 31 දිනට වටිනාකම රු. 1,130,395,726ක් වූ චෙක්පත් 2,511ක් අගරු වී ඇති අතර ඊට අදාළව එක් එක් අංශය විසින් අය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව	අගරු චෙක්පත් වලට අදාළ මුදල් කඩිනමින් අය කර ගැනීම කළ යුතු අතර සාර්තක ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දිමට ක්‍රියාමාර්ග ගත යුතුය.

4.8.8. **මහජන පෙත්සම් පරීක්ෂාව**

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	TIN අංකය 11424xxxx දරන බදු ගෙවන්නා විසින් 2019 ජුනි මස සිට 2021 සැප්තැම්බර් මස දක්වා ඉදිරිපත් කරන ලද එකතු කළ අගය මත බදු වාර්තා සඳහා සංශෝධිත එකතු කළ අගය මත බදු වාර්තා ලබාදී ඇතත් ඒවා නොසලකා කාල කඩඉම් දිනයන් අවසන් වීමට දින කිහිපයකට පෙර අතිරේක තක්සේරු වාර්තා නිකුත් කර ඇති බව දක්වමින් 2024 අගෝස්තු 06 දිනැතිව දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නැවතත් අතිරේක තක්සේරු වාර්තාවන් නිකුත් කිරීම වළක්වාලමින් 2024 ඔක්තෝම්බර් 24 දින දක්වා රිට්(Writ) ආඥාවක් ලබා ගෙන ඇති බවට නිරීක්ෂණය විය.	අදාළ සමාගම ලබා ගන්නා ලද Writ ආඥාව සම්බන්ධව උසාවි නියෝගයට අදාළව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නීති අංශයේ උපදෙස් සඳහා යොමු කර ඇති බව .	අතිරේක අයවිය යුතු බදු මුදල් අයකර ගැනිමට පනත් ප්‍රකාරව කාල කඩඉම් වකවානුව ඉකුත් වීමට ප්‍රථමයෙන් කටයුතු කළ යුතුය.
(ආ)	පෙත්සම්කාර සමාගමෙහි එකතු කළ අගය මත බදුවලට අදාළව අතිරේක තක්සේරු වාර්තා නිකුත් කර ඇති දිනය හා කාල කඩඉම දිනය අතර කාලය ආසන්න වශයෙන් දින 03 ට අඩු කාලයක් තිබියදී බදු කාලච්ඡේද 03 ක් සඳහා, දින 03 ත්- දින 25ත් අතර කාලයක් තිබියදී බදු වාර්තා කාලච්ඡේද 06 ක් සඳහා ද අතිරේක තක්සේරු වාර්තා නිකුත් කර ඇති දිනය හා කාල කඩඉම් දිනය එකම දිනයක් වන එක් බදු කාලච්ඡේදයක් සඳහා ද වශයෙන් අතිරේක තක්සේරු වාර්තා 10ක් නිකුත් කර තිබූ බව විගණනයට නිරීක්ෂණය වූ අතර මෙලෙස කාල කඩඉම් දිනයට ආසන්න දිනයක දී අතිරේක තක්සේරු වාර්තා නිකුත් කිරීම මඟින් කාලකඩඉම් වකවානුව මඟ හැරීම, බදු ගෙවන්නා හට රෙජිස්ටර් තැපැල හරහා ලිපි ලැබීම ප්‍රමාද වීම මත කාල	අදාළ සමාගම ලබා ගන්නා ලද Writ ආඥාව සම්බන්ධව උසාවි නියෝගයට අදාළව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නීති අංශයේ උපදෙස් සඳහා යොමු කර ඇති බව.	අතිරේක අයවිය යුතු බදු මුදල් අයකර ගැනිමට පනත් ප්‍රකාරව කාල කඩඉම් වකවානුව ඉකුත් වීමට ප්‍රථමයෙන් කටයුතු කළ යුතුය.

	කඩඉම් දිනය කඩ වී ඇති බවට බදු ගෙවන්නා විසින් අභියාචනාවන්හි හේතු දැක්වීම හා පෙත්සම්කාර සමාගම විසින් දක්වා ඇති පරිදි තක්සේරු වාර්තා නිකුත් කිරීමට පෙර හේතු දැක්වීමට හා තොරතුරු ලබා දීමට ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම වැනි තත්ත්වයන් ඇති විය හැකි බවට නිරීක්ෂණය කෙරේ.		
(ඇ)	තවද 2018 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා බදු කාල පරිච්ඡේදයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව විසින් ප්‍රාථමික බදු තක්සේරුකරණයන් (PTA) සඳහා අදාළ වැඩ අයිතම ක්‍රියාත්මක කිරීම සිදු කර නොමැති හේතුවෙන් ආයතනයට ඉහත කාලච්ඡේදයන්ට අදාළව අය කර ගත නොහැකිව පවතින import credit voucher වටිනාකම රු.120,576,643 ක් බවත් දක්වා තිබුණි. මෙම වටිනාකම තුළ අතිරේක තක්සේරු දැන්වීම් නිකුත් කර නොමැති කාල පරිච්ඡේදයන්ට අදාළ වටිනාකම්ද ඇතුළත් අතර (බදු වාර්තා පිළිනොගැනීමේ දැන්වීම් නිකුත් කර නැති කාල පරිච්ඡේදයන්) ප්‍රාථමික බදු තක්සේරුකරණයන් (PTA) නිකුත් නොකිරීම මත අදාළ බදු කාල පරිච්ඡේදයන් සඳහා වාර්තාවන්හි ඇති එකතු කළ අගය මත බදු වගකීම හෝ ආපසු ගෙවීම බදුකරුගේ ගිණුමේ සටහන් නොවන අතර එම හේතුවෙන් පෙත්සම්කාර සමාගම හා අදාළ import credit voucher වලට අදාළ බදු ආපසු ගෙවූ ප්‍රමාණය ලබා ගත නොහැකි වීම මෙන්ම දෙපාර්තුමේන්තුවේ RAMIS පද්ධතිය මඟින් ලබා ගන්නා වාර්තාවන්හි නිරවද්‍යතාවයට බලපෑමක් ඇති කරන බව ද නිරීක්ෂණය විය.	අදාළ සමාගම ලබා ගන්නා ලද Writ ආඥාව සම්බන්ධව උසාවි නියෝගයට අදාළව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නීති අංශයේ උපදෙස් සඳහා යොමු කර ඇති බව.	අතිරේක අයවිය යුතු බදු මුදල් අයකර ගැනිමට පනත් ප්‍රකාරව කාල කඩඉම් වකවානුව ඉකුත් වීමට ප්‍රථමයෙන් කටයුතු කළ යුතුය.
(ඇ)	විගණිත දිනට පෙත්සම්කරුට අදාළව දේශිය ආදායම් දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් සතුව එකතු කළ අගය මත බදු වලට අදාළව විවෘතව පවතින වැඩ	අදාළ සමාගම ලබා ගන්නා ලද Writ ආඥාව සම්බන්ධව උසාවි නියෝගයට අදාළව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නීති අංශයේ උපදෙස් සඳහා යොමු කර ඇති බව	නොවිසඳුණු වැඩ අයිතම කඩිනමින් අවසන් කිරීමට පියවර ගත යුතුය.

	අයිතම සංඛ්‍යාව 116ක් වූ අතර ඒවා 2016 අගෝස්තු මස සිට මේ දක්වා නොවිසඳුණු වැඩ අයිතම බවත් මෙම බදු කාල පරිච්ඡේදවලට අදාළ වැඩ අයිතම ද ඒ තුළ පවතින අතර ඉන් ඇතැම් වැඩ අයිතම විවෘතව පැවතීම බදුකරුගේ ගිණුමේ නිවැරදි හා යාවත්කාලීන නොවීමට හේතු වන අතර පද්ධතිය මඟින් ලබා ගන්නා හිඟ බදු වාර්තාවන් හා බදු පරිපාලනයට ද බලපෑමක් ඇතිවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.		
(ෂ)	**2024 ජනවාරි 16 දින පැවති රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡාවට බඳුන් වී තිබූ සීනි කිලෝ එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බද්ද 2020 ඔක්තෝබර් 14 සිට 2021 පෙබරවාරි 28 දක්වා කාල පරිච්ඡේදය තුළ රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීම මත රජයට සිදු වූ අලාභය සම්බන්ධයෙන් විගණකාධිපති නිකුත් කරන ලද විශේෂ වාර්තාව පදනම් කර ගනිමින් මෙම සීනි ආනයනයේදී උපයා තිබූ ලාභය සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ආදායම් බදු නිසි ලෙස ගෙවා ඇති ද යන්න තහවුරු කරන ලෙස දැන්වූ ලිපියට ප්‍රතිචාර වශයෙන් 2024 ජනවාරි 22 දින නිලධාරීන් 04 දෙනෙකුගෙන් යුත් විශේෂ කමිටුවක් පත්කර තිබුණි.**		
(i)	2024 ජනවාරි 23 වන දින විශේෂ කමිටුව මගින් ඉදිරිපත් කර තිබූ මූලික වාර්තාවේ අදාළ කරගත් ආනයනකරුවන් 12 දෙනා අතරින් ගොනු 06 ක් පමණක් විමර්ශනය අවසන් කර තිබූ බැවින් සීනි ආනයනය සම්බන්දව සිනි අනයන්යෙන් උපයු ලාභය පාදක කරගනිමින් නිසි පරික්ෂාවක් සිදු වී නොමැති බව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කර තිබිණි. කෙසේ වෙතත් උක්ත විශේෂ කමිටුවේ සභාපති වෙනත්	එකඟ බව.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය හා අභියාචනා විසඳීමේ ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.

	තනතුරකට පත්වීමත් සමඟ නව සභාපතිත්වයකින් යුත් කමිටුවක් කොමසාරිස් ජනරාල් තුමිය විසින් 2024 දෙසැම්බර් 27 දින පත්කර තිබුණි.		
(ii)	නව කමිටුව විසින් ලබා දුන් 2025 පෙබරවාරි 24 දිනැති වාර්තාව අනුව උක්ත විමර්ශනය යටතේ සීනි ආනයනකරුවන් 12 දෙනෙකු සම්බන්ධව සිදු කරන ලද පරීක්ෂණයේදී ආනයනකරුවන් 10 දෙනෙකුට අදාළව විශාල බදු නොවන (විමර්ශන) අංශය විසින් හා විශාල බදු (විමර්ශන) අංශය විසින් සමස්ථ වශයෙන් රු. 896,858,125ක වටිනාකමකින් යුත් තක්සේරු නිකුත් කර තිබුණු අතර ඉතිරි ආනයනකරුවන් දෙදෙනාගෙන් එක් ආනයනකරුවෙක් මෙම කාලය තුළ සීනි ආනයනය කර නොමැති බවත් අනෙක් ආනයනකරු සම්බන්ධව අතිරේක බදු නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශ හඳුනාගෙන නොමැති බවත් වාර්තා කර ඇති බව නිරීක්ෂණය විය.	විගණන අංශ හා විශාල බදු නොවන විමර්ශන අංශය විසින් නිකුත් කර ඇති තක්සේරු වල වටිනාකම රු.484,790,925 ක් වන අතර විශාල බදු අංශය (විමර්ශන) විසින් රු.412,067,200 ක තක්සේරු නිකුත් කර අතර හා ඒ අනුව නිකුත් කර ඇති තක්සේරු වල සමස්ථ වටිනාකම එකතුව 896,858,125 බව.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය හා අභියාචනා විසඳීමේ ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.
(iii)	උක්ත බදු ගෙවන්නන් 12 දෙනා සම්බන්ධව 2024 දෙසැම්බර් 31 දිනට අදාළ හිඟ බදු වාර්තාවලට අනුව රු. 2,395,734,789 ක වටිනාකමකින් යුත් හිඟ බදු පවතින බව නිරීක්ෂණය විය.	පිළිතුර ලබා දී නොමැත.	අදාළ බදු පනත්වල දැක්වෙන සියලුම අය හා අභියාචනා විසඳීමේ ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කර යථෝක්ත සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය.
(iv)	දෙපාර්තමේන්තුව සමග 2025 අගෝස්තු 21 වන දින පැවති විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදී මේ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය ලෙස ලබා දී තිබූ තොරතුරු වලට අනුව සමස්ථ වශයෙන් නිකුත් කළ අතිරේඛ තක්සේරු වටිනාකම වන රු. 896,858,125 කින් රු. 332,067,546 ක වටිනාකමක් අභියාචනා විසඳීමේදී සිදු කළ අඩුකිරීම් ලෙස සංශෝධනය කර ඇති නමුත් එම සංශෝධනයන් සඳහා	සමස්ථ වශයෙන් නිකුත් කළ අතිරේඛ තක්සේරු වටිනාකම වන රු. 896,858,125 කින් රු. 332,067,546 ක වටිනාකමක් අභියාචනා විසඳීමේදී සිදු කළ අඩුකිරීම් ලෙස සංශෝධනය කර ඇති බව.	බදු වගකීම් නිසි ලෙස නිරූපණය වන පරිදි පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම, හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගත යුතුය.

	අදාළ අතිරේඛ තක්සේරු වාර්තා මෙතෙක් RAMIS පද්ධතියේ උඩුගත කර නොමැති බැවින් ඒ පිළිබඳව පද්ධතිය හරහා පරීක්ෂා කිරීම විගණනයට ගැටළු සහගත විය.		
(v)	හවුල් ව්‍යාපාර ආදායම් බදු (PIT) යටතේ 2021 බදු කාලපරිච්ඡේදයට අදාළව ආනයනකරුවන් 04 දෙනෙකු සඳහා රු. 41,355,881 ක වටිනාකමකින් යුත් අතිරේඛ තක්සේරු නිකුත් කිරීම් අතිරේක තක්සේරු නිකුත් කිරීමේ විකල්ප ක්‍රමවේදය (By pass system) තුළ හෝ RAMIS පද්ධතිය තුළ උඩුගත කර නොමැති බැවින් එම අතිරේඛ තක්සේරු නිකුත් කිරීම් පිළිබඳව හා ඊට අදාළව නිසි පරිදි අයකරගැනීම් සිදු කර ඇත්ද යන්න පද්ධතිය හරහා නිරීක්ෂණය කිරීමට විගණනයට නොහැකි විය.	එකඟ බව.	බදු වගකීම් නිසි ලෙස නිරූපණය වන පරිදි පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම, හිඟ බදු අය කර ගැනීමට නිසි පියවර ගත යුතුය.

5. **මානව සම්පත් කළමනාකරණය**

5.1. **අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
5.1.1	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 17 ක් වූ තනතුරු 490 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් පුරප්පාඩුව පැවති ජොෂ්ඨ මට්ටමේ තනතුරු සංඛ්‍යාව වූ 269 ප්‍රතිශතාත්මකව අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 21 ක් විය. සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ විධායක නොවන සේවක කාණ්ඩය යටතේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 221 ක් වූ අතර ඒ අනුව එම කාණ්ඩයේ සියයට 13 ක ප්‍රතිශතයක් 2024 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුනි.	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 490ක් හා එයින් දේශිය ආදායම් සේවයේ ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 263ක් බවත් මෙම පුරප්පාඩු සංඛ්‍යාවෙන් අනුමැතිය ලබා දී ඇති පුරප්පාඩු 100 පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර 2025 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත පුරප්පාඩු තනතුරු 204 ක් පිරවීම සඳහා ද කටයුතු සිදු කිරීමට ඉල්ලීම් ලිපි මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව.	දෙපාර්තමේන්තු පුරප්පාඩු තනතුරු සඳහා අත්‍යවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

5.1.2	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තනතුර සඳහා අනුමත වූ සේවක සංඛ්‍යාව 90 ක් වන අතර 2024 දෙසැම්බර් 31 දිනට නිත්‍ය නිලධාරීන් 68 කින් හා වැඩ බලන නිලධාරින් 22 කින් තනතුරු සංඛ්‍යාව සම්පූර්ණ කර ඇති නමුත් තත්‍ය වශයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් තනතුරෙහි රාජකාරි සිදු කරන අතරතුර කොමසාරිස් තනතුරෙහි රාජකාරි ආවරණය සිදු කිරීමේදී දෙපාර්තමේන්තු කටයුතු සඳහා බලපෑම් සිදුව තිබූ අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුරු 05 ක් සඳහා නිලධාරින් බඳවා ගැනීමේ ප්‍රමාදය දේශීය ආදායම් දෙපාර්මේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (RAMIS) නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේදී අහිතකර බලපෑමක් ඇති කර තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 490 ක් හා එයින් දේශිය ආදායම් සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සංඛ්‍යාව 263 ක් බවත් මෙම පුරප්පාඩු සංඛ්‍යාවෙන් අනුමැතිය ලබා දී ඇති පුරප්පාඩු 100 පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර 2025 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත පුරප්පාඩු තනතුරු 204 ක් පිරවීම සඳහා ද කටයුතු සිදු කිරීමට ඉල්ලීම් ලිපි මුදල් අමාත්‍යංශය වෙත යොමු කර ඇති බව.	දෙපාර්තමේන්තු පුරප්පාඩු තනතුරු සඳහා අත්‍යවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
5.1.3	දෙපාර්තමේන්තු අනුමත සේවක සංඛ්‍යාව තුළ වර්ෂ කිහිපයක සිට පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II පන්තිය III ශ්‍රේණිය ඉංජිනේරු තනතුරේ පුරප්පාඩුව 2024 දෙසැම්බර් 31 දිනට ද ස්ථිරව පිරවී නොතිබුණු අතර මේ වන විට අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යංශයේ ඉංජිනේරු නිලධාරිනියක සතියට දින දෙකක් වැඩ බැලීමේ පදනම මත දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණද දෙපාර්තමේන්තුව වෙත ස්ථිරව ඉංජිනේරුවරයකුගේ සේවය ලබා ගත නොහැකි වීම මත 2024 වර්ෂයේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල සඳහා ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා වෙන්කල ප්‍රතිපාදනය වූ රු.මිලියන 80 න් රු.මිලියන 72 ක් එනම් සියයට 91 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශයේ ඉංජිනේරු නිලධාරිනියක ස්ථාන මාරු කර මෙම දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණ ද, ඇයගේ ස්ථාන මාරුව අවලංගු කළ අතර, එම අමාත්‍යංශයේ වැඩ අධික බැවින් වැඩ බැලීම සඳහා පැමිණීමට ද එම නිලධාරිනිය අකමැත්ත ප්‍රකාශ කරන ලද බැවින් ස්ථිරවම මෙම දෙපාර්තමේන්තුවට ඉංජිනේරු තනතුරේ නිලධාරියෙකු ලබා දෙන ලෙස ඉල්ලා ලිපි යොමු කර ඇති බව.	දෙපාර්තමේන්තු ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා ස්ථිර ඉංජිනේරුවරයකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

5.1.4	දේශීය ආදායම් දෙපාර්මේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ MN-6 කාණ්ඩයේ නිලධාරීන් නොපමාව බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුන ද තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරු 24 ක බඳවා ගැනීමේ පවතින ප්‍රමාදය දේශීය ආදායම් දෙපාර්මේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ කටයුතු සඳහා සෘජුව බලපෑමක් ඇති කර තිබුණි.	මෙම තනතුරු සඳහා මෙතෙක් දෙපාර්තමේන්තුගතව බඳවා ගැනීම සිදු නොවන බැවින්, පුරප්පාඩු පිරවීම සඳහා වරින් වර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි යොමු කර ඇති බව.	දෙපාර්තමේන්තු පුරප්පාඩු තනතුරු සඳහා අත්‍යවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
5.1.5	ද්විතියික මට්ටමේ සේවක කාණ්ඩයට අයත් දෙපාර්තමේන්තුගත තනතුරක් වන තාක්ෂණ නිලධාරි හා ප්‍රාථමික මට්ටමේ කාණ්ඩයට අයත් සංචාරක බංගලා භාරකරු හා ගොඩනැගිලි පරීක්ෂක තනතුරු වර්ෂ ගණනාවක සිට පුරප්පාඩුව පැවතියද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම තනතුරු සඳහා කිසිදු නිලධාරියෙකු බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	ද්විතීයික මට්ටම - තාක්ෂණ නිලධාරී තනතුරු 02 සඳහා බඳවා ගැනීමට අදාළව විභාගය පැවැත්වීම සඳහා තොරතුරු යොමු කිරීමට සූදානම් කර ඇති බවත් . ද්විතීයික මට්ටම - ගොඩනැගිලි පරීක්ෂක තනතුර බඳවා ගැනීමේ පටිපාටියට ඇතුළත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති බවත්. ප්‍රාථමික මට්ටම - සංචාරක බංගලා භාරකරු තනතුරට අදාළව ප්‍රාථමික ශ්‍රේණිවලට බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවා ඇති නමුත් එම පුරප්පාඩුව සඳහා අදාළ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව බහුකාර්ය නිලධාරීන් සුදුසු පරිදි කඩිනමින් පුරප්පාඩු පිරවීමට ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බවත්.	දෙපාර්තමේන්තු පුරප්පාඩු තනතුරු සඳහා අත්‍යවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.